වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2025



නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය (නාගරික සංවර්ධන අංශය)
நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு (நகர அபிவிருத்தி பிரிவு)
Ministry of Urban Development, Construction and Housing (Urban Development Sector)

	පරිච්ඡේදය	පිටුව
01	**පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	**1-5**
1.1	හැඳින්වීම	1
1.2	අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර	1
1.3	අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්	1-3
1.4	අමාත්‍යාංශයීය සංවිධාන සටහන	4
1.5	2025 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති දෙපාර්තමේන්තු	5
1.6	2025 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සහ රාජ්‍ය සංස්ථා	5
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	5
02	**පරිච්ඡේදය 02: 2025 වර්ෂයෙහි ප්‍රගතිය සහ 2026 වර්ෂයෙහි ඉදිරි දැක්ම**	**6 - 35**
1.0	2025 වසරේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් වෙන්වූ අරමුදල්වල සමස්ත මූල්‍ය ප්‍රගතිය	6 - 7
2.0	සමස්ථ භෞතික ප්‍රගතිය	7 - 35
2.1	ජාතික, පළාත්, නාගරික සහ ප්‍රාදේශීය භෞතික සැලසුම්කරණය	7 – 10
2.2	නාගරික භෞතික සංවර්ධනය (නාගරික සංවර්ධන ව්‍යාපෘති)	10 – 13
2.3	නිවාස සංවර්ධනය	13 – 22
2.4	තිරසර පරිසරයක් නිර්මාණය කිරීම	22 – 26
2.5	ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන	26
2.6	අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශයේ එක් එක් අංශයන්හි 2025 වසර තුල ප්‍රගතිය	27 - 35
03	**පරිච්ඡේදය 03: 2025වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**	**36 – 41**
3.1	මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය	36
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	36
3.3	මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය	36
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	36
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	36
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	36
3.7	මූ.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයතු ලෙස මෙම දෙපාර්තමේන්තුවලට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	37
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	37
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	37
04	**පරිච්ඡේදය 04: කාර්යසාධන දර්ශක**	**38**
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැකැස්ම මත පදනම්ව)	38
		39 – 42

05 පරිච්ඡේදය 05: තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1	හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.	39 - 40
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.	40 - 42

06 පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ **43 – 48**

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	43
6.2	ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.	43
6.3	මානව සම්පත් සංවර්ධනය	43 - 48

07 පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව **49 - 53**

පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

එවකට පැවති නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයෙහි නාගරික සංවර්ධන විෂය පථය 2025 ඔක්තෝම්බර් මස 18 වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2458/65 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන නව අමාත්‍යාංශය යටතට පැවරිණි. එම නව අමාත්‍යාංශයෙහි නාගරික සංවර්ධන විෂය පථය යටතේ පහත සඳහන් දෙපාර්තමේන්තුව සහ ආයතන සමන්විත වේ.

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- නාගරික සංවර්ධන අධිකාරිය
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
- සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්

එසේම, මෙම ආයතනවලට අමතරව 2024 නොවැම්බර් මස 25 වන දින ප්‍රකාශයට පත්කරන ලද 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව පෙර පැවති නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන විෂය පථය වෙත පහත ආයතන ඇතුළත් විය.

- හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම
- කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ පුද්ගලික සමාගම

1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

1.2.1 දැක්ම

ලස්සන නගරයක් සහ සුවපහසු ජීවිතයක්

1.2.2 මෙහෙවර

නාගරික සංවර්ධනය ක්‍රමවත් කිරීම, නිවාස සහ යටිතල පහසුකම් ලබාදීම, භෞතික සැලසුම්කරණය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවේශය තහවුරු කිරීම, ගංවතුර පාලනය සහ තෙත්බිම් කළමනාකරණය, ඉඩම් සංවර්ධනය සහ සභාධිපත්‍ය කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට ලස්සන නගර සහ සුවපහසු ජීවිතයක් සඳහා ප්‍රවේශය සැලසීම.

1.3 අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්


- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන, ඉදිකිරීම්, ජල සැපයුම් හා නිවාස යන විෂයන්ට සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ

ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂම හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම සහ තාක්ෂණය යොදාගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය.
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු.
- පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය
- නාගරික ප්‍රදේශය තුළ දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශය උනන්දු කරවීම හා මෙම ප්‍රයත්නය සඳහා සුදුසු ඉඩම් ලබා දීම.
- නාගරික ප්‍රදේශවල දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘතීන් ලබා ගැනීම සඳහා විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ආයෝජනයන් කිරීම ප්‍රවර්ධනය කිරීම.
- රජයේ මැදිහත්වීමෙන් කොළඹ ප්‍රදේශයේ අඩු ආදායන්ලාභී ජනාවාසයන්හි පදිංචිකරුවන්ට දැරිය හැකි මිලකට නිවාස ලබා ගැනීමට පහසුකම් සැපයීම.
- නාගරික හා අර්ධ- නාගරික ප්‍රෙද්ශයන්හි අත්‍යවශ්‍ය පහසුකම් සහිත විස්තීරණ නිවාස සංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලුවලට විසඳුම් ලබා දීමට අදාළ නීති සංශෝධනය කිරීම.
- නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
- වගකීම් රහිත කසල බැහැර කිරීම් වැළැක්වීමට පියවර ගැනීම.
- සියලුම නාගරික ඉදිකිරීම් නියාමනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම.
- සියලු නාගරික ඉදිකිරීම් වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇති කිරීම සහතික කිරීම.
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලසුම් පිළියෙල කිරිම.
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදු කිරීම.
- සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු.
- මහජන සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.
- පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු.
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරුබිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම.
- රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම.
- අඩු ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මග පෙන්වීම.
- රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.

- අදාළ නීති රීති හා ප්‍රමිතීන් වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.
- ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම.
- බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව.
- ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම.
- දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම.
- දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උපකොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම හා ආරක්ෂාව සැලසීම.
- සුදුසු හා තිරසාර තාක්ෂණය යොදා ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රෙද්ශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- ජාතික සංවර්ධන ඉලක්කයන් ලගාකර ගත හැකි වන පරිදි ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නවීන ඉංජිනේරු උපදේශන සේවාවන් ලබාදීම.
- සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම.
- ජලසම්පාදන සේවා, ජලවහන පද්ධති සහ සනීපාක්ෂක පහසුකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව නව සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව
- ග්‍රාමීය වැව්, ජලාශ හා වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාව සහ නාගරික ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම.
- පානීය ජලය බෙදා හැරීමේදී සිදුවන ජලය අපතේ යාම වළක්වා ගැනීම.
- ප්‍රජා ජල සම්පාදනහා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම.
- ග්‍රාමීය ජනතාවට ප්‍රමිතායෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැලයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම.
- ජලාශ සංවර්ධනය හරහා ග්‍රාමීය පළාතිවල පානීය ජල සැපයුම ස්ථාවර කිරීම
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
- අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

1.4 අමාත්‍යාංශයීය සංවිධාන සටහන



සැ.යු. / අංශ අනුව තවදුරටත් බෙදා වෙන්කර දක්වනු ලබන සංවිධාන සටහන ඇමුණුම-1 මගින් සිංහල බසින් ඉදිරිපත් කර ඇත.

1.5 2025 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති දෙපාර්තමේන්තු

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

1.6 2025 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සහ රාජ්‍ය සංස්ථා

- නාගරික සංවර්ධන අධිකාරිය
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අංකය	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිත ආයතනය	ව්‍යාපෘතියේ ඇස්තෙමින්තු ගත වියදම	ව්‍යාපෘතියේ කාල සීමාව
01	අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම	සංවර්ධනය පිළිබඳ ප්‍රංශ නියෝජිත ආයතනය	යුරෝ මිලියන 6 *	2022 පෙබරවාරි 2026 ජුනි දක්වා
02	චීන ආධාර නිවාස ව්‍යාපෘතිය	චීන රජයේ ආධාර	රෙන්මින්බි මිලියන 466.5	2022 ජනවාරි සිට 2027 දෙසැම්බර් දක්වා
03	කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතියට සහය ව්‍යාපෘතිය	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	ඇ.ඩො.මිලියන 158	2019 ජූලි සිට 2027 දෙසැම්බර්
04	තිරසර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	ඇ.ඩො. මිලියන 30	2025 දෙසැම්බර් සිට 2030 දෙසැම්බර්

*ව්‍යාපෘතිය සඳහා ණය ආධාර මුදල් සපයනු ලබන ප්‍රංශ නියෝජිතායතනය මගින් දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 6ක අරමුදල් ලබාදීමට එකඟතාවය ප්‍රකාශ කර ඇත. මේ වන විට ව්‍යාපෘතිය ප්‍රංශ නියෝජිතායතනයේ ණය ආධාර මුදල් ලැබුණු පසු ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම මත දේශීය අරමුදල් භාවිතා කරමින් සිදුකරගෙන යනු ලබයි. ව්‍යාපෘතියේ සංශෝධිත සමස්ථ පිරිවැය රු.2,144,995,570.13 වේ. යුරෝ මිලියන 6ක ප්‍රතිපාදන හා සමස්ත ව්‍යාපෘති පිරිවැය අතර වෙනස වන ආසන්න වශයෙන් රු.206,335,570 ක් දේශීය අරමුදල් මගින් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා 2025 මැයි 07 දිනැති අමප/25/0680/814/015-1 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී ඇත.

.

පරිච්ඡේදය 02
2025 ප්‍රගතිය සහ 2026 ඉදිරි දැක්ම

1.0. 2025 වසරේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් වෙන්වූ අරමුදල්වල සමස්ත මූල්‍ය ප්‍රගතිය

වගුව 2.1 සමස්ත මූල්‍ය ප්‍රගතිය **රු.මිලි.**

වැඩසටහන/ ව්‍යාපෘතිය		ප්‍රතිපාදන - 2025	වියදම් - 2025.12.31 දිනට	%
නගර සංවර්ධන ක්‍රියාකාරකම		70.00	0.00	0.00
සියක් නගර/ නාගරීක යටිතල පහසුකම් හා නගර සංවර්ධන වැඩසටහන		1,337.75	696.78	52.09
යාපනය නගර ශාලාව ප්‍රතිස්ථාපනය		400.00	369.84	92.46
හෝමාගම කලාපයේ (තාක්ෂණික නගරය) මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම		400.00	352.79	88.20
නාගරික පුනර්ජීවන වැඩසටහන	ශ්‍රී ලංකා රජය	8,200.00	7,699.67	93.90
කොළඹ නාගරික පුනර්ජනන වැඩසටහනට සහය වීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා රජය	500.00	310.84	62.17
	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	3,464.00	2,992.82	86.40
බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම, නැගෙනහිර පළාත් උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්ම හා හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය		215.00	30.97	14.40
අඩු ආදායම්ලාභී ජනතාව සඳහා චීන ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 2,000ක් ඉදිකිරීම	මහජන චීන සමූහාණ්ඩුව	3,500.00	3,202.43	91.50
	ශ්‍රී ලංකා රජය	600.00	163.11	27.19
සංචාරක ප්‍රවර්ධනය සහ නගර සන්නාමකරණය		500.00	51.80	10.36
රජයේ නිවාස යෝජනා ක්‍රමවල අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු	නාගරික සංවර්ධන අධිකාරිය	325.00	38.15	11.74
	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය	235.00	64.61	27.49
කඳුකර දශකය වැඩසටහන		32.25	17.14	53.15
හම්බන්තොට වෙරළ උද්‍යානය සහ ශ්‍රීබෝපුර වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය		106.92	93.39	87.35
අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම		750.00	25.79	3.44
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය		30.00	30.00	100.00
ඔලියමුල්ල වැසි ජල අපවහනය සහ පරිසරය	ගොඩනැගිලි හා ව්‍යුහයන්	296.08	186.94	63.14
	වෙනත්	30.00	30.00	100.00

වැඩසටහන/ ව්‍යාපෘතිය		ප්‍රතිපාදන - 2025	වියදම - 2025.12.31 දිනට	%
කොළොන්නාව වැසි ජල අපවහනය සහ පරිසරය	ගොඩනැගිලි හා ව්‍යුහයන්	330.00	292.03	88.49
	වෙනත්	70.00	69.90	99.86
කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල වැසි ජල පොම්පාගාර මෙහෙයුම් හා කළමනාකරණය		277.00	265.72	95.93
ගංවතුර ව්‍යසනය සඳහා සූදානම සහ හදිසි ප්‍රතිචාර දැක්වීම ගංවතුර ව්‍යසනය සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීම		62.00	61.01	98.40
පවතින ඇළ මාර්ග, විල්, තෙත්බිම් සහ ඇවිදීමේ මාර්ග නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.		847.00	839.26	99.09
ජලාපවහන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්	ගොඩනැගිලි හා ව්‍යුහයන්	178.00	138.51	77.81
ජලාපවහන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්	වෙනත්	63.00	63.00	100.00
වේරස් ගහ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය		1,200.00	1,199.65	99.97
කොළඹ අගනගර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය		125.00	119.45	95.56
සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය		445.00	0.00	0.00
උපායමාර්ගික නගර සංවර්ධනය - අනුරාධපුරය	ශ්‍රී ලංකා රජය	700.00	436.22	62.32
කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය		63.00	23.42	37.17
උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය - යාපනය	ශ්‍රී ලංකා රජය	75.00	5.74	7.65
තිරසර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	100.00	0.00	0.00
	ශ්‍රී ලංකා රජය	15.00	1.80	12.00
ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2050 සකස් කිරීම, මධ්‍යම පළාත් කළපිය භෞතික සැලැස්ම සකස් කිරීම, නැගෙනහිර පළාත් කළාපිය භෞතික සැලැස්ම සකස් කිරීම		5.00	0.33	12.00
ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම		25.00	6.78	6.60
මහියංගණය සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම		3.30	2.56	27.12
ප්‍රධාන කාර්යාලයේ පර්යේෂණ අංශය අළුත්වැඩියා කිරීම		2.70	1.95	77.58
සමස්ත ප්‍රගතිය		**25,578.00**	**19,884.40**	**77.74**

2.0. සමස්ත භෞතික ප්‍රගතිය

2.1. ජාතික, පළාත්, නාගරික සහ ප්‍රාදේශීය භෞතික සැලසුම්කරණය

2.1.1. ජාතික, පළාත් සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් සංවර්ධනය

- **ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2050 සකස් කිරීම**
  යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2050 සකස් කිරීම සම්බන්ධව 98%ක පමණ භෞතික ප්‍රගතියක් ඇත. මෙම සැලැස්ම 2023 වසරේදී ජනාධිපතිතුමා සභාපතිත්වය දරණ ජාතික භෞතික නිර්මාණ සභාවෙන් කොන්දේසි සහිතව සම්මත කරන ලදී.

- **මධ්‍යම පළාත් කළාපීය භෞතික සැලැස්ම සකස් කිරීම**
  මධ්‍යම පළාත් කළාපීය භෞතික සැලැස්ම සකස් කිරීම අවසන් කර ඇත. තාක්ෂණික උපදේශක කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සඳහා කළාපීය සැලසුම් කමිටුවට ඉදිරිපත් කළ යුතුය. කළාපීය සැලසුම් කමිටුවේ කාලය අවසන් වීම සහ දේශපාලන අධිකාරිය වෙනස් වීම හේතුවෙන් එම කමිටුව නැවත පත් කළ යුතුව ඇත.
- **නැගෙනහිර පළාත් කළාපීය භෞතික සැලැස්ම සකස් කිරීම**
  කළාපීය භෞතික සැලැසුම් කමිටුවට හා තාක්ෂණික උපදේශක කමිටුවට ඉදිරිපත් කර ඇත. තාක්ෂණික උපදේශක කමිටුවේ නිර්දේශය මත දේශපාලන අධිකාරිය වෙනස් වීම නිසා නැවත දැනුවත් කිරීම කළ යුතුය.
- **ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය - නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**
  ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මේ වන විට නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් වී ඇත. මෙම සැලැස්ම 2025 වර්ෂයේ අවසන් වීමට තිබූ නමුත් සමාජ සමීක්ෂණය කිරීමේදී ඇතිවූ ගැටළු හේතුවෙන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අවසන් කිරීමේ කාල සීමාව දීර්ඝ කිරීමට සිදුවිය. නැවත පදිංචි කිරීමේ සැලැස්ම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබාදුන් අවසන් වාර්තා තුන සඳහා ගෙවීම් සිදුකිරීමට ඇත.

ඉදිරි ඉලක්ක

- ඉදිරි කාලය තුල සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම, පාර්ලිමේන්තුව තුල සභා ගත කිරීම, ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම යන කාර්යයන් ඉටුකල යුතුව ඇත.
- කළාපීය සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවට හා ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.
- ඉදිරියේදී නැගෙනහිර පළාත් කළාපීය භෞතික සැලස්ම අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවට හා ජාතික භෞතික නිර්මාණ සභාවට වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම.
- ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරි කටයුතු සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

2.1.2 නාගරික සැලසුම්කරණය

1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 11 වන කොටසේ 8(ආ) වගන්තියේ විධිවිධාන යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශවල ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික සංවර්ධනය සඳහා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, මෙම අධිකාරිය මගින් 2025 වර්ෂය තුල සංවර්ධන සැලසුම් 34 ක් සකස්කර ඇත. ඉන් 2025 වර්ෂය තුල පහත දැක්වෙන සංවර්ධන සැලසුම් 06 ක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

වගුව 2.2 2025 වර්ෂයේ නාගරික සංවර්ධන සැලසුම් ප්‍රගතිය

ප්‍රගතිය	ගණන	ආවරණය කරන ලද ප්‍රදේශ		
		ප්‍රාදේශීය සභා	නගර සභා	මහ නගර සභා
ගැසට් කරනලද සංවර්ධන සැලසුම්	06	එරාවූර්, හිගුරක්ගොඩ, කෑගල්ල (කොටසක්)	මඩකලපුව, සීතාවක, හික්කඩුව	කෑගල්ල
පිළියෙල කර ඇති කෙටුම්පත් සැලසුම්	28	කොට්කාවත්ත මුල්ලේරියාව, කොළොන්නාව, සීතාවක, කටාන, වත්තල, ජා ඇල, බණ්ඩාරගම, පානදුර, හබරාදුව, දෙයියන්දර, තංගල්ල, පොතුවිල්, ලාහුගල, ත්‍රිකුණාමලය (කොටසක්), මහියංගනය (කොටසක්), බිබිල, වරකාපොළ (කොටසක්), මාවනැල්ල, ගගවට කෝරළේ, යටිනුවර, අකුරණ, කුණ්ඩසාලේ, තුන්පනේ (කොටසක්), හාරිස්පත්තුව, පාතහේවාහැට, උඩුනුවර, පාතදුම්බර, උකුවෙල (කොටසක්), මැදවච්චිය (කොටසක්), හිගුරක්ගොඩ (කොටසක්), නාරම්මල, වාරියපොළ, පේදුරුතුඩුව, චාවකච්චේරි, නල්ලූර්, වලික්කාමම් - දකුණ, නැගෙනහිර, උතුර, බස්නාහිර, වයඹ, කයිට්ස්, ඩෙල්ෆ්, වෙලනායි, කරෙයිනගර්	බොරලැස්ගමුව, කටාන, පානදුර, තංගල්ල, ත්‍රිකුණාමලය, බලංගොඩ, කඩුගන්නාව, වත්තේගම, පුත්තලම, පේදුරුතුඩුව, චාවකච්චේරි, වැල්වැටිතුරෙයි	මහනුවර, මාතලේ, යාපනය

<u>2.1.3 බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම, නැගෙනහිර පළාත් උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්ම හා හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය</u>

මෙම ව්‍යාපෘතිය සුවිශේෂී අරමුණු තුනක් මූලික කොට ගෙන ක්‍රියාත්මක වන අතර ඒවා පහත පරිදි වේ.

1. බස්නාහිර ප්‍රදේශ ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ බස්නාහිර පළාතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇති බාධාවන් තක්සේරු කිරීම සහ කලින් හඳුනාගත් උත්ප්‍රේරක ව්‍යාපෘතිවලින් ප්‍රමුඛතා ව්‍යාපෘති හතරක් තෝරා, නාගරික සැලසුම් රෙගුලාසි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ රාමුවක් සැකසීමයි.
2. නැගෙනහිර පළාතේ උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්ම නිර්මාණය වන්නේ නැගෙනහිර වෙරළ ආශ්‍රිත අවශ්‍ය යටිතල පහසුකම් සහිත සංචාරක කලාප හතරක් සඳහා ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙස සවිස්තරාත්මක ප්‍රධාන සැලැස්මක් සකස් කිරීමයි.
3. හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා කලාපීය සැලැස්ම, තිරසාර නාගරික, කාර්මික සහ සමාජ-ආර්ථික වර්ධනය, ආයෝජන ආකර්ෂණය කර ගැනීම, කොළඹට විකල්ප වරාය මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීම, පාරිසරික සංරක්ෂණයට ප්‍රමුඛත්වය දෙමින් සහ ප්‍රධාන වර්ධන ක්ෂේත්‍ර සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම මූලික අභිමතාර්ථ කොට ගෙන ක්‍රියාත්මක වේ. මෙහිදී විශේෂයෙන්ම වානිජ කටයුතු අවස්ථා උදාකර දීම, සංචාරක ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඇති විභවතා හඳුනාගැනීම ද ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයනු ලබන්නේ සිංගප්පූරුවේ සර්බානා ජුරෝංග් පුද්ගලික ආයතනයයි. නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත ජාතික මෙහෙයුම් කමිටුව විසින් එම සැලසුම් සමාලෝචනයට ලක් කර අනුමැතිය ලබා දේ. එමෙන්ම මේ සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් ලබා දේ.

ඒ අනුව, නැගෙනහිර පළාත සඳහා සංචාරක ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම හා බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම සකස් කිරීම අවසන් කර ඇති අතර ඒ සඳහා වන ගෙවීම් කටයුතු මේවන විටත් අවසන් කර ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා අවසන් කරන ලද ව්‍යූහ සැලැස්ම සහ හඳුනාගත් ප්‍රධාන වර්ධන මධ්‍යස්ථාන හයක් සඳහා සවිස්තරාත්මක සැලැස්මට අදාලව මේ වන විට තෙවන අදියරෙහි වාර්තාව සකස් කොට අවසන් කර සර්බනා ජුරෝංග් පුද්ගලික ආයතනය විසින් නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කමිටුව වෙත ලබා දී ඇත.

කෙසේවුවද හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්මට අදාලව අදියර 3ක් උපදේශන ආයතනය විසින් අවසන් කර ඇති අතර, ඉදිරිපත් කර ඇති අදියර 3හි ඇති තාක්ෂණික ගැටළු හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එය නිර්දේශ කර නැත. මේ සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීම සඳහා ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් විශේෂ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ මත අදාල ගෙවීම් කිරීමට නියමිතය.

ඒ අනුව, හම්බන්තොට සංවර්ධන සැලැස්මට අදාලව අදියර දෙකක් සඳහා සම්පූර්ණයෙන් මුදල් ගෙවා ඇත. උපදේශන සමාගම සමග ඇති ගිවිසුම අත්හිටුවා ඉදිරි අදියරයන්ට අදාල කාර්යයන් නාගරික සංවර්ධන අධිකාරිය හරහා සිදුකර එම සැලැස්ම අවසන් කිරීම පිළිබඳ අවධානය යොමු වී ඇත.

2.2. නාගරික භෞතික සංවර්ධනය (නාගරික සංවර්ධන ව්‍යාපෘති)

නාගරික සංවර්ධන අධිකාරියේ 2025 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නගර සැලසුම්කරණය, බලාත්මකකරණය, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඉඩම් හා දේපොළ සංවර්ධනය හා කළමනාකරණය, නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙම ප්‍රධාන කාර්යන් සුමටව කරගෙන යාම සඳහා අවශ්‍ය සේවාවන් (මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හා ප්‍රගති සමාලෝචන) ලෙස මූලධර්ම 6ක් යටතේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය මැනීම සිදුකරනු ලැබේ.

2.2.1. "සියක් නගර" නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන

2025 වර්ෂයේ දී "සියක් නගර" නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන යටතේ නගර සැලසුම්වලට අනුව මධ්‍යම, උතුරු, ඌව, උතුරු මැද, නැගෙනහිර, සබරගමුව, දකුණ හා බස්නාහිර යන පළාත් 8 ආවරණය වන පරිදි ව්‍යාපෘති 21ක් ඇතුළත් වන අතර එහි ප්‍රධාන අවධානය බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ, නගර අලංකරණය, ඇවිදින මං තීරු, වෙරළ, කෘෂි හා නාගරික උද්‍යාන, පාසැල් ගොඩනැගිලි, බහුකාර්යය ගොඩනැගිලි හා නාගරික උද්‍යාන වැනි නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි යොමු කෙරේ.

සියක් නගර වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 5,036.64ක් වන අතර 2025 වර්ෂය සඳහා රු.මිලි. 1,337.75ක ප්‍රතිපාදන වෙන් කොට ඇත. 2025.12.31 දින වන විට ව්‍යාපෘති 11ක කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘති 10ක කටයුතු සිදුකෙරෙමින් පැවති අතර 2025 වසරේ මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 696.78ක් වේ.

2.2.2 නාගරික සංවර්ධන අධිකාරිය - පොදු ආයතන

මෙම වැඩසටහන තුළ නගර සැලසුම්වලට අනුව නැගෙනහිර හා සබරගමුව යන පළාත් 2 ආවරණය වන පරිදි ව්‍යාපෘති 3ක් ඇතුළත් වන අතර එහි ප්‍රධාන අවධානය බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ හා රථගාල් හා පදික පහසුකම් වැනි නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි යොමු කෙරේ.

මෙම වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 457.33ක් වන අතර 2025 වර්ෂය සඳහා රු.මිලි. 70.00ක ප්‍රතිපාදන වෙන් කොට ඇත. 2025.12.31 දින වන විට එහි එක් ව්‍යාපෘතියක කටයුතු අවසන් කර ඇත.

2.2.3 යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

යාපනය මහනගර සභා කාර්යාලය ලෙස භාවිතා කළ පැරණි යාපනය නගර ශාලා ගොඩනැගිල්ල 1939 දී ඉදිකරන ලද්දක් වන අතර 1985 දී ඇති වූ සන්නද්ධ අරගලයේ දී එය සම්පූර්ණයෙන්ම විනාශයට පත්විය. එතැන් සිට, යාපනය මහනගර සභාව නල්ලූර් කෝවිලට අයත් ඉඩමක තාවකාලිකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර නගර සභාවේ බොහෝ අංශ තවමත් විවිධ ස්ථානවල විසිරී පවතී.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේ දී දේශීය අරමුදල් යොදා ගනිමින් නව නගර ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මේ වන විට මෙම ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 2,568.47කි. 2025 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 2,189.41ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 81%කි. යාපනය නගර ශාලාව ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියරේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. එහි දෙවෙනි අදියර ද සම්පූර්ණ කර යාපනය නගර සභාව වෙත භාර දිය යුතුව ඇත.

2.2.4. හෝමාගම කලාපයේ මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

2019 වසරේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ කොට්ටාව සිට මාහේන්වත්ත දක්වා නව ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සිදුකරනු ලබයි. 2025 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 1,726.62ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 98%කි. ප්‍රවේශ මාර්ගයේ මුළු දිග මීටර් 800ක් වන අතර මීටර් 750ක කටයුතු මේ වන විට අවසන් කර ඇත. ඉඩම් අත්පත් කරගැනීමේ ගැටළු හේතුවෙන් ඉතිරි මීටර් 50ක ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත.

2.2.5 සංචාරක ප්‍රවර්ධන හා නගර සන්නාමකරණය

2025 අයවැය කතාවේ අයවැය යෝජනාවක් ලෙස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ මූලික අදියර වශයෙන් මහනුවර, කතරගම, අනුරාධපුර හා කොළඹ නගර සන්නාමකරණය ආරම්භ කරන ලදී. ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලි. 725ක් වන අතර 2025 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 50.92ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 1.1%කි.

2.2.6 තිරසර සංචාරක සංවර්ධන වැඩසටහන

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව තිරසර සංචාරක සංවර්ධන වැඩසටහනට අදාල ආයෝජන සංරචක ක්‍රියාත්මක කරනු ලබයි. මෙමගින් ත්‍රිකුණාමලය හා දඹුල්ල (සීගිරිය ප්‍රදේශයද ඇතුලත්ව) සංචාරක ගමනාන්තවල සංචාරක විභවතාවය හා ධරණ ධාරිතාවය වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ. එමෙන්ම සංචාරක තදබදය පාලනය කිරීම,

නවාතැන් කාලය දිගු කිරීම හා සංචාරක කර්මාන්තය හරහා ප්‍රාදේශීය ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා ගැනීමට අදාල සංවර්ධන කාර්යයන් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබේ. ව්‍යාපෘති ආයෝජන සංරචකය සඳහා ඇ.ඩො මිලියන 30ක ණය මුදලට අදාල ගිවිසුම 2025.11.17 වන දින අත්සන් කරන ලදී.

ඉදිරි ඉලක්ක

- පැකේජ 1 සහ 2 යටතේ හඳුනාගන්නා ලද පහත සඳහන් උප ව්‍යාපෘතීන් 2026 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිතය.

    - සීගිරිය ආශ්‍රිත ප්‍රදේශයේ සංචාරක පහසුකම් ප්‍රවර්ධනය (නව ගම්මාන රථගාල සහ අනෙකුත් පහසුකම් (වෙළඳසැල් පොදු පහසුකම්) සංවර්ධනය, සීගිරිය පර්වත පිවිසුම් ස්ථානය දක්වා ඇවිදීමේ හැකියාව වැඩිදියුණු කිරීම, සීගිරිය කෞතුකාගාරය ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීම, සීගිරිය වැව වැඩිදියුණු කිරීම, විදේශීය සංචාරකයන්ගේ රථගාල ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය)
    - සීගිරිය ප්‍රදේශයේ පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය. (පිදුරංගල, මාපාගල, කළුදිය පොකුණ, පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය, රාම කැලේ සිට පිදුරංගල දක්වා උරුම මංපෙත වැඩිදියුණු කිරීම)

- සැලසුම් හා ඉදිකිරීම් සුපරීක්ෂණය, ධාරිතා සංවර්ධනය, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ලේඛන සැකසීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව උපදේශන සේවා ලබා ගැනීමට කටයුතු කිරීම.

අභියෝග

- නියමිත දිනට උප ව්‍යාපෘති ආරම්භ කිරීම.

2.2.7 අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2025 වසර තුල දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යසථානය ඉදිකිරීමේ උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ, ප්‍රධාන වශයෙන් බස් පර්යන්ත ගොඩනැගිල්ල, දුරස්ථ සේවා ගොඩනැගිල්ල, ගුවන් පාලම, දුම්රිය ගොඩනැගිල්ල සහ දුම්රිය පදික වේදිකාව ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබයි. 2025 වසරේ දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය 67%කි.

විශේෂ ජයග්‍රහණ

- 2025 වසර තුල දී මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියක් 35% සිට 67% දක්වා වර්ධනය කර ගැනීමට හැකි වීම.

අභියෝග

- ඉදිකිරීම් කටයුතු සඳහා ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය සහ අවශ්‍ය අවස්ථා පරිදි මුදල් නොයෙදවීම.
- වැඩ විවල්‍යතාවය හා මිල උච්චාවචනය මත ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු.මි 1,176 සිට රු.මි 2,144 දක්වා වැඩි වීම.

ඉදිරි ඉලක්ක

- මෙම ව්‍යාපෘතිය 2026 ජුනි 30 දින වන විට අවසන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර එළඹෙන පොසොන් උත්සවය වන විට අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය මහජනතාව වෙත විවෘත කිරීමට අපේක්ෂා කරයි.
- ව්‍යාපෘතියේ සම්පූර්ණ වැඩ අවසන් කිරීමෙන් පසු රජය විසින් දරන ලද වියදම සංවර්ධනය පිළිබඳ ප්‍රංශ නියෝජිත ආයතනය මගින් යුරෝ මිලියන 6ක් දක්වා ප්‍රතිපූර්ණය කර ගැනීම.

2.3 නිවාස සංවර්ධනය

2.3.1 අඩු ආදායම්ලාභී නිවාස වැඩසටහන

2.3.1.1 නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

නාගරික අඩු පහසුකම් ජනාවාසවල පදිංචිකරුවන් ස්ථිර නවීන නිවාස ඒකක සඳහා පුනස්ථාපනය කිරීම මගින් නගරයේ පවතින අඩු පහසුකම් සහිත නිවාස ඉවත් කිරීමේ අරමුණ හා ඔවුන් සාමාජීය හා ආර්ථික වශයෙන් ඉහළ නංවාලීමේ අරමුණ පෙරදැරි කරගෙන නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොළඹ නගරය කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක *කරන ලදී.* 2010 වසරේ සිදු කරන ලද සමීක්ෂණයකට අනුව කොළඹ නගරයේ හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් 68,812*ක්* සඳහා නිවාස ඒකක 50,000*ක්* ඉදිකිරීම පාදක කොටගෙන මෙම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 14,714 ක් ඉදිකිරීම් අවසන් කොට නිවාසලාභීන් පදිංචි කරමින් පවතී.

ව්‍යාපෘතියට 2025 වර්ෂය සඳහා රු.මිලි. 8,200.00 ක ප්‍රතිපාදන වෙන් කල අතර 2025 වසරේ වියදම රු.මිලි. 7,699.67 කි. රන්දොර උරුමය ඔප්පු ලබා දීම වැඩසටහන මගින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ නිවාසලාභීන් වෙත ඔප්පු ලබා දීමේ ක්‍රියාවලියට ආරම්භ කරන ලදී. මේවන විට මිහිඳුසෙන්පුර, මෙට්රෝ හෝම්ස් හා සිරිසර උයන යන ව්‍යාපෘති *3* හි පුනස්ථාපනය කරන ලද නිවාස හිමියන් සඳහා ඔප්පු 167 ක් ලබා දී ඇත. ඉතිරි ප්‍රතිලාභීන්ගට ඔවුන් වෙත නියමිතව ඇති අවශ්‍යතාවයන් සැපිරීම අනුව ඉදිරියේදී ඔප්පු නිකුත් කිරීම සිදු කෙරේ. අනෙකුත් ව්‍යාපෘති සඳහා ඔප්පු ලබාදීමට අවශ්‍ය අනුමැතීන් මේ වන විට ලබාගනිමින් පවතී.

තවද, 2025 දී කොළඹගේ මාවතෙහි නිවාස ඒකක 615කින් සහ ටොරින්ටන් ඇවනියු නිවාස ඒකක 115කින් සමන්විත නිවාස ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අවසන් කිරීමට නව කොන්ත්‍රාත් ප්‍රදානය 2025 දී සිදු කරන ලදී .

2.3.1.2 කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහයවීම

2010 දී කොළඹ සහ ඒ අවට ජීවත් වන අඩු පහසුකම් සහිත පවුල් 50,000 ක් පදිංචි කිරීම සඳහා නාගරික පුනර්ජීවන වැඩසටහන (URP) ආරම්භ කරන ලදී. එම නිවාස වැඩසටහන කඩිනම් කිරීම සඳහා 2025 වන විට තවත් නිවාස ඒකක 5,500 ක් ඉදිකිරීමට අපේක්ෂිතය. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ සහය අරමුදල් පහසුකම යටතේ 2019 අප්‍රේල් මාසයේ සිට කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා සහය ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහාය වීම, තාක්ෂණික සැලසුම් වැඩිදියුණු කිරීම්, නැවත පදිංචි කිරීම් සහ පශ්චාත් නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති, නිවාස නඩත්තු කිරීම, ප්‍රතිසංවර්ධන ප්‍රවේශයේ නවෝත්පාදනය සහ නිවාසවල දිගුකාලීන තිරසාරභාවය හැඩගැස්වීම සඳහා මහජන මැදිහත්වීම් සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය සංරචක තුනකින් සමන්විත වේ.

සංරචක 1: නිවාස ඉදිකිරීම්.

බහු මහල් නිවාස ගොඩනැගිලිවල අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා උප ව්‍යාපෘති පහක් යටතේ නිවාස ඒකක 5,500 ක් (ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවට අනුව දැනට යෝජිත ඒකක 3,600) ඉදිකිරීම සඳහා අඩු පහසුකම් සහිත ජනාවාස හිමියන්ට සහාය වීම.

සංරචක 2: ඉඩම් වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම.

ඉඩම් වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම තුලින් නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ ඉදිකරන නව මහල් නිවාස ඒකක මගින් වරප්‍රසාද නොලත් ප්‍රජාව නැවත පදිංචි කළ පසු නිදහස් වන ඉඩම්වලින් ලැබෙන ආදායම උපරිම වනු ඇත.

සංරචක 3: තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය.

නාගරික පුනර්ජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා, ව්‍යාපෘති කළමනාකරණය සහ අනෙකුත් ක්‍රියාමාර්ග සඳහා සහාය ලබා දීම.

2025.12.31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 61% කි. උප ව්‍යාපෘතින් වල භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව **2.3** උප ව්‍යාපෘති වලට අදාල ප්‍රගතිය

අංකය	උප ව්‍යාපෘති	**2024.12.31** දිනට සමස්ථ භෞතික ප්‍රගතිය (%)
1	නිවාස ඒකක 624 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කොළඹගේ මාවත ව්‍යාපෘතිය	100
1.1	කොළඹගේ මාවත ව්‍යාපෘතියේ මළ අපවහන පද්ධතිය සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම	94
2	නිවාස ඒකක 1,000 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ස්ටෙඩියම්ගම ව්‍යාපෘතිය	100
2.1	ස්ටෙඩියම්ගම නිවාස ව්‍යාපෘතියේ ගුරුත්ව මළ අපවහන පද්ධතිය සැලසුම් කිරීම සහ ඉදිකිරීම	68
2.2	මාදම්පිටිය මළ අපවහන පොම්පාගාරය පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය	10
3	නිවාස ඒකක 700 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ඇපල්වත්ත ව්‍යාපෘතිය	56
4	නිවාස ඒකක 750 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ෆගාසන් පාර ව්‍යාපෘතිය	20
5	නිවාස ඒකක 700 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ මාදම්පිටිය ව්‍යාපෘතිය	73
6	නිවාස ඒකක 300 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ඔබේසේකරපුර ව්‍යාපෘතිය (ශේෂ කාර්යයන්) නිමකිරීම	ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතියට යවා ඇත.
	ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය	**61.19%**

විශේෂ ජයග්‍රහණ

- කොළඹගේ මාවත ව්‍යාපෘතිය - සියලු ගොඩනැගිලි සම්පූර්ණයෙන් නිමකර 100% ක සමස්ත භෞතික ප්‍රගතියක් ලබා, අවසාන පවරා ගැනීමේ පරීක්ෂණ සිදුවෙමින් පවතී.

- කොළඹගේ මාවත ව්‍යාපෘතියේ මළ අපවහන පද්ධතිය සහ පොම්පාගාරය - සැලසුම් කිරීම සහ මළ අපවහන නල එලීම අවසන්කර ඇත. පොම්පාගාරයේ ඉදිකිරීමේ කටයුතු 80% සම්පූර්ණ කර ඇත.
- ස්ටෙඩියම්ගම ව්‍යාපෘතිය - සියලු ගොඩනැගිලි සම්පූර්ණයෙන් නිමකර 100% ක සමස්ත භෞතික ප්‍රගතියක් ලබා විෂය පථය සම්පූර්ණ කිරීම.
- ස්ටෙඩියම්ගම නිවාස ව්‍යාපෘතියේ ගුරුත්ව මළ අපවහන පද්ධතිය - සැලසුම් කිරීම සම්පූර්ණ කිරීම සහ දෙවන අදියරේ මළ අපවහන නල එලීම අවසන්කර ඇත .
- මාදම්පිටිය මළ අපවහන පොම්පාගාරය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වැඩ කටයුතු ආරම්භ කර ඇත.
- ඔබේසේකරපුර ව්‍යාපෘතිය - ඉතිරි කටයුතු සඳහා අරමුදල් සැපයීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ශේෂකාර්යයන් නිමකිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතියට යවා ඇත.
- ඇපල්වත්ත ව්‍යාපෘතිය - සියලු ගොඩනැගිලිවල ව්‍යූහාත්මක කටයුතු අවසන් කර ඇත. සැලසුම් කටයුතු 95% ක් පමණ අවසන් කර ඇත. කොන්ත්‍රාත්තුවට අනුව කාර්යයේ විෂය පථය 56% සම්පූර්ණ කර ඇත.
- ෆගාූසන් පාර ව්‍යාපෘතිය - ගොඩනැගිලි තුනෙහිම ටැම් කුළුණු ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත. සියලු ගොඩනැගිලිවල සුපිරි ව්‍යූහයෙහි ව්‍යූහාත්මක කාර්යයන් 3 වන මහල දක්වා ඉදි කර ඇත.
- මාදම්පිටිය ව්‍යාපෘතිය - ගොඩනැගිලි හතරෙහිම ව්‍යූහාත්මක කටයුතු, බිත්ති බැඳීම සහ කපරාරු කිරීම පොලොව බදාම යෙදීම අවසන් කර ඇත. සැලසුම් කටයුතු 99 % පමණ අවසන් කර ඇත. කොන්ත්‍රාත්තුවට අනුව කාර්යයේ විෂය පථය 73% සම්පූර්ණ කර ඇත

අභියෝග

- කොළඹගේ මාවත ව්‍යාපෘතිය හා ස්ටෙඩියම්ගම ව්‍යාපෘතිය
  - නිවාස සඳහා විදුලි හා මළ අපවහන උපයෝගීතා සේවා සම්බන්ධතාවයන් ලබා ගනීම.
- කොළඹගේ මාවත ව්‍යාපෘතිය හා ස්ටෙඩියම්ගම ව්‍යාපෘතිය
  - අඩු පහසුකම් සහිත ජනාවාස හිමියන්ගේ නම් ලයිස්තුව පිළියෙල කිරීම හා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඇත.
- ඔබේසේකරපුර ව්‍යාපෘතිය
  - ශේෂ කාර්යයන් නිමකිරීමට අවශ්‍ය කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඇත.
- ඇපල්වත්ත ව්‍යාපෘතිය
  - කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ගැටලු හා දුර්වල කැපවීම නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය මන්දගාමී වීම.
  - ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේ කටයුතු නිමකිරීමට කල් දිගු කිරීම් ලබා ගත්තද එම කාලයන්ද ඉක්මවා යන තුරුත් වැඩ අවසන් නොවීම.
  - ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම හා නිමකිරීම.
- ෆගාූසන් පාර ව්‍යාපෘතිය
  - කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ගැටලු හා දුර්වල කැපවීම නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය මන්දගාමී වීම.

- ගුරුත්ව මළ අපවහන පද්ධතිය ඉදිකිරීම.
- ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේ කටයුතු නිමකිරීමට කල් දිගු කිරීම් ලබා ගත්තද එම කාලයන්ද ඉක්මවා යන තුරුත් වැඩ අවසන් නොවී හා ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම හා නිම කිරීම.

- මාදම්පිටිය ව්‍යාපෘතිය
  - පරිශ්‍රයේ අනවසර පදිංචිකරුවන් සිටීම.
  - විදුලිය, ජලය හා මළ අපවහන සේවා සම්බන්ධතා ගාස්තු වෙන් කරන ලද තාවකාලික මුදලට වඩා වැඩි හෙයින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට නියමිතය.

ඉදිරි ඉලක්ක

- ස්ටේඩියම්ගම ව්‍යාපෘතියේ 2026 අප්‍රේල් මාසය අවසානයේ මළ අපවහන පද්ධතිය ඉදිකර අවසන් කිරීමට අපේක්ෂිතය. 2026 වර්ෂය අවසානය වන විට වරප්‍රසාද නොලත් අඩු ආදායම්ලාභී පවුල් 1,000 කට නිවාස ලබා දීම සිදු කෙරේ. නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් අක්කර 22 ක් බෙත්තාරාමෙන් නිදහස් කර ගැනීම.
- කොළඹගේ මාවත ව්‍යාපෘතියේ 2026 පෙබරවාරි මාසය අවසානයේ මළ අපවහන පද්ධතිය ඉදිකර අවසන් කිරීම. 2026 ජූලි මාසය අවසානය වන විට වරප්‍රසාද නොලත් අඩු ආදායම්ලාභී පවුල් 624 කට නිවාස ලබා දීම. නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් අක්කර 5 ක් පූර්වාරාම හා සමගිපුරෙන් නිදහස් කර ගැනීම.
- මාදම්පිටිය ව්‍යාපෘතියේ 2026 ජූලි මාසය අවසන් වන විට ඉදිකිරීමේ වැඩ කටයුතු අවසන් කිරීම. 2026 වර්ෂය අවසානය වන විට වරප්‍රසාද නොලත් අඩු ආදායම්ලාභී පවුල් 700 කට නිවාස ලබා දීම.
- නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් අක්කර 4 ක් සමිත්පුරෙන් නිදහස් කර ගැනීම.
- ඇපල්වත්ත ව්‍යාපෘතියේ 2026 වර්ෂය අවසන් වන විට ඉදිකිරීමේ වැඩ කටයුතු අවසන් කිරීම.
- ෆගුසන් පාර ව්‍යාපෘතියේ 2026 වර්ෂය අවසන් වන විට ගොඩනැගිලි තුනෙහිම ව්‍යුහාත්මක කටයුතු අවසන් කිරීම. ගුරුත්ව මළ අපවහන පද්ධතිය ඉදිකිරීමේ වැඩ කටයුතු අවසන් කිරීම.
- ඔබේසේකරපුර ව්‍යාපෘතිය - ශේෂ කාර්යයන් නිමකිරීමට අවශ්‍ය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම. 2026 වර්ෂය අවසන් වන විට ව්‍යුහාත්මක වැඩ ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම.
- කොළඹගේ මාවත සහ ස්ටේඩියම්ගම නිවාස සංකීර්ණවල ඉදිකිරීම් අවසන් බැවන් 2026 වර්ෂයේ නිවාසලාභීන් වෙත නිවාස ප්‍රදානය කිරීම.
- උප ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු 2026 වර්ෂයේදී ආරම්භ කිරීම.

2.3.1.3 චීන රජයේ ආධාර මත අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය

චීන රජයේ ආධාර යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඒකක, 1,888 මොරටුව, දෙමටගොඩ, මහරගම සහ පැලියගොඩ යන ස්ථානවලද කලාකරුවන් සඳහා නිවාස ඒකක 108 ක් කොට්ටවෙහි ද ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිත වේ. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 24.03% කි. උප ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතීන් පහත පරිදි වේ.

වගුව 2.4 උප ව්‍යාපෘතිවල ප්‍රගතිය

උප ව්‍යාපෘතිය	භෞතික ප්‍රගතිය
මොරටුව - 575 නිවාස ව්‍යාපෘතිය	17.81%
කොට්ටාව - 108 නිවාස ව්‍යාපෘතිය	23.03%
දෙමටගොඩ - 586 නිවාස ව්‍යාපෘතිය	15.02%
මහරගම - 112 නිවාස ව්‍යාපෘතිය	28.61%
පෑලියගොඩ - 615 නිවාස ව්‍යාපෘතිය	11.45%

විශේෂ ජයග්‍රහණ

- 2019 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය ලබාගත්තද ඒ සම්බන්ධ ඉදිරි කටයුතු චීන රජය මගින් පත්කළ ව්‍යාපෘති කළමනාකරණ ආයතනය සමග 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා 2024 දෙසැම්බර් මස වන විට මුල් ගල් තැබීම සිදු කොට ආරම්භ කරන ලදී. චීන රජය මගින් 2024 අවසන් වීමට ප්‍රථම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ලබාදුන් ඉලක්කය සාර්ථකව සාක්ෂාත් කර ගැනීමට හැකි වූ නිසා යුවාන් මිලියන 552ක මුල්‍ය ප්‍රදානය ස්ථිර ලෙස ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමට හැකිවිය.
- එසේ ඉතා කඩිනමින් ව්‍යාපෘති ආරම්භය සිදු කිරීම සඳහා කොළඹ අවට ස්ථාන 05ක ඉදිකිරීමට යෝජිත නිවාස ව්‍යාපෘති 05කින් යුතු මෙම ව්‍යාපෘතිය පැකේජ 03ක් ලෙස සකසා ඊට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය මාස 04ක් වැනි සුළු කාලයකින් 100% සිදු කර එක් එක් කොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කිරීම ද මෙම ව්‍යාපෘතිය මගින් 2024 වසරේදී සිදු කරන ලද විශාල ජයග්‍රහණයකි.
- ව්‍යාපෘතියේ උක්ත සඳහන් කරන ලද ප්‍රසම්පාදන කටයුතු, නිර්මාණ, ප්‍රමාණ බිල්පත්, ඇස්තමේන්තු කිරීම් හා ඉදිකිරීම් කටයුතු ආශ්‍රිත කාර්යයන් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ හා මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතියේ කාර්යය මණ්ඩලය හරහා 2025 වර්ෂයේ මාර්තු මස ව්‍යාපෘතියට අදාලව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටවන තෙක් අප්‍රමාදව හා සාර්ථකව ඉදිරියට කරගෙන යන ලදී.

අභියෝග

- ව්‍යාපෘතිවලට අදාල ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 100% අවසන් නොමැතිව පැවතීම හේතුවෙන් ඒ සම්බන්ධ නෛතික ගැටළු හා නඩු පැවරීම් ආශ්‍රිත අභියෝගවලට මුහුණපෑමට සිදු වන ලද අතර ඒවා සාර්ථක ලෙස විසඳා ගැනීම.
- ව්‍යාපෘති ආශ්‍රිත සමාජීය හා දේශපාලනික ගැටළු මෙන්ම එම ඉඩම් අවට පදිංචි පිරිස් වෙතින් සිදු කරනු ලබන පැමිණිලි ද සාර්ථක ලෙස විසඳා ගැනීම.
- මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දුන් චීන රජයේ එකඟතාවය මත සරල කරන ලද එකතු කල අගය මත බදු (SVAT) සහනය 2025 ඔක්තෝම්බර් මස 01වන දින සිට අත්හිටුවීම සම්බන්ධයෙන් චීන රජයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනය එකඟතාවය පල නොකිරීම නිසා ඒ සම්බන්ධව වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවීමෙන් අනතුරුව ඒ සඳහා වන කාර්යය මණ්ඩලය බඳවාගැනීමට අදාලව ලබා ගත යුතු මූලික අනුමැතීන් සඳහා දීර්ඝ කාලයක් ගතවීම හා අනුමත කාර්යය මණ්ඩලය සඳහා සුදුසුකම්ලත් පිරිස බඳවාගැනීමේ පවතින අභියෝග.

ඉදිරි ඉලක්ක

- දෙසැම්බර් මාසයේ කොට්ටාව සහ මහරගම නිවාස ව්‍යාපෘතින්හි වැඩ අවසන් කිරීම.
- දෙසැම්බර් මාසයේ අග වනවිට මොරටුව සහ පැලියගොඩ ව්‍යාපෘතීන්හි 54% ක භෞතික ප්‍රගතියක් ලභා කර ගැනීම සහ දෙමටගොඩ ව්‍යාපෘතියේ 62% ක ප්‍රගතියක් ලභා කර ගැනීම.
- ඉහත සඳහන් නිවාස ව්‍යාපෘතින් සඳහා චීන රජයෙන් ලද යුවාන් මිලියන 552 පරිත්‍යාගයෙන් එම නිවාස ඉදිකිරීම සඳහා රෙන්මින්බි 466.5ක මුදලක වියදමක් ඇස්තමෙන්තුගත කර ඇති අතර ඉතිරි මුදල වන රෙන්මින්බි 85.5 සඳහා තවත් නිවාස ඒකක 208ක් සෑදීමට අදාලව යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර ඇති අතර එහි අනුමැතිය ලැබීමෙන් පසුව මෙම නිවාස ව්‍යාපෘතියේද වැඩ කටයුතු 2026 වර්ෂයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

2.3.1.4 රජයේ මහල් නිවාසවල අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු

2025 වර්ෂයේ අයවැය යෝජනා යටතේ මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලි. 325කි. මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක කරන ලද අතර 2025 දෙසැම්බර් 31වන විට ව්‍යාපෘති 10ක ප්‍රසම්පාදන කටයුතු සිදුකෙරෙමින් පැවති අතර අබලන් විදුලි සෝපාන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය 65%ක භෞතික ප්‍රගතියක් හා රු.මිලි. 38.15ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

එමෙන්ම, මේ සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලි. 235කි. මේ යටතේ පෙර නිම කරන ලද මහල් නිවාස වන අඟුලාන සහ සහස්පුර මහල් නිවාසවල නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා 2025.12.31 දින වන විට රු.මිලි. 64.61ක් වියදම් කර ඇත. සමස්ත භෞතික ප්‍රගතිය 48%කි.

2.3.1.5 නිමකරන ලද නිවාස ව්‍යාපෘතිවල අතිරේක කාර්යයන්

අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත ලබා දෙන ලද නිවාස ඒකකවල අතිරේක කාර්යයන්හි 2025.12.31 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.

- **ලුනාව නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 356කින් සමන්විත මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 33.11කි. එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලි.5.7ක් වන අතර භෞතික ප්‍රගතිය 54%කි.
- **අඟුලාන නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 288කින් සමන්විත මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 82.5කි. එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලි.3.72ක් වන අතර භෞතික ප්‍රගතිය 17%කි.
- **හලාවත නාගරික නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 57කින් සමන්විත මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 5.64කි. එහි භෞතික ප්‍රගතිය 58%කි.
- **සහස්පුර නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 686කින් සමන්විත මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 1.14කි. එහි භෞතික ප්‍රගතිය 3.5%කි.
- **අනුරාධපුර තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 06කින් සමන්විත මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 4.59කි. එහි භෞතික ප්‍රගතිය 8%කි.
- **සිංහපුර නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 120කින් සමන්විත මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 7.96කි. එහි භෞතික ප්‍රගතිය 4.5%කි.

2.3.2 මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති (මූලික අදියර)

මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කරගනිමින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිවල ප්‍රාරම්භක කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එහි 2025.12.31 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.

මෙම ව්‍යාපෘති බොහොමයක් මූලික අනුමැතීන් සහ ඉඩම් පවරා ගැනීමේ අදියරේ පවතී.

- **වත්තල, වැලිසර නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 408ක් සැලසුම් කර ඇති අතර මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 8,342.92කි. එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 0.28ක් හා භෞතික ප්‍රගතිය 27.5%කි.
- **නිට්ටඹුව, ඕර්වර්ඩ්වත්ත නිවාස ව්‍යාපෘතිය :** නිවාස ඒකක 130ක් සඳහා රු.මිලි. 1,480ක් ඇස්තමේන්තු කර ඇති අතර භෞතික ප්‍රගතිය 11.6% කි.
- **ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 160ක් සඳහා රු.මිලි. 8,278ක් ඇස්තමේන්තු කර ඇති අතර භෞතික ප්‍රගතිය 18%කි.
- **අතුරුගිරිය නිවාස ව්‍යාපෘතිය:** නිවාස ඒකක 102ක් සඳහා රු.මිලි. 4,205ක් ඇස්තමේන්තු කර ඇති අතර භෞතික ප්‍රගතිය 6%කි.
- **කඩුවෙල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය:** නිවාස ඒකක 112ක් සඳහා රු.මිලි. 4,020ක් ඇස්තමේන්තු කර ඇති අතර භෞතික ප්‍රගතිය 3.3%කි.

2.3.3 නාගරික සමාජ සංවර්ධනය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන යටතේ නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සාමාජීය, ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතිකමය වශයෙන් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔවුන් තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ඔවුන්ව ස්වශක්තියෙන් ඔසවා තැබීමට අවශ්‍ය සහයෝගය ලබාදීම අරමුණ වේ.

- **සමාජ සංවර්ධන වැඩසටහන්:** ප්‍රජා සවිබල ගැන්වීම සහ අධ්‍යාපන කටයුතු ඇතුළත් මෙම අංශයෙන් ප්‍රතිලාභීන් 39,086ක් ආවරණය වී ඇත. මේ සඳහා රු.මිලි. 30ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ඉන් රු.මිලි. 30ක ප්‍රමාණයම වියදම් කර ඇත. මෙහි භෞතික ප්‍රගතිය ඉලක්කය ඉක්මවා ගොස් ඇති අතර එය 132%ක් ලෙස දක්වා ඇත.
- **ව්‍යවසායකත්ව සංවර්ධනය:** මේ මගින් හඳුනාගත් ව්‍යවසායකයින් 86ක් සඳහා මූල්‍ය ණය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

විශේෂ ජයග්‍රහණ

- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ජනතා අයිතියට පත්කරන ලද නිවාස ව්‍යාපෘතින්හි හිමිකම් ඔප්පු 55 ක් මෙම වසරේ දී ප්‍රතිලාභීන්හට ප්‍රදානය කරන ලදී.
- අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි ජීවත්වන තරුණ තරුණියන් 16 දෙනෙක් උදෙසා ජපන් භාෂා නිපුණතාවය සහ ප්‍රායෝගික පුහුණුව ලබාදී පුහුණු ශ්‍රමිකයන් ලෙස විදේශගත කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එක්ව ජපන් භාෂා පුහුණු පාඨමාලාව සාර්ථකව සිදුකරන ලදී.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට නාගරික ප්‍රජාව දායක වීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන ස්වයංරැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධන උප වැඩසටහන මගින් හඳුනාගනු ලැබූ ව්‍යවසායකයන් 86 දෙනෙකුට මූල්‍ය ණය පහසුකම් ලබාදීමට කටයුතු කරන ලදී.

- මහයියාව අඩු ආදයම්ලාභී නිවාස හිමියන් වෙනුවෙන්, නිවාස සංකීර්ණයක් ඉදිකරමින්, වඩා උසස් ජීවන තත්වයක් ලබාදීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යන අංශය සමග ඒකාබද්ධව සමාජ ආර්ථික සමීක්ෂණයක් සැලසුම් කිරීමට ද මූලික පියවර ගන්නා ලදී.
- එසේම, 39 වන ලෝක ජනාවාස දිනය මෙවරත් "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" යන තේමාව යටතේ පවත්වන ලදී.

අභියෝග

- මේ වන විට රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳව වූ අංක අමප/23/1483/604/030-II දරණ හා 2023.08.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සියලු පරිපාලනමය කටයුතු සිදුකිරීමට බාධාවක් වී ඇත.
- භෞතික හා සමාජ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අධිකාරියේ මෙහෙයුම් ජාලය පුළුල් කළ යුතු වීම.
- නාගරික ඉලක්කගත ප්‍රතිලාභීන් හට දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා පවතින අභියෝග, නාගරික බල ප්‍රදේශවල පවතින ඉඩම් සීමිත වීම හා හඳුනා ගෙන ඇති ඉඩම් සංවර්ධනය කිරීමේ දී මුහුණපෑමට සිදුවන ගැටලු, ඉහළ ගොස් ඇති මූල්‍යමය වියදම හමුවේ සංවර්ධනකරුවන්ගේ සහභාගීත්වය අවම වීම.
- අධිකාරියේ බලතල හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ස්ථීර කාර්යය මණ්ඩලය මේ වන විට පුරප්පාඩුව පවති. විශේෂයෙන්ම, අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරු 3ක් ඇතුළුව පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව 53කි.

ඉදිරි ඉලක්ක

- වත්මන් රජය විසින් නාගරික මහල් නිවාස හා අනෙකුත් නාගරික ජනාවාසවල සමාජ සංවර්ධන වැඩසටහන ප්‍රධානතම අංගයක් ලෙස හඳුනාගෙන එය ක්‍රියාත්මක කිරීම.
- අත්‍යවශ්‍ය තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීම් සිදුකිරීම.
- මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත ඌණ උපයෝජිත ඉඩම් උපයෝජනය කර ගනිමින් මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- එමගින් උපයනු ලබන ආදායමෙන් සමාජ සංවර්ධන වැඩසටහන්, නිවාස ණය වැඩසටහන් හා පුනස්ථාපන නිවාස ව්‍යාපෘති සිදුකිරීමට අපේක්ෂා කෙරේ.
- දීප ව්‍යාප්තව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වල දායකත්වය ලබා ගෙන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- වෙළඳපොළ සමීක්ෂණ වැනි නිසි අධ්‍යයනයන් සිදු කිරීම මගින් අදාල ව්‍යාපෘතියේ ඉලක්ක ගත කණ්ඩායම් හඳුනා ගැනීම සහ ඒ අනුව දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- දැනටමත් සියලු ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මෙම ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර, ඉදිරියටත් ඌන උපයෝජිත රජය සතු ඉඩම් පවරාගෙන නිවාස යෝජනා ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතන හා ව්‍යුහයන් දැනට භුක්ති විඳින එහෙත් තවදුරටත් සංවර්ධනය කිරීමේ හැකියාවක් ඇති ඉඩම් හඳුනාගෙන එම ආයතන සමග අන්තර්සහයෝගයෙන් දෙපාර්ශවයටම ප්‍රතිලාභ ලැබෙන ලෙස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වෙනත් ආයතන සතු ආර්ථිකමය වශයෙන් වටිනාකමක් ඇති ඉඩම් මිලදී ගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2.3.4 සභාධිපත්‍ය ජනාවාස කළමනාකරණය

සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පාර්ශවකරුවන් ප්‍රමාණවත් පරිදි සපයා ඇති බවට සහතික කිරීම හා පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම, පාලනය හා පරිපාලනය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවීම, අධිකාරියේ ලියාපදිංචි කිරීම සහ සක්‍රීයව ක්‍රියාත්මක කරවීමේ කටයුතු ඉටු කිරීම සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කාර්යයභාරයයි.

ඒ අනුව, 2025 වර්ෂයේදී තාවකාලික සභාධිපත්‍ය 02 ක් අවසන් සභාධිපත්‍ය සහතික 36 ක් සහ මූලික නිෂ්කාශන (25%) සහතික 65 ක් අළුත් කිරීමේ ගාස්තු සහතික 01 ක් නිකුත් කර ඇත. තවද, කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීම යටතේ රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු 473 ක් (නිවාස ඒකක 13,184 ක් සඳහා) සහ පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු 790 ක් (නිවාස ඒකක 31,669 ක් සඳහා) ලියාපදිංචි කර ඇත. එමෙන්ම, කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු අළුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යටතේ රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු 47 ක් (නිවාස ඒකක 1,680 ක් සඳහා) සහ පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු 428 ක් (නිවාස ඒකක 20,716 ක් සඳහා) අළුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට හැකි විය.

2025.12.31 දිනට රු. මි. 294.45 ක වාර්ෂික සංශෝධිත අයවැය ඉලක්කයට සාපේක්ෂව රු. මි. 279.09 ක මුදලක් එකතු කර ගැනීමට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හැකි වූ අතර එය ඉලක්කගත ප්‍රගතියෙන් 93% ක කාර්යක්ෂමතාවයකි. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය සඳහා ශුද්ධ ලාභ ආන්තිකය 26% ක් සහ මෙහෙයුම් වියදම් 101% ක් ලෙස වාර්තා විය. සභාධිපත්‍ය දේපළවල පොදු අංගෝපාංග සහ පොදු උපාංග සම්බන්ධයෙන් අධිකාරිය වෙත 2025 වසරේදී පැමිණිලි 136 ක් ලැබී ඇති අතර 2025 දෙසැම්බර් 31 දිනට ඉන් 118 ක් සම්පූර්ණයෙන්ම විසඳන ලදී. මහල් නිවාස අයිතිය පිළිබඳ පනත සහ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනත සඳහා යෝජිත සංශෝධන අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සහ සකස් කිරීම සිදු කෙරෙමින් පවතී.

අභියෝග

- සභාධිපත්‍ය දේපළ කර්මාන්තය රටේ නිවාස අවශ්‍යතාවය කෙරෙහි නිසි ලෙස ඉලක්කගත නොවීම.
- අධිකාරියේ අරමුණු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විවිධ අරමුණු සඳහා පිහිටුවන ලද ආයතන විශාල ගණනක් සමග කටයුතු කිරීමට සිදුවීම.
- පෞද්ගලික අංශය මගින් ඉදි කරනු ලැබූ සභාධිපත්‍ය දේපළ ගැනුම්කරුවන්ගේ මිල දී ගැනීමේ ප්‍රවණතාවය අඩු වීම.
- සභාධිපත්‍ය දේපළ නඩත්තුව සඳහා ප්‍රජා සහාය අතිශය අවම මට්ටමක පැවතීම.
- ඉදිකිරීම් පිරිවැය අධික වීම හේතුවෙන් මධ්‍යම ආදායම්ලාභීන්ට සහ අඩු ආදායම්ලාභීන්ට එම නිවාස මිල දී ගැනීමට ඇති අපහසුතාවය
- සභාධිපත්‍ය දේපළ නඩත්තු හා සේවා සපයන්නන්ගේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු

ඉදිරි ඉලක්ක

- සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංගවලට අදාළව Clean Sri Lanka ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තුව, පාලනය, පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට මග පෙන්වීම සහ නියාමනය.
- ඉදිකරමින් පවතින සභාධිපත්‍ය දේපළවල ප්‍රගතිය නියාමනය.
- නැවත සංවර්ධනය කළ යුතු දේපළ හඳුනාගැනීම සහ ඊට අදාළ ප්‍රතිසංවර්ධන සැළසුම් රජයට ඉදිරිපත් කිරීම.
- හඳුනාගත් සභාධිපත්‍ය දේපළ ප්‍රතිසංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ලබා ගැනීම හා එම දේපළවල අදාළ කාර්යයන් පෙළගැස්වීමට අදාළව යම් ප්‍රතිශතමය මුදලක් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලබා ගැනීම.
- සභාධිපත්‍ය ගැටළුවලට කාලෝචිත විසඳුම් ලබා දීම හා සභාධිපත්‍ය දේපළ නීතිය හා රෙගුලාසි යාවත්කාලීන කිරීම.
- සභාධිපත්‍ය දේපළ හා එහි නීතිය සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

2.4 තිරසර පරිසරයක් නිර්මාණය කිරීම

2.4.1 නාගරික වැසිජල පාලනය

2.4.1.1 පවතින ඇළ මාර්ග, වැව්, තෙත් බිම් සහ ඇවිදීමේ මාර්ග නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මෙම වැඩසටහන යටතේ ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් කොළඹ අගනගර කලාපයේ සහ ඒ අවට පවතින ප්‍රධාන ඇළමාර්ග වල කිලෝමීටර 44 දිග ප්‍රමාණයක්, ද්විතියික ඇළමාර්ගවල කිලෝමීටර 52 දිග ප්‍රමාණයක් සහ හැමිල්ටන් ඇළෙහි කිලෝමීටර 22 දිග ප්‍රමාණයක් නඩත්තු කිරීම සිදු කරයි.

තවද, දියත උයන, ජපන් මිත්‍රත්ව පාර, කිඹුලාවල, මාලඹේ, බෙල්ලන්විල, නුගේගොඩ තෙත්බිම් උද්‍යානය, බොරලැස්ගමුව "කෙළිමඩල" යන ප්‍රදේශවලද වැව්, පොකුණු, පොදු ස්ථාන සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම ද සිදු කෙරේ. මෙම වැඩසටහනේ 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මි 839.26 ක් වන අතර භෞතික ප්‍රගතිය 100% කි.

2.4.1.2 ජලාපවහන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පරිසර ආරක්ෂණය

මෙම වැඩසටහන පාරිසරික ආරක්ෂණ ක්‍රියාමාර්ග සමග ඒකාබද්ධ වැසි ජල කළමනාකරණ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම, නිර්මාණය කරයි. එයට ජල විද්‍යාත්මක හා පාරිසරික අධ්‍යයන, ජලාපවාහන යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණය, තෙත්භූමි සංරක්ෂණ වැඩසටහන්, වැසිවතුර අවම කිරීමේ කටයුතු, පාරිසරික නිරීක්ෂන සහ නියාමන ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇතුළත් වේ. මෙම වැඩසටහනේ 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මි 201.51 ක් වන අතර භෞතික ප්‍රගතිය 84% කි.

2.4.1.3 වැසි ජල ආපදා සඳහා කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල වැසි ජල පොම්පාගාර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

අධික වර්ෂාපතනය කළමනාකරණය කිරීම සහ කොළඹ සහ ඒ අවට පහත් බිම්වල වැසිවතුර අවදානම අවම කිරීම සඳහා ජල පොම්පාගාර අත්‍යවශ්‍ය වේ. ඒවා ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම මෙමඟින් සිදුවේ. මෙම වැඩසටහනේ 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මි 265.72 ක් වන අතර භෞතික ප්‍රගතිය 100% කි.

2.4.1.4 වැසි ජල ආපදා සඳහා සූදානම හා හදිසි ප්‍රතිචාර දැක්වීම

මෙම වැඩසටහන යටතේ වැසිජල අවදානම අවම කිරීම සහ වැසි ජල ගැලීම් සිදුවීම් වලදී ඉක්මන් ක්‍රියාමාර්ග සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සිදුකරන ලදී . සූදානම් වීමේ අංගයට ප්‍රධාන ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම, සවිස්තරාත්මක සැලසුම් සහ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම සහ දිස්ත්‍රික්ක කිහිපයක වැසි ජල අවදානම් ප්‍රදේශ සඳහා ජලාපවහන සැලසුම් සකස් කිරීම ඇතුළත් වේ. ජල ප්‍රවාහය වැඩි දියුණු කිරීම සඳහා තෝරාගත් ඇළ මාර්ගවල රොන්මඩ ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම ද එයට ඇතුළත් ය. එමෙන්ම, හදිසි ජලාපවහන වැඩිදියුණු කිරීම් සහ ආපදා අවස්ථාවන්හිදී අවශ්‍ය පිළියම් පිළිබඳ අවධානය යොමු කරයි. මෙම වැඩසටහනේ 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මි. 61.02 ක් වන අතර භෞතික ප්‍රගතිය 100% කි.

2.4.1.5 ඔලියමුල්ල වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

යෝජිත ඔලියමුල්ල ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් වත්තල සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගංවතුර අවම කිරීම අරමුණු කරගනිමින් සිදුවන අතර එහි ජල පෝෂක ප්‍රමාණය වර්ග කිලෝමීටර 17 (හෙක්ටයාර 1,700) පමණ වේ. මෙම ජල පෝෂකය කළුඔය ජල පෝෂකය හා සම්බන්ධ වේ.

යෝජිත ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් තත්පරයට ඝන මීටර් 15 සහ තත්පරයට ඝන මීටර් 20 ධාරිතාවයකින් යුත් පොම්පාගාර 02කින් සමන්විත වේ. තවද පැලියගොඩ - පුත්තලම මාර්ගයේ (ඔලියමුල්ල පාලම) අංක 3/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම, වැව සහ වැව් බැම් ප්‍රතිසංස්කරණය කිරීම, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ නැවත පදිංචි කිරීම් කටයුතු ද ඇතුලත් වේ.

වගුව 2.5 පොම්පාගාරය II හි උප ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘති ක්‍රියාකාරකම්	2025
පොම්පාගාරය II ඉදිකිරීම (20 m^3/s)	75%
පොම්ප අංක 1 හා 2 සවි කිරීම(10 m3/s)	100%
කසළ පෙරණය 1 හා 2 සවි කිරීම	100%
පොම්ප අංක 3 හා 4 සවි කිරීම (10 m3/s)	0%
ප්‍රවාහන ඇළ මාර්ග හැරීම සහ පිරිසිදු කිරීම	70%
කසළ පෙරණය 3 හා 4 සවි කිරීම	30%
වැව් කැණීම්, සහ ඇළ මාර්ග වැඩිදියුණු කිරීම	100%
මීගහවත්ත මාර්ගයේ 15m පාලම් 02ක් ඉදිකිරීම.	40%
පොම්පාගාර, වැව් සහ ඇළ මාර්ග නඩත්තු කටයුතු	සිදුකරමින් පවතී

එමෙන්ම 15m3 /S ධාරිතාවයක් ඇති අනෙක් පොම්පාගාරයේ වැඩ කටයුතු ජපන් රජයේ ආධාර ඇතිව 2026 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කොට ඇත. 2018 වර්ෂයේ ආරම්භකල මෙම

ව්‍යාපෘතියේ 2025 වසර අවසාන වනවිට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මි 2,426.89 ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 76.4% කි.

2.4.1.6 කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

කොළොන්නාව වැසිජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අයත් ජල පෝෂක ප්‍රදේශය 17 km^2 ක් පමණ භූමියකින් සමන්විත වන අතර කැළණි ගඟේ වම් ඉවුරේ පිටාර තැන්න තුළ පිහිටා ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සෘජුවම කැළණි ගඟ හා සම්බන්ධ වන කිත්තම්පහුව ඇළහි ද්විතීයික ඇළ මාර්ග වන පස්සන්න ඇළ සහ දහම්වෙල ඇළ සහ අනෙකුත් ප්‍රධාන ඇළ මාර්ග වන සැළලිහිණි මාවත ඇළ සහ දඩුතොට ඇළ සහ ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාල සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී. තවදුරටත් සැළලිහිණි මාවත ඇළ සහ දඩුතොට ඇළ සඳහා පොම්පාගාර දෙක ද ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. ඉහත ඇළ මාර්ගවලට අයත් ද්විතියික හා තෘතීයික ඇළ මාර්ගවල ඉංජිනේරුමය සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. තවද සම්පූර්ණ ව්‍යාපෘතියේ දත්ත එකතු කිරීම සහ තාක්ෂණික සැලසුම් සකස් කිරීම 95% ක් අවසන් කර ඇත.

දැනට දහම්වෙල ඇළ මාර්ගයේ වෙන්නවත්ත, වීරමල් මාවත හා මහබුත්ගමුව බෝක්කු, පස්සන්න ඇළ මාර්ගයේ මජීඩියාවත්ත, කොරටුව, බෝපැත්ත හා මානික්කමුල්ල යන බෝක්කු සහ සැළලිහිණි මාවත ඇළ මාර්ගයේ මල්ගම, සැළලිහිණි මාවත හා රන්වල පාර යන බෝක්කුවල ඉදිකිරීම් අවසන් කර ඇති අතර, තුප්පාවෙල හා විවේකාරාම මාවත වැසිජල රැඳවුම් තටාකවලද ඉදිකිරීම් අවසන් කර ඇත. මුළු ව්‍යාපෘති ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 10,630.00 ක් වේ. 2018 වර්ෂයේ ආරම්භකල මෙම ව්‍යාපෘතියේ 2025 වසර අවසාන වනවිට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මි 1,623.35 ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 18.38%

2.4.1.7 වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2013 අප්‍රේල් මස ආරම්භ කර 2022 වර්ෂය අගභාගයේ නිම කර ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් ලබාගත් ණය මුදලක් මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඊට අදාළ අදාළ ණය වාරික හා පොලිය 2025.12.31 වන විට ගෙවා නිම කර ඇත.

විශේෂ ජයග්‍රහණ

- ‘‘දිටිවා’’ සුළි කුණාටුව හේතුවෙන් කොළඹ නගරයට ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් අවම කරගැනීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව විසින් සියලුම ජල පොම්පාගාර පැය 24ක් පුරාවට අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. එම ක්‍රියාමාර්ගය හරහා කොළඹ ප්‍රදේශයට සිදුවිය හැකි හානි සැලකිය යුතු ලෙස අවම කරගැනීමට හැකි විය.

අභියෝග

- සේවායෝජක ව්‍යාපෘති ලබාගැනීමේ අපහසුතාවය.
- සුදුසුකම් සහ පළපුරුදු වෘතිකයන් සංස්ථාව අතහැර යෑම.
- ඉහළ නිෂ්පාදනයක් පැවතුනද, කෙරවලපිටිය කසල කළමනාකරණ අංගනයෙහි නිෂ්පාදිත කොම්පෝස්ට් සඳහා අඩු ඉල්ලුමක් පැවතීම.

- වැසි ජල පොම්පාගාරවල සේවය කරන තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය නොලැබීම.
- කොලොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු වලදී ඇති වන ප්‍රමාද වීම.
- සංස්ථා පනතේ ඇති අඩුපාඩු හේතුවෙන් නීති විරෝධී ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීමට අපහසු වීම.

ඉදිරි ඉලක්ක

- දැනට වැඩ කටයුතු ආරම්භ කර ඇති ඔලියමුල්ල ව්‍යාපෘතිය, කොළොන්නාව ව්‍යාපෘති වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතින් හැකි ඉක්මනින් වැඩ අවසන් කර එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීම.
- දැනට සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකරමින් පවතින වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතින්හි අදාළ සැලසුම් හා නිර්මාණ හැකි ඉක්මනින් වැඩ අවසන් කර ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.
- දැනට ඉදිකරමින් පවතින හා ඉදිකර ඇති තෙත්බිම් උද්‍යාන , පරිසර පද්ධතියට බාධාවක් නොවන පරිදි ප්‍රජාවගේ සහභාගීත්වයෙන් නඩත්තු කිරීම.
- අධික වර්ෂාපතන තත්වයේදී පොම්පාගාර ක්‍රියාත්මක කරවා ගංවතුර ආපදා තත්වයන් අවම කිරීම සඳහා ජල පොම්පාගාර නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම.

2.4.2 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

2.4.2.1 අනුරාධපුර මහනගර සභා සීමාව තුළ නිරසර ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

2025 අයවැය කතාවේ අයවැය යෝජනාවක් ලෙස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් අනුරාධපුර නගරයේ වැඩිවන ජනගහනය සහ දේශීය හා විදේශීය සංචාරකයන්ගේ පැමිණීම නිසා උත්පාදන වන අපද්‍රව්‍ය මෙන්ම අනුරාධපුර මූලික රෝහලේ සහ සාමාන්‍ය රෝහල්වල අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලි. 750ක් වන අතර 2025 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 25.79කි.

2.4.2.1 කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 98.89% ක් වේ.

විශේෂ ජයග්‍රහණ

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ව්‍යාපෘතියේ ඉදිරි මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයකු තෝරා ගැනීමේ කටයුතු අවසන් කල අතර අදාළ පෞද්ගලික ආයෝජකයා, වෙත ව්‍යාපෘතිය පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මේ වන විට ඉදිරිපත් කර ඇත.
- කැලණිය කසල හුවමාරු මධ්‍යස්ථානයේ ඇති ස්ථාවර සම්පිණ්ඩකවල වැරදි නිවැරදි කිරීම හැර ව්‍යාපෘතියේ සියලුම ඉදිකිරීම් කටයුතු 2025 වසරේ දී අවසන් කරන ලදී.

අභියෝග

- ව්‍යාපෘතියේ අරුවක්කාලු වැසි ජල කළමනාකරණ සැලැස්මට අනුව ඉදි කරන ලද ජල පොකුණෙහි පිටාර ජලය ගලා යාම සඳහා යෝජිත ඇළ මාර්ගය ඉදි කිරීමට අත්‍යවශ්‍ය වන අතර මහජන විරෝධය හේතුවෙන් එය දැනට නවතා දමා ඇත.

ඉදිරි ඉලක්ක

- තෝරා ගත් මෙහෙයුම්කරුට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු පැවරීම.
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.
- පුත්තලම සිට අරුවක්කාලු දක්වා දුම්රිය මාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම.
- කසල ප්‍රවාහනය සඳහා දුම්රිය ප්‍රවාහන ගැල් 17ක් මිලදී ගැනීම

2.5 ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන

2.5.1 දිවයින පුරා තෝරාගත් ප්‍රදේශවල සංචාරක ආකර්ෂනයක් ඇති ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නව වැසිකිළි පද්ධති ඉදිකිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

දිවයින පුරා තෝරාගත් ප්‍රදේශවල සංචාරක ආකර්ශනයක් සහිත ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නව වැසිකිළි පද්ධති ඉදිකිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ‘‘ක්ලීන් ශ්‍රී ලංකා’’ වැඩසටහන මගින් නාගරික සංවර්ධන විෂයපථය යටතේ ක්‍රියාත්මක වන නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2025 වර්ෂය සඳහා රු.මිලි. 525.29ක ප්‍රතිපාදන හිමි විය.

මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 20ක් ක්‍රියාත්මක කරන ලද අතර 2025 දෙසැම්බර් 31වන විට සමස්ත භෞතික ප්‍රගතිය 35%ක් හා සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 55.52ක් වේ.

2.5.2 බස්නාහිර පළාතේ ජලාශ හා ජල මාර්ග පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම

ඝන අපද්‍රව්‍ය සහ අපජලය ඇල මාර්ගවලට බැහැර කිරීම විශාල පාරිසරික හා සමාජීය ගැටළුවක් වී ඇත. ජලයෙන් කසළ එකතු කිරීම ඉතා අපහසු වන අතර, එය ජල මාර්ගයට සහ ඒවායේ ජෛව විවිධත්වයට හානිදායක වන අතර නඩත්තු හා පිරිසිදු කිරීම් වියදම ද අධික වේ.

කොළඹ නගරය ආශ්‍රිතව අදාල පළාත් පාලන ආයතනයන් මගින් නඩත්තු කරනු ලබන ද්විතියික හා තෘතියික කාණ්ඩයේ ඇළ මාර්ගද පවතී. තවද කිසිදු ආයතනයක් මගින් නඩත්තු කටයුතු සිදුනොකරනු ලබන ඇළ මාර්ග බොහොමයක් කොළඹ හා ජනාකීර්ණ ප්‍රදේශ වල පිහිටා ඇති අතර වැසි වතුර කළමනාකරණය සඳහා මෙම ඇළ මාර්ග පිරිසිදු කිරීම වැදගත් වේ.

ඒ අනුව, ‘‘ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන’’ යටතේ ව්‍යාපෘති 3ක් නිම වෙමින් පවතින අතර එමගින් අනෙකුත් පළාත් පාලන ආයතන සමග එක්ව මෙම ඇළ මාර්ග තිරසර ලෙස නඩත්තු කිරීමටත් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන මගින් ඇළ මාර්ග වෙත කුණු කසල බැහැර කිරීම අවම කිරීමත් මෙමගින් සිදුවේ. 2025 වර්ෂය සඳහා රු.මිලි. 118.00ක ප්‍රතිපාදන හිමි වූ මෙම වැඩසටහනේ සමස්ත භෞතික ප්‍රගතිය 69%ක් හා සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 83.83ක් වේ.

2.6 අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශයේ එක් එක් අංශයන්හි **2025** වසර තුල ප්‍රගතිය

2.6.1 සාමාන්‍ය පාලන කටයුතු

- **පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය**

පූර්වගාමීව පැවති නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය යටතේ සේවය කරන ලද නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ රාජකාරි වන, ස්ථාන මාරු කිරීම, වැඩ බැලීමට පත් කිරීම හා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීම යන කාර්යයන් ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

එනමුත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ සේවය ස්ථීර කිරීම, උසස් කිරීම හා වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම ආදී කටයුතු සිදු කිරීම ප්‍රමාද වී තිබෙන බව නිරීක්ෂණය වේ. අනෙකුත් සේවාවල නිලධාරීන්ගේ සේවය ස්ථීර කිරීම, උසස් කිරීම හා වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

- **මූල්‍ය කළමනාකරණය**

අමාත්‍යාංශයේ ලේකම් විසින් මු. රෙ. 135 යටතේ පවරන ලද බලතල ප්‍රකාරව පාලන අංශය යටතේ ලැබෙන සියළුම වියදම්, එනම් ගෙවීම් වවුචර්, ආපදා ණය/ විශේෂ අත්තිකාරම් ඉල්ලීම් හා සුළු මුදල් අග්‍රිම ඉල්ලීම්වලට අදාල ගෙවීම්වල නිරවද්‍ය බව පරීක්ෂා කර අනුමැතිය හා නිර්දේශ ලබාදීම ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

එනමුත් සෙත්සිරිපාය අදියර 1 හි 5 වන මහලෙන් අමාත්‍යාංශය සඳහා ලබා ගෙන තිබෙන පරිශ්‍රයට අදාලව ගිවිසුම නිසි පරිදි සකස් කර ඉදිරිපත් නොකිරීම මත 2025 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා කුලී මුදල් ගෙවා නොමැත.

- **අමාත්‍ය මණ්ඩල සංදේශ**

2025 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල සංදේශ 123 ක් ඉදිරිපත් කර තිබෙන අතර ඉන් 120 ක කටයුතු අවසන් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ. ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ 07 ක් ද ඉදිරිපත් කර තිබෙන අතර අමාත්‍ය මණ්ඩල සංදේශ 41 ක් සඳහා අමාත්‍යාංශයේ නිරීක්ෂණ ඉල්ලා තිබුණි. එම සියළු නිරීක්ෂණ ලබා දී ඇත.

- **අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්යසාධන වාර්තා හා වාර්ෂික වාර්තා - 2025**

පූර්වගාමී නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයට අනුබද්ධව පැවති ආයතන 04 ක් විසින් වාර්ෂික වාර්තා/ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර තිබෙන අතර එම වාර්තා සියල්ල සභාගත කිරීමට කිරීමට පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම**

2025 වර්ෂයේ දී අමාත්‍යාංශයට ලද පුහුණුවීම් සඳහා මාණ්ඩලික නිලධාරීන් 10 ක් සහ අනෙකුත් නිලධාරීන් 21 ක් දේශීය පුහුණු සඳහා යොමු කර ඇත. 2025 වර්ෂයේ දී නිලධාරීන් 31 ක් විදේශීය පුහුණු සහ සම්මන්ත්‍රණ සඳහා යොමු කර ඇත.

- **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

2025 වර්ෂයේ දී පාලන අංශය වෙත ලැබී තිබෙන මහජන ඉල්ලීම් ලිපි සංඛ්‍යාව 245 ක් වන අතර එම ලිපි පහත පරිදි වර්ග කළ හැකිය.

- ජනාධිපති කාර්යාලය - 151
- අග්‍රාමාත්‍ය කාර්යාලය - 85
- වෙනත් - 02

එම ලිපිවල සඳහන් ඉල්ලීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාල අමාත්‍යාංශයේ අංශ හා අනුබද්ධිත ආයතන වෙත යොමු කර ඇත.

- **තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම**

2025 වර්ෂයේ දී තොරතුරු දැනගැනීමේ පනතට අදාල ඉල්ලීම් 16 ක් ඉදිරිපත් වී තිබෙන අතර ඉල්ලීම් 14 ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පිළිතුරු යොමු කර ඇත. අනෙක් ඉල්ලීම් දෙක, එම තොරතුරු පවතින ආයතන වෙත යොමු කර තිබේ.

2.6.2 අධීක්ෂණය හා ඇගයීම

- **ප්‍රගති වාර්තාකරණය**

ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය වශයෙන්ද ජාතික විගණන උප කාර්යාලය සහ අමාත්‍යාංශයේ විගණන අංශය, මූල්‍ය අංශය ඇතුළු අනෙකුත් අංශ වෙත මාසිකවද අවස්ථානුකූලව ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය යනාදී ආයතනවලටද අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රගතිය අවශ්‍ය පරිදි වාර්තා කරන ලදී.

එමෙන්ම, අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව, 2024 සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. අයවැය විවාදය සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව - 2025 සඳහා නාගරික සංවර්ධන අංශයේ ප්‍රගතිය සකස් කර නියමිත දිනට මහාමාර්ග අංශය වෙත යාමු කරන ලදී.

- **ප්‍රගති සමාලෝචන රැස්වීම්**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා විෂයභාර අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් නාගරික සංවර්ධන අංශය යටතේ අධීක්ෂණය කරනු ලබන ආයතන වන, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 07ක් සංවිධානය කරන ලදී.

- **වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම**

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2025 වර්ෂය සඳහා ද අමාත්‍යාංශයේ අනුබද්ධිත ආයතනවලට සහ

ව්‍යාපෘතිවලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම නියමිත පරිදි ඉදිරිපත් කර අනුමැතිය ලබාදීමට කටයුතු කර ඇත.

- **ව්‍යාපෘති යෝජනා ඇගයීම**

නාගරික සංවර්ධන විෂය පථය යටතේ ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා සඳහා 2025 වසර තුල ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටු රැස්වීම් 13 ක් පවත්වන ලදී. එහි ප්‍රගතිය පහත පරිදි දක්වා ඇත.

වගුව 2.6 ව්‍යාපෘති යෝජනා ඇගයීමේ ප්‍රගතිය

ආයතනය	ව්‍යාපෘති යෝජනා ගණන			
	කමිටුව වෙත ලද	කමිටුව විසින් නිර්දේශ කල	අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතියට යොමු කල	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ
නාගරික සංවර්ධන අධිකාරිය	63	29	2	27
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	23	21	16	05
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	05	-	-	-
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය	02	01	-	01
එකතුව	93	51	18	33

2.6.3 අභ්‍යන්තර විගණනය

2025 වර්ෂයේ දී මූලික විගණන වාර්තාව සහ කාර්තු විගණන වාර්තා 04 ඉදිරිපත්කර ඇති අතර අමාත්‍යාංශ මට්ටමින්, අමාත්‍යාංශය හා සම්බන්ධිත ආයතන වෙනුවෙන් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 04 ක් ද ව්‍යාපෘති සඳහා චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 02 ක් ද පවත්වා තිබේ. එමෙන්ම. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සඳහා සාමාජිකයෙකු/ නිරීක්ෂකයෙකු ලෙස අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස සහභාගීවීම ද සිදුකර ඇත. පරිපාලිත සමාගම් 05 ක විගණන කමිටු කටයුතු සක්‍රිය කිරීමට ද පියවර ගෙන ඇත. 2025.12.31 වන විට විගණන විමසුම් 08 ක කටයුතු අවසන් කර ඇත. අනුබද්ධිත ආයතනයන් හි විමර්ශණ 09 ක් අවසන් කර ඇත.

2026 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සඳහා වැඩි ඉඩක් ලබාගැනීමටත් විමර්ශන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉටු කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් විධිමත් පරිදි පැවැත්වීමටත්, පරිපාලිත සමාගම්වල පවතින විගණන කමිටු තවදුරටත් සක්‍රීය හා විධිමත් කිරීමටත් පියවර ගැනීමට අපේක්ෂා කෙරේ.

2.6.4 මූල්‍ය පරිපාලනය

මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් 2025 මුදල් වර්ෂය සඳහා පහත කාර්යභාරයන් ඉටුකර ඇත.

- මුදල් වර්ෂය ආරම්භයේදීම මු.රෙ. 135-139 බලතල පැවරීම් සකස් කර, සංශෝධන ආදී අදාළ යාවත්කාලීන කිරීම් සිදුකර ඇත. ගිණුම් අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කර්තව්‍යයක් ලෙස වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස්කර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ කටයුතු සිදුකර ඇති අතර, අයවැය සමාලෝචන කටයුතු, ප්‍රතිපාදන භාවිතය පිළිබඳ ප්‍රගතිය සොයා බලා අවශ්‍ය සංශෝධන ද සිදුකර ඇත.
- 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කර ඇති මුළු ප්‍රතිපාදන රු.99, 974,000,000ක් දක්වා ඇති අතර, එය වැඩසටහන් අංක (1) සහ (2) යටතේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස වෙන්කර ඇති ආකාරය පහත දක්වා ඇත.

වගුව 2.7 2025 වසර සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති ආකාරය

වැඩසටහන් අංකය	ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන	
		මුල් ප්‍රතිපාදන	සංශෝධිත ප්‍රතිපාදන
වැඩසටහන (1)	පුනරාවර්තන	1,275,000,000	1,247,138,000
	ප්‍රාග්ධන	86,000,000	113,862,000
එකතුව		1,361,000,000	1,361,000,000
වැඩසටහන (2)	පුනරාවර්තන	360,000,000	360,000,000
	ප්‍රාග්ධන	98,253,000,000	86,253,000,000
එකතුව		98,613,000,000	86,613,000,000
මුළු එකතුව		**99,974,000,000**	**87,974,000,000**

- ඒ අනුව, ඉහත අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයට අදාළව අග්‍රිම සීමා වාර්තා සකස් කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. එසේම, මාසික අක්මුදල් ප්‍රවෝකථන වාර්තා සකස් කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. එමෙන්ම, හිඟ බිල්පත් වාර්තා මාසිකව සකස් කිරීම, අග්‍රිම ගිණුම් සැසඳීම සහ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා වරින් වර කරන ලද ඉල්ලීම්වලට අදාළව උප අග්‍රිම නිකුත් කර එම ව්‍යාපෘතීන්හි වියදම් වාර්තා මාසිකව සැසඳීමේ කටයුතු ද මේ අතර වේ.
- වැටුප් සැකසීමේ මෘදුකාංගය හරහා වැටුප් සකස් කර ඇති අතර, ඊට අදාළ සියළු කටයුතු සිදුකරමින් වැටුප් ලෙජරය යාවත්කාලීන කර ඇත. මෙහිදී, 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සේවක ප්‍රමාණය ලෙස නිළධාරීන් 231ක වැටුප් සකස් කර ගෙවා ඇත. අමාත්‍යාංශයේ නිළධාරීන් 186ක් සඳහා අත්තිකාරම් බී ගිණුම්වලට අදාළ ලෙජරය යාවත්කාලීන කර ඇති අතර, 2025 වර්ෂය සඳහා රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සකස් කර ඇත.
- 2025 වර්ෂය සඳහා භාණ්ඩ සහ සේවා මිලදීගැනීම් සඳහා අදාළ සියලුම කටයුතු නිසිපරිදි සිදුකර ඇත. ගබඩා කටයුතු ක්‍රමවත්ව සිදුකර ඇති අතර, නිළධාරීන් 30කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල 11ක් පත්කර භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසිපරිදි සිදුකෙරිණි.

- 2025 මුදල් වර්ෂය තුළ ගිණුම් අංශය වෙත යොමු කළ සියළුම වවුචර්පත් සඳහා අදාළ ප්‍රතිපාදන සීමාවන් ඇතුළත ගෙවීම් කටයුතු සිදුකර ඇත. මෙහිදී සියළුම වවුචර්පත් සඳහා බොහෝවිට දිනපතා 'ITMIS System' හරහා මුදල් ඉල්ලුම් කර ඇත. එමෙන්ම, නිසි පරිදි මුදල් පොත සහ සරප් අංශයේ කටයුතු පවත්වාගෙන ගොස් ඇත. ඒ අනුව, බැංකු සැසඳුම් වාර්තා මාසිකව සකස් කර ඇත. මාසික මූල්‍ය ප්‍රගති වාර්තා සකස්කිරීමේදී ප්‍රාග්ධන වියදම්වල මූල්‍ය ප්‍රගතිය මාසිකව, කාර්තුමය ආදී වශයෙන් ඉදිරිපත් කර ඇත. එමෙන්ම, ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සමාලෝචන කටයුතු ද නිසියාකාරව සිදුකර ඇත.
- පොදු තැන්පත් ගිණුම් පවත්වාගෙන යාමේදී අවසාන ගිණුම් සකස්කිරීම සඳහා පොදු තැන්පතු සැසඳීම් කටයුතු සිදුකර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර, භාණ්ඩාගාර පොත් සමග සැසඳීම් සිදුකරමින් අදාළ වාර්තා මාසිකව ඉදිරිපත් කර ඇත.
- තවද, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම නිසි ආකෘතීන්ට අනුකූලව සකස්කිරීම, අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන සම්බන්ධව වෙන් වෙන් වශයෙන් ප්‍රසම්පාදන කමිටු පත්කිරීම, වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන සකස්කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ද ඉටුකර ඇත.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල වාර්ෂික ගිණුම් පිළිබඳව, අදාළ ව්‍යාපෘති ද සම්බන්ධීකරණය කර ගනිමින් වාර්ෂික ගිණුම් විගණනයට ඉදිරිපත් කර ඇත. මීට අමතරව, මෙම වර්ෂයේ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ විගණන විමසුම් සංඛ්‍යාව 27ක් වන අතර අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව 06ක් වේ. මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

2.6.5 නාගරික සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය

නාගරික සංවර්ධන (ඉංජිනේරු) අංශය විසින් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන 2025, සංචාරක ප්‍රවර්ධනය සහ නගර සන්නාමකරණ වැඩසටහන, කසල කළමනාකරණ ව්‍යාපෘති, සියක් නගර සංවර්ධන වැඩසටහන, පළාත් නවය සංවර්ධන වැඩසටහන, සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය ව්‍යාපෘතින්හි ව්‍යාපෘති නියමිත කාල සීමාවන්හි වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුලත අවශ්‍ය තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව නිම කිරීම, සහතික කිරීම, ඉදිකිරීම් ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, තාක්ෂණික උපදේශන සැපයීම, බිල්පත් සහතික කිරීම සහ කොන්ත්‍රාත් ගැටළු විසඳීම සිදු කර ඇත.

එසේම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු නිරාකරණය සහ අදාළ කටයුතු කිරීම සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරුණු ලබන සංවර්ධන සැලසුම් සම්බන්ධීකරණ කටයුතු, නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරනු ලබන නාගරික සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු, නාගරික සංවර්ධනයට අදාල නීති හා රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු, අනවසර ඉදිකිරීම් සම්බන්ධව අමාත්‍යාංශය වෙත යොමු කරන මහජන පැමිණිලි සම්බන්ධීකරණ කටයුතු, නාගරික සංවර්ධන කටයුතු සිදුකිරීමේදී වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ආදිය 2025 වසර තුල මෙම අංශය මගින් සිදු කර ඇත.

2.6.6 තාක්ෂණික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය

වාර්තා කාලය තුළ, තාක්ෂණික අංශය විසින් කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන ක්‍රියාදාමයන් සඳහා පහසුකම් සැලසීම, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ පවරන ලද ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා ගිවිසුම් පරිපාලන කටයුතු සිදු කිරීම තුළින් අමාත්‍යාංශයේ කාර්යසාධනයට සෘජු දායකත්වයක් ලබා දී ඇත. තවද, පරිසර

ආරක්ෂණයට අදාළව අමාත්‍යාංශයට පවරන ලද රාජකාරි සහ අනෙකුත් කටයුතු නිවැරදිව සිදු කර ඇත.

- **කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම**

තාක්ෂණික අංශයේ ප්‍රධාන කාර්යයක් වන්නේ ප්‍රසම්පාදන කමිටු හරහා කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන ක්‍රියාදාමයන් පහසුකම් සැලසීමයි. එහි ප්‍රගතිය පහත පරිදි වේ. ඒ අනුව, 2025 වසර තුළ සක්‍රීය ව්‍යාපෘති 41කින් 04ක් ප්‍රදානය කරන ලදී.

වගුව 2.8 කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන කමිටු ප්‍රගතිය

කමිටුව	කමිටු පැවැත්වූ වාර ගණන	ව්‍යාපෘති ගණන
ඉහල මට්ටමේ අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා සම්මුති කමිටුව	08	22
ඉහල මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු- නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් බැහැර කිරීම සඳහා	06	07
අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා සම්මුති කමිටුව	09	01
අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන උපදේශන කමිටුව	09	02
ඉහල මට්ටමේ අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන කමිටු	01	02
ඉහල මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු	06	07
එකතුව	**39**	**41**

තාක්ෂණික අංශය විසින් මුදල් අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් ප්‍රසම්පාදන ක්‍රියාදාමයන්ට සහාය වීම සඳහා **ව්‍යාපෘති කමිටුව** සහ **ලංසු ඇගයීමේ කමිටු** පත් කිරීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය පහසුකම් සැලසීම තුලින් කාලෝචිත, විනිවිදභාවයෙන් යුත් සහ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල තාක්ෂණික ඇගයීම් සිදු කිරීම සුරක්ෂිත කර ඇත.

එමෙන්ම, සියලු කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන සඳහා **ප්‍රසම්පාදන කාල සටහන** නිරීක්ෂණය කරමින්, ගිවිසුම් ප්‍රදානය සහ ව්‍යාපෘති ආරම්භය ප්‍රමාද නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. එසේම අදාළ කමිටු නිර්දේශ මත ගිවිසුම් ප්‍රදානය සඳහා **අමාත්‍ය මණ්ඩල අනුමැතිය** ලබා ගැනීමේ ක්‍රියාවලියද මෙම අංශය විසින් පහසුකම් සපයා ඇත.

- **ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා තාක්ෂණික අධීක්ෂණය සහ සම්බන්ධීකරණය**

අමාත්‍යාංශය වෙනුවෙන් තාක්ෂණික අංශය විසින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන්, තාක්ෂණික මග පෙන්වීම, නිරීක්ෂණය සහ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කර ඇති අතර ඒ සඳහා බාහිර ආයතන සමග සම්බන්ධීකරණය, ව්‍යාපෘති පාර්ශ්වකරුවන් සමග හමුවීම් සඳහා පහසුකම් සැලසීම සහ ව්‍යාපෘති අනුමත කාලසටහන් තුළ නිම කිරීම සඳහා අඛණ්ඩ නිරීක්ෂණය යනාදි කාර්යයන්ද ඇතුළත් වේ.

එසේම, දේශීය අරමුදල් භාවිතයෙන් සිදු කරන කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණය, සම්බන්ධීකරණය සහ ගෙවීම් නිර්දේශ කිරීම සිදු කරමින්, මහජන මුදල් නිසි ලෙස භාවිතා වන බව තහවුරු කර ඇත. ඒ අනුව, 2025 වසර සඳහා 123 වැය ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සඳහා රු. බි. 3.85ක් වෙන් කර තිබූ අතර රු. බි.3.14ක ප්‍රගතියක් ලබාගැනීමට හැකියාව ලැබී ඇත. තවද, Clean Sri Lanka වැඩසටහන යටතේ රු. මි. 117.9ක් 2025 වසරේ වෙන් කර තිබූ අතර රු.මි. 83.8 ක ප්‍රගතියක් ලභා කරගැනීමට සමත් විය.

- **පින්නවල – කිතුල්ගල සංචාරක තීරය සංවර්ධන ව්‍යාපෘතියේ ගිවිසුම් පරිපාලනය**

තාක්ෂණික අංශය විසින් පින්නවල – කිතුල්ගල සංචාරක තීරය සංවර්ධන ව්‍යාපෘතියේ, සමස්ත සම්බන්ධීකරණය, ගිවිසුම් පරිපාලනය සහ ව්‍යාපෘති කාල සීමාව තුල තාක්ෂණික අධීක්ෂණය ඇතුළුව ගිවිසුමේ සේවායෝජකයාගේ සියලු වගකීම් ඉටු කර ඇත.

තවද, තාක්ෂණ අංශය විසින් උපදේශකයින් සහ ක්‍රියාත්මක ආයතන සමග සමීපව කටයුතු කරමින්, ගිවිසුම් කොන්දේසි, තාක්ෂණික පිරිවිතර සහ අනුමත කාලසටහන් පිළිපැදීම තහවුරු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයේදී රු.මි. 124,028 (බදු ඇතුලත්ව) මුදලක් වෙන්කර තිබූ අතර එම වර්ෂයේදී රු.මි. 60,66 (බදු ඇතුලත්ව) ක මුදලක් වැය කරන ලදී.

- **පරිසර ආරක්ෂණය සම්බන්ධව ඉටු කල කර්තව්‍යයන්**
    - දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් 2025 ලෝක පරිසර දිනය ''ප්ලාස්ටික් දූෂණය අවම කිරීම'' යන ගෝලීය තේමාව යටතේ සැමරීම සඳහා කටයුතු සංවිධානය කල අතර මෙමගින් ගෝලීය වශයෙන් ප්ලාස්ටික් මගින් සිදුවන දූෂණයට අවසන් විසඳුමක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ප්ලාස්ටික් දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා සාමූහික ක්‍රියාමාර්ගයකට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී.

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ පරිසර කුළුණ යටතේ පරිසරයට ආදරය කරන සමාජයක් බිහිකිරීමේ එක් පියවරක් ලෙස ලෝක පරිසර දිනයේ තේමාව හා එක්වෙමින් පරිසරය හා මානව සෞඛ්‍යය දැඩි ලෙස තර්ජනයට ලක් කර ඇති ප්ලාස්ටික් භාවිතය හා අනිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. ප්ලාස්ටික් භාවිතා කිරීමෙන් සිදුවන හානි පිළිබඳව හා ප්ලාස්ටික් වෙනුවට යොදා ගත හැකි විකල්ප පිළිබඳ දැනුවත් කිරීම හා ජීවන රටාවේ වෙනසක් ඇති කරමින් ප්ලාස්ටික් භාවිතය පිළිබඳ නැවත සිතීම, ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම, නැවත භාවිතා කිරීම, සහ ප්‍රතිචක්‍රීකරණය යන සංකල්ප ක්‍රියාත්මක කිරීම පිළිබඳ වෛද්‍ය සජිත් එදිරිසිංහ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ සායනික ජාන විද්‍යාඥ) මගින් දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල නිලධාරීන් 500ක පමණ සහභාගීත්වයෙන් 2025.06.30 දින ක්‍රියාත්මක කරන ලදී.

    - ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනට අදාලව නාගරික ඇලිවෙලි පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

ජගත් පරිසර දිනයට සමගාමීව ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනටද අනුගත වෙමින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් ක්‍රියාත්මක කරන ''නාගරික ඇලි-වෙලි පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියේ'' ආරම්භය සහ පරිසරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන 2025.05.30 දින ගරු නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් සෙත්සිරිපාය හා සුහුරුපාය පරිශ්‍ර ඉදිරිපිටදී පැවැත්විණි.

2.6.7 සමස්ත නාගරික සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය

අමාත්‍යාංශය යටතේ පවතින පහත සඳහන් ආයතනවල ආයතනික සහ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- නාගරික සංවර්ධන අධිකාරිය
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි

- දේශීය/ විදේශීය නිවාඩු සම්බන්ධයෙන් ආයතන මගින් සංවර්ධන අංශය වෙත යොමු කරන ලද, නිලධාරීන් 50 දෙනෙකුගේ දේශීය විදේශීය නිවාඩු ඉල්ලීම් පත්‍ර අනුමැතිය සඳහා පාලන අංශය වෙත යොමු කරන ලද අතර එම අනුමැතිය පසු අදාල ආයතනය වෙත දන්වා යවන ලදී. විදේශීය පුහුණු සම්බන්ධයෙන් ආයතන මගින් විදේශීය පුහුණු සඳහා නම් කර එවන ලද නිලධාරීන් 60 දෙනෙකුගේ නම් අනුමැතිය සඳහා පාලන අංශය වෙත යොමු කර ඇත.
- වාහන බලපත්‍ර සම්බන්ධයෙන් ආයතනවල මාණ්ඩලික නිලධාරීන් 30 දෙනෙකු සඳහා සහනදායී පදනම මත වාහන බලපත්‍ර නිකුත් කිරීමට අදාල කටයුතු සිදු කරන ලදී.
- ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මහජන නියෝජිතයින් මගින් සහ මහජනතාව විසින් යොමු කළ, ආයතනවල කටයුතු පිළිබඳ මහජන පැමිණිලි 360ක රාජකාරී කටයුතු සිදු කර ඇත.
- අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් ආයතන මගින් ලැබෙන අමාත්‍ය මණ්ඩල කෙටුම්පත් 300 ක් අප අංශය මගින් පාලන අංශය වෙත යොමු කළ අතර අමාත්‍ය මණ්ඩල තීරණ 300 ක් අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.
- ආයතනවල විගණන විමසුම් 50ක් ලැබුණු අතර එම තොරතුරුවලට අදාල පිළිතුරු සපයන ලදී.
- තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ පනතට අදාල ඉල්ලීම් 50ක් ලැබුණු අතර ඒ සම්බන්ධ තොරතුරු ආයතන මගින් ලබා ගෙන එම තොරතුරු ඉල්ලුම්කරුවන් වෙත යොමු කර ඇත. ආංශික අධීක්ෂණ කාරක සභාව, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු පාලන අංශය වෙත යොමු කර ඇත. අමාත්‍යාංශය යටතේ පවතින අනුබද්ධිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් සහ ඊට අදාල වන සියලුම රාජකාරී කටයුතු සිදු කර ඇත.
- රජයේ ප්‍රතිපත්තීන්ට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ඉහත ආයතන මගින් සිදුකරනු ලබන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. සුපරීක්ෂණයට අදාලව ඉටු කළ යුතු සියලුම කටයුතු ඉටු කර ඇත.
- සංවර්ධන අංශයේ නිලධාරීන්ට සහ අනුබද්ධිත ආයතන වෙත නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව යෝජනා ඉදිරිපත් කර ඇත.

2.6.8 මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2025 වර්ෂයේදී ව්‍යාපෘති අංශය මගින් දේශීය හා විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යාපෘති 6කට අදාලව පහත සඳහන් කාර්යභාර්යන් සිදු කර ඇත.

ව්‍යාපෘති අංශය යටතේ මෙහෙයවනු ලබන ව්‍යාපෘති

- කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය සඳහා සහාය ව්‍යාපෘතිය
- අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- චීන ආධාර නිවාස ව්‍යාපෘතිය
- ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය
- තිරසර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
- ඒකාබද්ධ කලාපීය සංවර්ධන සැලැස්ම ව්‍යාපෘතියෙ

- **ව්‍යාපෘතිය හඳුනාගැනීම**

○ ව්‍යාපෘතිය සඳහා දායකත්වය දක්වන පාර්ශවකරුවන් මගින් අවශ්‍ය උපදස් ලබා ගැනීම (රාජ්‍ය ආයතන, දේශපාලනික අධිකාරී, පෞද්ගලික ආයතන).

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

- ව්‍යාපෘතිය සඳහා විදේශීය මූල්‍ය ආධාර සපයන ආයතන හා දේශීය විශේෂඥයන් සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය පරිදි අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සහයෝගිතා උපදේශනයක් ලබා ගැනීම.

- **ව්‍යාපෘතිය සැලසුම් කිරීම හා ආරම්භ කිරීම**

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යෝජනාව සකස් කිරීම.
- ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු කැබිනට් පත්‍රිකා සකස් කිරීම.
- ව්‍යාපෘතිය සිදු කිරීමට නියමිත ප්‍රදේශය සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය ආයතන සමග සාකච්ඡා සිදු කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම - උදා : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව ආදී වශයෙනි.
- ව්‍යාපෘති කළමණාකරණ උපදේශනය සහ විදේශ මූල්‍ය ආධාර ආයතන මගින් විශේෂඥ කණ්ඩායම් ගෙන්වා ගැනීමට කටයුතු සූදානම් කිරීම.
- ව්‍යාපෘති කළමණාකරණ ඒකකයක් සකස් කිරීම සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටියේ සිට අවසන් කිරීම දක්වා සියළුම කටයුතු සිදු කිරීම.

- **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

- කොන්ත්‍රාත් ප්‍රදානය සහ කොන්ත්‍රාත් පරිපාලන සඳහා පහසුකම් සැලසීම.
- විදේශීය කාර්ය මණ්ඩලය සඳහා වීසා අනුමත කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීම.
- බදු සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, වෙළඳ හා නීරුබදු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය හා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
- බෙරුම්කරණය සම්බන්ධ කටයුතු සිදු කිරීම.

- **ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම**

- ජාතික මෙහෙයුම් කමිටු සංවිධානය සම්බන්ධීකරණය කිරීම හා පැවැත්වීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය සම්බන්ධීකරණය කිරීම හා පැවැත්වීම.
- ව්‍යාපෘතිය මෙහෙයවීමේ දී ඇතිවන ගැටලු පදනම් කරගත් රැස්වීම් පැවැත්වීම හා විසඳුම්වලට පැමිණීම.
- මාසික, කාර්තුමය හා වාර්ෂිකව ප්‍රගතිය වාර්තා කිරීම.
- ගිවිසුම්ගත නිරණ සම්බන්ධයෙන් පසු විපරම් සිදු කිරීම.

- **නිම කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.**

- මෙහෙයුම් යාන්ත්‍රණය හඳුනා ගැනීම.
- ක්‍රියාත්මක කිරීමේ ආයතනය, ක්‍රියාකරු, ප්‍රතිලාභියා හඳුනා ගැනීම.
- වත්කම් පවරා ගැනීමේ/භාර දීමේ ක්‍රියාවලිය සිදු කිරීම.

.....

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.කපිල සී.කේ. පෙරේරා
ලේකම්/ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය (ෆේසෝ II)
බත්තරමුල්ල

පරිච්ඡේදය 3

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය

ඇමුණුම 3.1 මගින් දක්වා ඇත.

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

3.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුවට		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ.	-	-	-	-	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		

3.7. මූ.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයතු ලෙස මෙම දෙපාර්තමේන්තුවලට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**31.12.2025** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2025** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 3.2 මගින් දක්වා ඇත.

පරිච්ඡේදය 4
කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැකැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුවේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
වැසිජල පාලන ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රගතිය		80%	
ප්‍රකාශිත නාගරික ප්‍රදේශ සඳහා සකස් කරන ලද සංවර්ධන සැලසුම් සංඛ්‍යාව	100%		
සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව	91%		
ගැසට් මගින් ප්‍රකාශයට පත්කරන ලද භූජාභූමි සංඛ්‍යාව			51%

පරිච්ඡේදය 5
තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
11/11.1	නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී නිවාස ඒකක 1,202 ක් ඉදිකිරීම.(කොළඹගේ මාවත,ටොරින්ටන් මාවත)	ඉදිකිරීම් කටයුතුවලට අදාළව කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද නිවාස සංකීර්ණ ගණන - 2			√
	නිවාස ඒකක 1996ක් පැලියගොඩ, දෙමටගොඩ, මොරටුව, මහරගම හා කොට්ටාව යන ප්‍රදේශ වල ඉදිකිරීම	නිමවුම් ප්‍රතිශතය - 70%		√	
	මධ්‍යම ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඒකක 1,890 ක් ලබා දීම.	නිමවුම් ප්‍රතිශතය - 64%		√	
11/11.3	ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට ඉලක්කගත සංවර්ධන සැලසුම් ගණන	සංවර්ධන සැලසුම් ගණන - 6	√		
	2030 වර්ෂය වන විට ප්‍රකාශිත සියළු නාගරික සංවර්ධන බල ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම	2025 වර්ෂයේ සකස්කර කිරීමට ඉලක්කගත සංවර්ධන සැලසුම් ගණන - 20			√
	භූමි පරිභෝජනය සහ අනාගත ජනගහන වර්ධන අනුපාතයට අනුව සංවර්ධන සැලසුම් මගින් ව්‍යාපෘති සකස් කිරීම	සකස්කර ඇති සංවර්ධන සැලසුම් ගණන -20			√
	2030 වන විට, සියලු රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසාර මානව ජනාවාස සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා අන්තර්ගත සහ තිරසාර නාගරීකරණය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම	ජනගහන වර්ධන අනුපාතයට ඉඩම් පරිභෝජන අනුපාතය	√		
11/11.4	තිරසර පාරිසරික උපායමාර්ග හා සංස්කෘතික උරුමයන් සංරක්ෂණය ඇතුලත් වන සේ සකස්කර ඇති සංවර්ධන සැලසුම්	සකස්කර ඇති සංවර්ධන සැලසුම් ගණන -20			√
11/11.7	සංවර්ධන සැලසුම් ප්‍රදේශ සඳහා පොදු එළිමන් විනෝදාත්මක අවකාශ සැලසුම් කරණය සඳහා පාරිසරික උපායමාර්ග සංවර්ධනය කිරීම	තිරසර පාරිසරික උපායමාර්ග ඇතුලත්වන සේ සකස්කර ඇති සංවර්ධන සැලසුම් - 20			√
11/11.අ	ජාතික හා කලාපීය සබඳතා පුළුල්වන සේ යටිතල පහසුකම් ප්‍රවර්ධනය සඳහා උපායමාර්ගික සංවර්ධන සැලසුම් මගින් ව්‍යාපෘති හඳුනා ගැනීම	2025 වර්ෂයේ සකස්කර ඇති සංවර්ධන සැලසුම් ගණන -20			√
11/11.ආ	අනතුරුදායක ප්‍රදේශ සඳහා තිරසර පාරිසරික උපායමාර්ග සංවර්ධනය කිරීම	2025 වර්ෂයේ සකස්කර ඇති සංවර්ධන සැලසුම් ගණන -20			√

11/11.අ	ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණය ශක්තිමත් කිරීම මගින් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්හි සම්බන්ධතාවන් සඳහා සහාය වීම	කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන		√	
11/11.5	හදිසි වැසිවතුර තත්ත්වයකදී ආපදාවට ලක්වන භූමි ප්‍රමාණය අවම කර ගැනීම.	වැසිවතුර පාලනය කිරීමේ ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රගතිය - 80%			√
11/11.ඇ	ජාතික හරිත ගොඩනැගිලි සහතික කිරීම	ඉල්ලීම මත කාල සීමාව තුළ නිකුත් කරන ලද තාවකාලික සහතික ගණන - 32%	√		

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

අරමුණ/ ඉලක්කය	ජයග්‍රහණ	අභියෝග
11/11.1	-	2019 වසරේ සිට 2025 වසර දක්වා වන කාල වකවානුව තුල රටේ ඇති වූ වසංගත සහ ගංවතුර නායයෑම් සුළිසුලං වැනි ස්වාභාවික විපත් තත්වයන් හා ආර්ථික අර්බුදය සංවර්ධන අරමුණු ලගාකරගැනීම සඳහා බාධාවක් වී ඇත.
	-	භෞතික හා සමාජ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් ජාලය පුළුල් කළ යුතු වීම
		නාගරික ඉලක්කගත ප්‍රතිලාභීන් හට දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා පවතින අභියෝග, නාගරික බල ප්‍රදේශවල පවතින ඉඩම් සීමිත වීම හා හඳුනා ගෙන ඇති ඉඩම් සංවර්ධනය කිරීමේ දී මුහුණපෑමට සිදුවන ගැටලු
		ඉහළ ගොස් ඇති මූල්‍යමය වියදම (Finance Cost) හමුවේ සංවර්ධනකරුවන්ගේ සහභාගීත්වය අවම වීම
		මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ ස්වයං උත්පාදිත ක්‍රමවේදයකට එළැඹීම සඳහා සකසන ලද ‘‘ව්‍යාපාර සැලසුම’’ ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු
	සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන 39 වන ලෝක ජනාවාස දිනය මෙවරත් "තමන්ගෙම තැනක්- ලස්සන ජීවිතයක්" යන තේමාව යටතේ පවත්වන ලදී.	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ බලතල හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ස්ථීර කාර්යය මණ්ඩලය මේ වන විට පුරප්පාඩුව පවති. විශේෂයෙන්ම, අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරු 3ක් ඇතුළුව පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව 53කි.
		මේ වන විට රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳව වූ අමප/23/1483/604/030-II හා 2023.08.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සියලු පරිපාලනමය කටයුතු සිදුකිරීමට බාධාවක් වී ඇත.

	1.2019 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය ලබාගත්තද ඒ සම්බන්ධ ඉදිරි කටයුතු චීන රජය මඟින් පත්කළ ව්‍යාපෘති කළමනාකරණ ආයතනය සමඟ 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2024 දෙසැම්බර් මස වන විට මුල් ගල් තැබීම සිදු කොට ආරම්භ කරන ලදී. චීන රජය මඟින් එම වසර අවසන් වීමට ප්‍රථම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ලබාදුන් ඉලක්කය සාර්ථකව සාක්ෂාත් කර ගැනීමට හැකි වූ නිසා යුවාන් මිලියන 552ක මූල්‍ය ප්‍රධානය ස්ථිර ලෙස ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමට හැකිවිය. 2.එසේ ඉතා කඩිනමින් ව්‍යාපෘති ආරම්භය සිදු කිරීම සඳහා කොළඹ අවට ස්ථාන 05ක ඉදිකිරීමට යෝජිත නිවාස ව්‍යාපෘති 05කින් යුතු මෙම ව්‍යාපෘතිය පැකේජ 03ක් ලෙස සකසා ඊට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය මාස 04ක් වැනි සුළු කාලයකින් 100% සිදු කර එක් එක් කොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රධානය සිදු කිරීම ද මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද විශාල ජයග්‍රහණයකි. 3. ව්‍යාපෘතියේ උක්ත සඳහන් කරන ලද ප්‍රසම්පාදන කටයුතු, නිර්මාණ, BOQ, ඇස්තමේන්තු කිරීම් හා ඉදිකිරීම් කටයුතු ආශ්‍රිත කාර්යයන් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ හා මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතියේ කාර්යය මණ්ඩලය හරහා 2025 වර්ෂයේ මාර්තු මස ව්‍යාපෘතියට අදාලව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටවන තෙක් අප්‍රමාදව හා සාර්ථකව ඉදිරියට කරගෙන යාම.	1. ව්‍යාපෘතිවලට අදාල ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 100% අවසන් නොමැතිව පැවතීම හේතුවෙන් ඒ සම්බන්ධ නෛතික ගැටළු හා නඩු පැවරීම් ආශ්‍රිත අභියෝගවලට මුහුණපෑමට සිදු වන ලද අතර ඒවා සාර්ථක ලෙස විසඳා ගැනීම. 2. තවද ව්‍යාපෘති ආශ්‍රිත සමාජීය හා දේශපාලනික ගැටළු මෙන්ම එම ඉඩම් අවට පදිංචි පිරිස් වෙතින් සිදු කරනු ලබන පැමිණිලි ආදී වූ අභියෝගද එල්ල වන ලද අතර ඒවාද සාර්ථක ලෙස විසඳා ගැනීම. 3. මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දුන් චීන රජයේ එකඟතාවය මත සරල කරන ලද එකතු කල අගය මත බදු (SVAT) සහනය 2025 ඔක්තෝම්බර් මස 01වන දින සිට අත්හිටුවීම. එම අත්හිටුවීම සම්බන්ධයෙන් චීන රජයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනය එකඟතාවය පල නොකිරීම නිසා ඒ සම්බන්ධව වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. 4. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවීමෙන් අනතුරුව ඒ සඳහා වන කාර්යය මණ්ඩලය බඳවාගැනීමට අදාලව ලබා ගත යුතු මූලික අනුමැතීන් සඳහා දීර්ඝ කාලයක් ගතවීම හා අනුමත කාර්යය මණ්ඩලය සඳහා සුදුසුකම්ලත් පිරිස බඳවාගැනීමේ පවතින අභියෝග.
11/11.3	-	• රටතුල පවතින දේශපාලන අස්ථාවරවීම් මෙන්ම ජාතික රාජ්‍ය ප්‍රතිපත්තියක් නොමැතිවීම හා පළාත් පාලන ආයතන ස්ථාවර නොවීම යන කරුණු හේතුකොට ගෙන නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2025 වර්ෂයේ සංවර්ධන සැලසුම් 26ක් පිළියෙළ කලද ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට හැකි වූයේ සංවර්ධන සැලසුම් 6ක් පමණි. • ආයතනික වශයෙන් වෘත්තීය වේදීන්ගේ පවතින හිඟකම.
11/11.6	ශ්‍රී ලංකාව තුල ප්‍රථම වතාවට නාගරික ඝන අපද්‍රව්‍ය දෛනිකව මෙට්‍රික් ටොන් 1,200ක් බැහැර කල හැකි සනීපාරක්ෂක කසල රඳවනයක් හා ඒ ආශ්‍රිත ව්‍යුහයක් මේ වන විට ඉදිකර අවසන් කර ඇත. ඒ අනුව 2026 වසරේ මැද භාගයේදී විශේෂයෙන් බස්නාහිර පළාත තුල ජනනය වන සියලුම අවශේෂ නාගරික	• සනීපාරක්ෂක කසල රඳවනය ක්‍රියාකාරිත්වය පිළිබඳ මහජනතාව තුල නිසි අවබෝධයක් නොමැති වීම. • ප්‍රදේශ තුල ජනනය වන නාගරික කසල වලින් කොම්පෝස්ට් කිරීම/ ජීව වායු ජනනය ආදී අතරමැදි ප්‍රතිකර්ම සිදු කිරීමට මෙන්ම ජනනය වන සියලු කසල එකතු

	කසල මෙම සනීපාරක්ෂක කසල රඳවනය වෙත පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමට අවස්ථාව උදාවනු ඇත.	කිරීම සඳහා පළාත් පාලන ආයතන වලට ධාරිතාවයක් නොමැති වීම. • කසල කළමනාකරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාවට නැංවීමට අදාළ ආයතන පියවර නොගැනීම. • කසල පිළිබඳව ජනතාව තුල පවතින "NIMBY" Syndrome (Not In My Back Yard) මත විධිමත් කසල කළමනාකරණයට යොමු නොවීම.
11/11.5	2025 වසර තුලදී ඇතිවූ හදිසි වැසි වතුර තත්ත්වයන්හිදී එය මනාලෙස කළමනාකරණය කිරීමට හැකිවිය. ඒ සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සිදුකල ව්‍යාපෘති • ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘති • වැසි ජල ආපදා පාලනය ව්‍යාපෘති • තෙත්බිම් සහ පහත්බිම් සංවර්ධනය ව්‍යාපෘති • නිර්මාණ කටයුතු, සිතියම්කරණය සහ ශක්‍යතා අධ්‍යයනය ව්‍යාපෘති	• හදිසි වැසි ජල ආපදා තත්ත්වයකදී ආපදාවට ලක්විය හැකියැයි හඳුනාගත් ජනතාව වන්දි ලබාදී එම ප්‍රදේශ වලින් ඉවත් කර එම ඉඩම් ජල රක්ෂිත ලෙස ප්‍රකාශ කර තිබුනද, නැවත නැවතත් එම ඉඩම්හි අනවසර පදිංචිවීම් සිදුවිම. • එසේම ජල රක්ෂිත ලෙස නිදහස්ව තිබියයුතු පහත් ඉඩම්, නීති විරෝධී ලෙස ගොඩකිරීම් සිදුකිරීම.

පරිච්ඡේදය 6
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අදාලව කාර්ය මණ්ඩලය මෙතෙක් අනුමත කර නොමැති අතර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල යෝජනාව අනුව සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

වගුව 6.1 කාර්යය මණ්ඩල තොරතුරු

සේවා ගණය	යෝජිත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය -	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	61	33	28
තෘතීයික	5	1	4
ද්විතියික	179	161	18
ප්‍රාථමික	60	49	11
එකතුව	**305**	**244**	**61**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු), අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), අධ්‍යක්ෂ, සහකාර ලේකම්, සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරි, අභ්‍යන්තර විගණක, තාක්ෂණ නිලධාරි හා රියදුරු තනතුරුවල පුරප්පාඩු පවතී. එම නිලධාරි හිඟය අමාත්‍යාංශයේ කාර්ය සාධනය සඳහා සෘජුවම බලපානු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

2025 වර්ෂය තුල පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
සිංගප්පූරු සහයෝගිතා වැඩසටහන: නගරවල තිරසර මූල්‍යකරණය	01	2025.02.10 - 2025.02.14	-	44,712.00	විදේශීය	නගරවල තිරසර මූල්‍යකරණය පිළිබඳ දැනුම.
සිංගප්පූරු සහයෝගිතා වැඩසටහන: නගරවල තිරසර මූල්‍යකරණය	01	2025.02.09 - 2025.02.14	-	80,338.80	විදේශීය	නගරවල තිරසාර මූල්‍යකරණය පිළිබඳ දැනුම.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිලධාරීන් සඳහා අධ්‍යයන චාරිකාව - චෙන්නායි, ඉන්දියාව	01	2025.02.17 - 2025.02.19	-	22,230.00	විදේශීය	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම.
ප්‍රතිපත්ති සඳහා පර්යේෂණ සම්බන්ධ කිරීම (දකුණු ආසියාව සහ මොන්ගෝලියාව සඳහා ඕස්ට්‍රේලියානු ප්‍රදාන) - ඕස්ට්‍රේලියාව	01	මූලික ක්‍රියාකාරකම් - 2025.02.17 -19 (ශ්‍රී ලංකාවේ), මූලික ඉගෙනුම් අංග - 2025.03.17 – 28 (ඕස්ට්‍රේලියාව)වහාරික ඉගෙනුම් ක්‍රියාකාරකම් (මාර්ගගතව/ කලාපයේ) – 2025.05.06 – 28 (ශ්‍රී ලංකාවේ)	-	139,399.50	විදේශීය	ප්‍රතිපත්ති සඳහා පර්යේෂණ සම්බන්ධ කිරීම පිළිබඳ දැනුම.
චීනය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සංවර්ධනය සහ දිළිදුකම පිටුදැකීම සඳහා ක්ෂේත්‍රයේ අත්දැකීම් හුවමාරුව පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	02	2025.03.23 - 2025.04.05	-	139.599.75	විදේශීය	චීනය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික ක්ෂේත්‍රයේ අත්දැකීම් හුවමාරුව පිළිබඳ දැනුම.
ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය: නාගරික සංචලනය - ඉන්දියාව	02	2025.03.04 - 2025.03.09	-	51,794.75	විදේශීය	නාගරික සංචලනය පිළිබඳ දැනුම.
28 වන ජාත්‍යන්තර බිම්බෝම්බ ක්‍රියාමාර්ග රැස්වීම - ස්විට්සර්ලන්තය	01	2025.04.09 - 2025.04.11	-	65,703.75	විදේශීය	බිම්බෝම්බ ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම.

සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පරිසර නගර ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	01	2025.04.15 - 2025.04.28	-	137,607.75	විදේශීය	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පරිසර නගර ඉදිකිරීම පිළිබඳ දැනුම.
ශ්‍රී ලංකාව සඳහා සංවර්ධන කලාප ඉදිකිරීම් සහ කළමනාකරණය සඳහා වූ සම්මන්ත්‍රණය - චීනය	02	2025.04.29 - 2025.05.12	-	142,970.25	විදේශීය	ශ්‍රී ලංකාව සඳහා සංවර්ධන කලාප ඉදිකිරීම් සහ කළමනාකරණය පිළිබඳ දැනුම.
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	01	2025.04.29 - 2025.05.12	-	142,500.00	විදේශීය	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම.
කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය ධාරිතාව වැඩිදියුණු කිරීම හෙට දිනය සඳහා දියුණු කිරීම පුහුණු වැඩසටහන: ප්‍රාග්ධන ස්ථානගත කිරීම සහ නාගරික සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය සඳහා ධාරිතා වර්ධනය (2025-2027)	02	2025.07.06 - 2025.07.19	-	225,029.75	විදේශීය	ප්‍රාග්ධන ස්ථානගත කිරීම සහ නාගරික සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘති සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ දැනුම.
ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා උපායමාර්ගික නායකත්වය සහ පාලනය	02	2025.06.30 - 2025.07.11		224,341.25	විදේශීය	ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා උපායමාර්ගික නායකත්වය සහ පාලනය

පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන - ඉන්දියාව						පිළිබඳ ධාරිතා වර්ධනය.
BRI හවුල්කාර රටවල් සඳහා වැසි ජලය රැස් කිරීම සහ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව - චීනය	01	2025.07.03 - 2025.07.22	-	143,646.00	විදේශීය	BRI හවුල්කාර රටවල් සඳහා වැසි ජලය රැස් කිරීම සහ භාවිතය පිළිබඳ දැනුම.
ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා උපායමාර්ගික නායකත්වය සහ පාලනය පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන II - ඉන්දියාව	02	2025.07.28 - 2025.08.08	-	256,629.50	විදේශීය	ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා උපායමාර්ගික නායකත්වය සහ පාලනය පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන II පිළිබඳ දැනුම.
දේශගුණික අනුවර්තනය පිළිබඳ ආයෝජන සැලසුම් සංසදය - පිලිපීනය	01	2025.09.03 - 2025.09.04	-	48,337.6	විදේශීය	දේශගුණික අනුවර්තන පිළිබඳ ආයෝජන සැලසුම්කරණය පිළිබඳ දැනුම.
ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා වූ "පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: ශ්‍රී ලංකාවේ නාගරික කලාපීය භාවිතයන් සමග පරිවර්තනය කිරීම" යන මැයෙන් 5 වන ධාරිතා වර්ධන වැඩසටහන - ඉන්දියාව	02	2025.09.22 - 2025.10.03	-	242.327.75	විදේශීය	"පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: කලාපීය භාවිතයන් සමග ශ්‍රී ලංකාවේ නාගරික පරිවර්තනය" සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ දැනුම.
දකුණු ආසියානු මෙහෙයුම් සංසදය 2025 - සිංගප්පූරුව	01	2025.09.22 - 2025.09.24	-	48,331.20	විදේශීය	දකුණු ආසියානු මෙහෙයුම් සංසදය පිළිබඳ දැනුම.

ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය - දැනුම සහයෝගීතා වැඩසටහන: දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම - ජපානය	01	ශ්‍රී ලංකාවේ මාර්ගගතව - 2025.09.16 සිට 26 දක්වා/ ජපානයේ මුහුණට මුහුණ - 2025 .09.28 සිට 2025.10.25 දක්වා	-	113,463.75	විදේශීය	දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම පිළිබඳ පිළිබඳ දැනුම.
සාර්ථක ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ කලාපීය සංසදය - තායිලන්තය	01	2025.10.13 - 2025.10.15	-	37,857.5	විදේශීය	සාර්ථක ව්‍යාපෘති නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම.
ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා "පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: කලාපීය භාවිතයන් සමග නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම - II" යන මැයෙන් 6 වන ධාරිතා වර්ධන වැඩසටහන - ඉන්දියාව	03	2025.10.27 - 2025.11.07	-	227.032.50	විදේශීය	ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා "පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: කලාපීය භාවිතයන් සමඟ නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම - II" පිළිබඳ දැනුම.
ස්මාර්ට් ජාතියක් පිළිබඳ දැක්මක් කරා නාගරික සංවර්ධනය - කොරියාව	01	2025.11.03 - 2025.11.07	-	53,243.75	විදේශීය	ස්මාර්ට් ජාතියක් පිළිබඳ දැක්මක් කරා නාගරික සංවර්ධනය පිළිබඳ දැනුම
"ඉඩම් පාලනය සහ තිරසාර නාගරික සංවර්ධනය පිළිබඳ පුහුණුව"- කොරියාව	01	2025.11.25 - 2025.12.04	-	76,872.50	විදේශීය	ඉඩම් පාලනය සහ තිරසාර නාගරික සංවර්ධනය පිළිබඳ පුහුණුව.
රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය	02	වසර 01	112,500.00	-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය

පිලිබඳ ඩිප්ලොමා පාඨමාලාව						පිලිබඳ දැනුම.
රාජ්‍ය තාන්ත්‍රික හා ලෝක කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව	01	වසර 01	150,000.00	-	දේශීය	රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ ලෝක කටයුතු පිලිබඳ දැනුම.
"රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කාණ්ඩයේ නිලධාරීන් ඇයි" යන මැයෙන් එක්දින සම්මන්ත්‍රණය	06	දින 01	30,000.00	-	දේශීය	රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කාණ්ඩයේ නිලධාරීන්ගේ අවශ්‍යතාවය පිළිබඳ දැනුම.
නොතරිස් ධූරයේ කාර්යභාරය, වගකීම හා ප්‍රායෝගික දුෂ්කරතා හා විසඳුම්	01	දින 01	2,500.00	-	දේශීය	නොතරිස් ධූරයේ කාර්යභාරය, වගකීම හා ප්‍රායෝගික දුෂ්කරතා හා විසඳුම් පිළිබඳ දැනුම.
ගූගල් යෙදුම් සහ කෘතිම බුද්ධිය මෙවලම් පිළිබඳ පුහුණුව.	01	දින 01	7,500.00	-	දේශීය	ගූගල් යෙදුම් සහ කෘතිම බුද්ධිය මෙවලම් පිළිබඳ දැනුම.
ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	මාස 03	30,000.00	-	දේශීය	ප්‍රසම්පාදනය කටයුතු පිළිබඳ දැනුම.
විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම	18	දින 01	108,000.00	-	දේශීය	විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ දැනුම.
භූගත මහල් සැලසුම් කිරීම සහ ඉදිකිරීම පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාව - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජික.	01	දින 04	22,500.00	-	දේශීය	භූගත මහල් සැලසුම් කිරීම සහ ඉදිකිරීම පිළිබඳ දැනුම.

පරිච්ඡේදය 7
අනුකූලතා වාර්තාව


#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.6	වෙනත්	අදාල නොවේ.		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවරවත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	2021.11.26 දින නිකුත් කරන ලද රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 8.1 ඡේදය අනුව ස්ථාවර වත්කම් ලේඛනය තවදුරටත් පවත්වාගෙන යාම අනිවාර්යය නොවේ.	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කරපවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIAS) පිළියෙළ කර නියමිත දිනට මහාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිලිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA /1 – 1/2025 චක්‍රලේඛ අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ.	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය මත වත්කම් යාවත්කාලීන ක්‍රමවේදයක් සකස් කරන බැවින් මෙම ක්‍රමය දැනට ක්‍රියාත්මක නොවේ.	

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අදාළ නොවේ.	එවැනි ගැළපුම් කළයුතු ශේෂයන් නොමැත් වීම.	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		

11.2	මු.රෙ 94(1)ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහාවන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම්**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාන්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ.	අමාත්‍යාංශය සඳහා අදායම් ගිණුමු කටයුතු අදාළ නොවේ.	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකොට තිබීම	අදාළ නොවේ.	වෙනත් ආයතන වෙනුවෙන් එකතු කළ ආදායම් තැන්පත් ගිණුමේ රඳවා නොගෙන අදාළ ආදායම් ශීර්ෂ වෙත බැරකර ඇත.	
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ.	ආදායම් එකතු කරන ආයතනයක් නොවන බැවින් අමාත්‍යාංශයට අදාළ නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා එල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සක් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුහතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		



ක.ස. – 75 ස.නි. – 310 කා.කා.ස. – 56 රියදුරු – 50 කා.කා.ස. (දෙපාර්තමේන්තු) -1

යටි සටහන: 1. අතිරේක ලේකම් (ශ්‍රී.ල.ප.සේ.) විශේෂ – තනතුරු 2
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් සහ මෙහෙයුම්) – ශ්‍රී.ල.ක්‍ර.සේ. – විශේෂ – තනතුරු 1 } මෙම නිලධාරීන් විශ්‍රාම යෑම හේතුවෙන් ඉහත සංවිධාන සටහනට ඇතුළත් කර නොමැත.

2. * තනතුරු දරන තැනැත්තන්.

3. අධ්‍යක්ෂ ජනරාල් (නිවාස) ශ්‍රී.ල.ක්‍ර.සේ. (විශේෂ) විශ්‍රාම දිනය 15/12/2023 වේ. එම නිලධාරියා විශ්‍රාම ගැනීමෙන් පසු නාගරික සංවර්ධන සැලසුම් ඒකකය සහ පරිසර ආරක්ෂණ සැලසුම් ඒකකය එකතු කර අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ල.ක්‍ර.සේ. විශේෂ) තනතුරු 2ක් පහත පරිදි පත් කිරීමට නියමිතය.

I. අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන සහ **පරිසර ආරක්ෂණ**) - ශ්‍රී.ල.ක්‍ර.සේ. - විශේෂ
II. අධ්‍යක්ෂ ජනරාල් (නිවාස) - ශ්‍රී.ල.ක්‍ර.සේ. - විශේෂ

ඇමුණුම 1-1

සාමාන්‍ය පාලන අංශය

අභ්‍යන්තර විගණන අංශය

සැලසුම් හා මෙහෙයුම් අංශය

අතිරේක ලේකම් (සාමාන්‍ය පාලන) ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

ප්‍රධාන මූල්‍ය නිලධාරී I ශ්‍රී.ල.ග.සේ (විශේෂ)

ප්‍රධාන මූල්‍ය නිලධාරී II ශ්‍රී.ල.ග.සේ (විශේෂ)

ජේ.ස.ලේ. (පාලන) ශ්‍රී.ල.ප.සේ I

ජේ.ස.ලේ (ප්‍රවාහන හා නඩත්තු) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍යක්ෂ (ඉඩම් සහ නීති) ශ්‍රී.ල.ප.සේ I

ප්‍රධාන ගණකාධිකාරී (සාමාන්‍ය පරිපාලන

ප්‍රධාන ගණකාධිකාරී (නා.ස. සහ ප.ආ.)

ප්‍රධාන ගණකාධිකාරී (නිවාස හා ඉදිකිරීම්) ශ්‍රී.ල.ප.සේ I -I

ප්‍රධාන ගණකාධිකාරී (සාමාන්‍ය පරිපාලන II) ශ්‍රී.ල.ප.සේ

ප්‍රධාන අභ්‍ය. විගණක ශ්‍රී.ල.ග.සේ (I) - (3)

* අතිරේක ලේකම් ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන) ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (පරිසර ආරක්ෂණ) ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

* අධ්‍යක්ෂ ජනරාල් (නිවාස) ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

නි.අ./ස.අ (ශ්‍රී.ලං. නො.හා ස.නා.සේ

ස.ලේ.- (පාලන) (ශ්‍රී.ල.ප.සේ II/III)

ස.ලේ (ප්‍රවාහන හා නඩත්තු) (ශ්‍රී.ල.ප.සේ II/III)

නි.අ./ස.අ (ප්‍රතිපත්ති) ශ්‍රී.ල.ප.සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ල.ප.සේ (II/III)

ස.අ. ශ්‍රී.ලං.ක්‍ර.සේ අධීක්ෂක (II/III)

නීති නිලධාරී (2)

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ (II/III)

අභ්‍ය. විගණක ශ්‍රී.ල.ග.සේ (II/III) (2)

අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ 1

අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ I

අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ I

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.සේ (II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) II/III

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) II/III

පරිපාලන නිලධාරී

නො.නා. නිලධාරී -3

භාෂා පරිවර්තක -2

පිළිගැනීමේ නිලධාරී

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ. නි.

ස.නි. ක.සේ.නි

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ. නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

නො.නා.සහකාර - 2 කා.කා.ස.

විසියෝ ශිල්පී (දෙපා.) ඡායාරූප ශිල්පී (දෙපා.) සහකාර ඡායාරූප ශිල්පී (දෙපා.) කා.කා.ස.

රියදුරු කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස

ඇමුණුම 1-2

2023.12.15 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

ව්‍යාපෘති මෙහෙයුම් අංශය

අතිරේක ලේකම් (ව්‍යාපෘති මෙහෙයුම්)
ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

ජේ.ස.ලේ. (ව්‍යාපෘති මෙහෙයුම්) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍යක්ෂ (ව්‍යාපෘති) ශ්‍රී.ලං.ක්‍ර.සේ I

අධ්‍යක්ෂ (සේවා සහ කොන්ත්‍රාත් පාලන) ශ්‍රී.ලං.ඉ.සේ I

ස.ලේ. ශ්‍රී.ල.ප.සේ II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.වි.සේ (II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ අධිසේවක II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ අධිසේවක II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.සේ (II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.ස.සේ (II/III)

පරිපාලන නිලධාරී

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි. නා.නි. (2), ක.සේ.නි.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස

කා.කා.ස.

නිවාස සහ ඉදිකිරීම් අංශය

අතිරේක ලේකම් (නිවාස සහ ඉදිකිරීම්) ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (නිවාස හා ඉදිකිරීම්) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා හා නාක්.) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

ජේ.ස.ලේ (නි. සහ ඉ.) ශ්‍රී.ල.ප.ස සේ I

අධ්‍ය. (නිවාස) ශ්‍රී.ල.ප.ස සේ I

අධ්‍ය. (නැවත පදිංචි කිරීම්) ශ්‍රී.ල.ප.සේ. I

ජාතික නිවාස කොමසා.

අධ්‍ය. ශ්‍රී.ලං.ඉ. සේ. I

අධ්‍ය. ශ්‍රී.ලං.ඉ. සේ. I

අධ්‍ය. (ඉංජී. සේවා) ශ්‍රී.ලං.ඉ.සේ. I

ස.ලේ. (නි. හා ඉ.) ශ්‍රී.ල.ප.සේ. (II/III)

ස.ලේ. (නි. හා ඉ.) ශ්‍රී.ල.ප.ස. සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ල.ප.සේ. (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.ස.සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.ස සේ(II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.සේ II/III

පරිපාලන නිලධාරී

ස.නි., ක.ස. – 1(දෙපා) ලිපිකරු - 2(දෙපා) යතුරු ලියන්නන් - 1(දෙපා) ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., නා.නි. (3), ක.සේ.නි.

කා.කා.ස. කා.කා.ස. -1 (දෙපා.)

කා.කා.ස.

කා.කා.ස.

කා.කා

කා.කා

කා.කා.ස.

නාගරික සංවර්ධන හා පරිසර ආරක්ෂණ අංශය

අතිරේක ලේකම් (නාගරික සංවර්ධන සහ පරිසර ආරක්ෂණ) ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (පරිසර ආරක්ෂණ හා නාක්ෂණ) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

ජේ.ස.ලේ. (නා.සං.සහ ප.ආ.) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍ය. (නා.සං.සහ ප.ආ.) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍ය. (නා.සං.) ශ්‍රී.ලං.ඉ.සේ. I

අධ්‍ය. (පරිසර ආරක්ෂණ හා නාක්ෂණ) ශ්‍රී.ලං.ඉ.සේ. 1

ස.ලේ. (නා.සං.සහ ප.ආ.) ශ්‍රී.ල.ප.සේ. II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.සේ.

ස.අ (දෙපා) නා.සං. II/III

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ඉ.සේ. II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ඉ.සේ.

ස.නි., ක.සේ.නි

ස.නි., ක.සේ.නි.

ස.නි., නා.නි (1), ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි

ස.නි., නා.නි. (1), ක.සේ.නි.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස

කා.කා.ස.

ඇමුණුම 1-3

2023.12.15 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මෙම පත්‍රිකාව ආයතනය විසින් ඇමුණුම - 01 හි දක්වා ඇති තොරතුරු වලට අනුකූල විය යුතුය.

1. අමාත්‍යාංශය / පළාත් සභාව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :
2.දෙපාර්තමේන්තුව / SOE නම / ආයතනය : නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ඇමුණුම - 02

3.ලිපිනය : 12වන මහල . සෙත්සිරිපාය අදියර 2, බත්තරමුල්ල

4.අනුමත කාර්යමණ්ඩල තොරතුරු : 2024.09.30 - 2024.12.31

තනතුර	සේවය	පංතිය	වැටුප් කේතය	සේවා මට්ටම	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය			පවතින සේවක සංඛ්‍යාව				2024.09.30 සිට 2024.12.31 දක්වා කාලය සඳහා (ගණන)							
					ස්ථිර	කොන්ත්‍රාත්	අතිරේක	ස්ථිර	කොන්ත්‍රාත්	අතිරේක	වෙනත් (වැඩබලන/.....)	ඔබදය ගැහීම්	ඔබදය ගැහීම්	ද්විතීයික පදවියට මාරු	ඉල්ලා අස්වීම්	සේවය අකෘතාරාගම	සේවයෙන් පහකිරීම්	විශ්‍රාම යෑම්	මරණ
ලේකම්		විශේෂ	SL4	1	1			1											
අතිරේක ලේකම්	ශ්‍රී.ප.සේ.	විශේෂ	SL3	1	4			4										1	
අතිරේක ලේකම් #	ශ්‍රී.ක්‍ර.සේ.	විශේෂ	SL3	1	1			1											
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ඉ.සේ.	විශේෂ	SL3	1	4			1			2								
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ක්‍ර.සේ.	විශේෂ	SL3	1	2			2											
ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී.ග.සේ.	1	SL3	1	2			2											
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී.ප.සේ.	1	SL1	1	5			5											
ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ග.සේ.	1	SL1	1	4			4											
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ග.සේ.	1	SL1	1	3			2											
අධ්‍යක්ෂක	ශ්‍රී.ප.සේ.	1	SL1	1	5			5											
අධ්‍යක්ෂක	ශ්‍රී.ක්‍ර.සේ.	1	SL1	1	4			2			2								
අධ්‍යක්ෂක	ශ්‍රී.ඉ.සේ.	1	SL1	1	6			6											
සහකාර ලේකම්	ශ්‍රී.ප.සේ.	iii/ii	SL1	1	6			2											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ප.සේ.	iii/ii	SL1	1	3			1											
ගණකාධිකාරී	ශ්‍රී.ග.සේ.	iii/ii	SL1	1	4			1			1								
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ඉ.සේ.	iii/ii	SL1	1	8			6											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ක්‍ර.සේ.	iii/ii	SL1	1	8			7											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ක්‍ර.සේ (අධි සේවක)	iii/ii	SL1	1	3			3											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.තොා.නා. සේ.	iii/ii	SL1	1	1			1											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	දෙපා.	iii/ii	SL1	1	1			1											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ගෘ. සේ.	iii/ii	SL1	1	1			1											
අභ්‍යන්තර විගණක	ශ්‍රී.ග.සේ.	iii/ii	SL1	1	2			0											
ජාතික නිවාස කොමසාරිස්			SL1		1			0			1								

නීති නිලධාරී	දෙපා.	iii/ii	SL1	1	2			2											
පරිපාලන නිලධාරී	රා.ක.ස.සේ.	(අධි ශ්‍රේණි)	MN7	2	3			2											
ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් *	තාවකාලික				1					1									
පරිවර්තක	පරිවර්තක සේවාව	I/විශේෂ	MN-6	2	2			1											
නොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී.තොා.ස. තා.සේ.	2,ii/i	MN-6	2	3			2											
සංවර්ධන නිලධාරී	ස.නි.සේ.	iii/ii/i	MN4	3	307			265								1			
සංවර්ධන සහකාර	දෙපා.	iii/ii/i	MN4	3	1			1											
තාක්ෂණික නිලධාරී	ශ්‍රී.තා.සේ.	iii/ii/i	MN3	3	7			5											
රාජ්‍ය කළමනාකරණ සහකාර	රා.ක.ස.සේ.	iii/ii/i	MN2	3	75			62											
නොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.තොා.ස. තා.සේ.	3,iii/ii/i	MT1	3	2			2											
කළමනාකරණ සහකාර	දෙපා.	iii/ii/i	MN1	3	1			1											
ලිපිකරු	දෙපා.	iii/ii/i	MN1	3	2			2											
යතුරු ලියනය කරන්නා	දෙපා.	iii/ii/i	MN1	3	1			1											
පිළිගැනීමේ නිලධාරී	දෙපා.		MN1	3	1			1											
නිශ්චල ඡායාරූප ශිල්පියා	දෙපා.	iii/ii/i	MT 1	3	1			1											
වීඩියෝ කැමරා ක්‍රියාකරු	දෙපා.	iii/ii/i	MT 1	3	1			1											
කැමරා ක්‍රියාකරු සහායක		iii/ii/i	PL1	3	1			0											
රියදුරු	රියදුරු සේවය	ii/i/iii විශේෂ	PL3	4	50			40										1	
කාර්යාල සේවා සහයක	කා.සේ.සේ.	ii/i/iii විශේෂ	PL1	4	56			45											
කාර්යාල සේවා සහයක	දෙපාර්තමේන්තුගත	iii/ii/i	PL1	4	1			1											
එකතුව					**597**	**0**	**0**	**493**	**0**	**1**	**6**	0	0	0	0	1	0	2	0

ජනාධිපති ලේකම්තුමාගේ අංක PS/CSA/00/1/9/7 සහ 2022.06.10 දිනැති ලිපියට අනුවෙ රාජ්‍ය ලේකම්වරුන් අතිරේක ලේකම් ලෙස තනතුර දරණ පුද්ගලයින් මත පදනම්ව පත් කරනු ලබයි.
* ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් එක් (01) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරක් දරයි.

සේවා මට්ටම	**අනුමත සේවක සංඛ්‍යාව**	**පවතින සේවක සංඛ්‍යාව**
ජ්‍යෙෂ්ඨ	81	66
තෘතීයික	9	6
ද්විතීයික	399	342
ප්‍රාථමික	108	86
එකතුව	**597**	**500**

05. ඉහත තොරතුරු නිවැරදි බව මම සහතික කරමි.

6. ආයතන ප්‍රධානියාගේ නම සහ තනතුර : ලේකම්, රංජිත් ආරියරත්න
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

7. සම්බන්ධීකරණ තොරතුරු : .....
සම්බන්ධීකරණ නිලධාරියා (නම) :එම්. ඒ. රණවක
තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
දුරකථන අංකය.

ඇමුණුම 3 - 1

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

නාගරික සංවර්ධන,ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	කළඹ 2025	2024	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එමඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අරමුදල්		48,067,236,348	14,529,527,754	එමඒ-3
-	තැන්පතු		272,299,821	59,257,074	එමඒ-4
-	අත්තිකාරම් ගිණුම්		42,300,858	29,530,657	එමඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		3,469,560,566	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		51,851,397,593	14,618,315,485	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		51,851,397,593	14,618,315,485	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		242,497,264	154,784,650	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		51,608,900,330	14,463,530,835	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
621,766,000	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	542,634,575	417,407,055	
619,122,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	426,629,604	416,193,786	එමඒ-2(ii)
365,750,000	සභනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	344,158,493	684,878,304	
-	පොළී ගෙවීම්	8	-	-	
500,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	170,000	
1,607,138,000	මුළු පුනරාවර්තන වියදම් (ඒ)		1,313,422,672	1,518,649,145	
	මූලධන වියදම්				
1,358,410,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	737,603,218	25,280,307	
64,158,918,201	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	46,011,381,351	20,107,336,777	
16,981,368,286	ප්‍රාග්ධන මාරුකිරීම්	12	14,402,665,990	7,065,001,817	එමඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,300,000	හැකියා වර්ධනය	14	644,977	814,150	
3,866,865,513	වෙනත් මූලධන වියදම්	15	2,375,998,791	9,097,382,644	
86,366,862,000	මුළු මූලධන වියදම් (ඔ)		63,528,294,327	36,295,815,695	
	තැන්පතු ගෙවීම්		425,576,011	627,198,895	එමඒ-4
	අත්තිකාරම් ගෙවීම්		65,461,932	30,873,129	එමඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඕ)		491,037,943	658,072,024	
	මුළු වියදම් එ = (ඒ+ඔ+ඕ)		65,332,754,942	38,472,536,864	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(13,723,854,612)	(24,009,006,029)	
	අඩිම් ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(13,723,854,612)	(24,010,098,638)	එමඒ-7
	දෙසැම්බර් 31 දිනට අඩිම් ශේෂය		-	1,092,609	එමඒ-3
			(13,723,854,612)	(24,009,006,029)	

Scanned with CamScanner

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්ෂ 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	92,575,793,482	47,427,178,360
කෙරිගෙන යන වැඩ		70,914,058,245	57,232,291,859
අස්පෘශ්‍ය වත්කම්		34,257,050	6,787,950
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ),	1,029,014,703	518,810,880
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	1,092,609.00
මුළු වත්කම්		164,553,123,480	105,186,161,658
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		-956,137,599	-1,131,780,603
දේපළ පිරියත හා උපකරණ සංචිතය		92,575,793,482	47,427,178,360
කෙරිගෙන යන වැඩ		70,914,058,245	57,232,291,859
අස්පෘශ්‍ය වත්කම්		34,257,050	6,787,950
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	939,354,469	452,311,720
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,045,797,833	1,198,279,763
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	1,092,609
මුළු වගකීම්		164,553,123,480	105,186,161,658

පිටු අංක 08 සිට 106 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 107 සිට 125 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 සහ 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 10/4/2026	දිනය :	දිනය : 10/4/2026
ඉංජි. එල්.බී. කුමුදු ලාල්		පී. සුබ්‍රමනියම්
ලේකම්		ප්‍රධාන මූල්‍ය නිලධාරි
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය		නිවාස හා ඉදිකිරීම් අංශය
12 වන මහල, "සෙත්සිරිපාය", අදියර-II		නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය
බත්තරමුල්ල.		02 වන මහල, "සෙත්සිරිපාය" (අදියර I)
		බත්තරමුල්ල.

Scanned with CamScanner

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	රුපියල්	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	438,640,081	446,915,191
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එනතු කරන ලද ආදායම්		-
අනුමත ලැබීම්	48,067,236,348	14,529,527,754
අත්තිකාරම් අයකර ගැනීම්	82,337,150	25,311,129
තැන්පතු ලැබීම්	272,299,821	59,257,074
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	48,860,513,400	15,061,011,147
අඩුකළා: මුදල් වැය කිරීම්		
මූර්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	966,618,284	830,579,992
සභානාධාර සහ මාරුකිරීම්	2,935,278	13,188,055
මූලධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	13,916,120,534	5,190,099,274
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් *	387,901,367	103,899,511
භාණ්ඩාගාරයට බැර වන ලද අනුමත	242,497,264	154,784,650
අත්තිකාරම් ගෙවීම්	93,414,055	31,004,461
තැන්පතු ගෙවීම්	425,576,011	627,198,895
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	16,035,062,793	6,950,754,837
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	32,825,450,607	8,110,256,310
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිවැකම් ඉවත්වීමේ ප්‍රතිසාධන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපාය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා: මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	36,295,011,173	10,944,783,288
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	36,295,011,173	10,944,783,288
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(36,295,011,173)	(10,944,783,288)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(3,469,560,566)	(2,834,526,978)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		-
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	3,469,560,566	2,835,619,587
	3,469,560,566	2,835,619,587
අඩුකළා: මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	3,469,560,566	2,835,619,587
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	1,092,609
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	1,092,609

* වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද මුළු වියදම් රු. 387,909,523 යි. මෙම 2024 වර්ෂයේ මැයිවරණ වෙවීම් සඳහා මැයිවරණ කාර්යාලයෙන් ලැබිය යුතු අත්තිකාරම් රු. 8156 ක් වෙනුවට වැය ශීර්ෂය මගින් ප්‍රතිසාධන නිදහස් කිරීම් වේතුවෙන් ඇති වූ වර්තාමතිද ඇතුලත්ය. එබැවින් 2025 වර්ෂයේ අත්තිකාරම් මගින් වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් රු. 387,901,367 ක් වලස ගැලපීම් කර ඇත. (387,909,523 - 8156 = 387,901,367)

Scanned with CamScanner

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මූදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මූදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

භූවමාරු හා භූවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මූදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මූදල් හා මූදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මූදල් හා මූදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මූදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

Scanned with CamScanner

ඇමුණුම 3 - 2

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HUD/D/MUDC&H/FS/01/2025/98

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 පූර්වදින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ කොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, පිටකොට්ටාව, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සෑකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වපුභය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල වපුභය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශයේ 7.8 ඡේදය ප්‍රකාරව, මූදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මූදල් වැයකිරීම් යටතේ දැක්විය යුතු මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සඳහා දරන ලද වියදම් රු.36,309,702,277ක් වූවද, එම වටිනාකම රු.36,295,011,173 ක් ලෙස රු.14,691,104 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) නාගරික පුනර්ජීවන වැඩසටහනට සහයවීමේ ව්‍යාපෘතිය (SCURP) විසින් ඉදිරිපත් කරන ලද 2025 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් වියදම් සමග අමාත්‍යාංශයේ වියදම් ප්‍රකාශන සැසඳීමෙදී රු. 2,805,880 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

2023 මාර්තු 09 දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ පිරිවැය රු.10,200,000 ක් වූ වාහන 03 ක් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලෙස තවදුරටත් මූල්‍ය නත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

අමාත්‍යාංශයේ කුලීවැඩ හා අත්තිකාරම් ලේඛනයට අනුව අත්තිකාරම් 18 කට අදාළව රු.278,300,534 ක ශේෂයක් පැවතියද භාණ්ඩාගාරයේ SA-90 ප්‍රකාශයේ එම කොරතුරු වාර්තා කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයේ කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය වෙනුවෙන් අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම (සටහන 11) සඳහා මූ.රෙ. 208 මඟින් රු.9,716,370,177ක් අමාත්‍යාංශ වැය ශීර්ෂයට හර කර තිබුණි. එම වටිනාකම් සමස්ථ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදමින් සියයට 21 ක් විය. නමුත් එම වියදම් සනාථ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සාරාංශ වාර්තා මඟින් හෙළිදරවු නොකිරීමෙන් එම වියදම් සත්තිරීක්ෂණය කළ නොහැකි වූ අතර එමඟින් ජනිත වූ වත්කම් හඳුනාගැනීමටද නොහැකි විය.

(ආ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දැක්වෙන රු. 25,569,893,157ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගැනීම, රු. 25,442,304,453 ක් වටිනා ස්ථාවර වත්කම් අපහරණය කිරීම් ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛණ විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂවල් නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.70,914,058,245 ක කෙරිමගහ යන වැඩ ශේෂය සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛණ විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
3.2 ඡේදය	මූ.රෙ. ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කර නොතිබීම.	3.1 ඡේදය

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 50 (ii)සිට (iv) දක්වා ඇතුළත් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු, සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව, හැකිතාක් දුරට සම්පූර්ණයෙන්, නිවැරදිව පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතුය. නමුත් අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන පරිදි වියදම් ඇස්තමේන්තු සැකසීමේදී අයි සහ ඌන ප්‍රතිපාදන සිදුකළ අවස්ථා පැවතුණි. එබැවින් වාර්ෂික අයවැය ලේඛන සකස්කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුවී නොතිබුණි.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 08 ක් වෙත වෙන්කරන ලද එකතුව රු.8,020,000 ක් සහ ප්‍රාග්ධන වැයවිෂයයන් 21 ක් වෙත වෙන් කරන ලද එකතුව රු.9,995,720,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණු අතර ඒවායින් වැය විෂයයන් 02 ක් වෙත ප්‍රතිපාදනය කරන ලද රු.9,000,000 ක් සම්පූර්ණයෙන්ම සහ තවත් වැයවිෂයයන් 05 ක් වෙත වෙන්කරන ලද මුදලින් සියයට 50 ට වැඩි ප්‍රමාණයක් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ආ) 2025 වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් නොකළ වැය විෂයයන් 10 ක් වෙත පසුව මු. රෙ. 66 යටතේ රු. 12,605,243,373 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ක ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ නිවාස 600 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙත මු.රෙ.66 මඟින් රු. 4,300,000 ක මුදලක් මාරු කරගෙන තිබුණද එම මුළු ප්‍රතිපාදනයම් ඉතිරිවී තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 211 ප්‍රකාරව සියලුම බැරකම් සිදුවූ වහාම සටහන් කර ගත යුතු අතර බැරකම් පිළිබඳ සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ. එමෙන්ම 2017 අප්‍රේල් 27 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 255/2017 දරන වක්‍රලේඛයේ (2) (අ) (ආ) සහ 03 වගන්තීන් ප්‍රකාරව බැඳීම් හා බැරකම් හඳුනා ගත යුතු අතර එම බැඳීම් හා බැරකම් CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමට පියවර ගත යුතු වුවද පහත දැක්වෙන බැරකම් පිළිබඳ විස්තර CIGAS වැඩසටහනේ බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

(i) අමාත්‍යාංශයේ ජල අංශයේ 2025 වර්ෂයට අදාල රු.77,750,889 ක බැරකම් අයිතම .14 ක් බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

(ii) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය දැක්වීමේ ව්‍යාපෘතියේ (SCURP) 2025 වාර්ෂික ගිණුම් ප්‍රකාශනය අනුව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු එකතුව රු.138,232,078 ක ශේෂයක් දක්වා තිබුණද එය අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(iii) අනුරාධපුර උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ (AIUDP) 2025 වාර්ෂික ගිණුම් ප්‍රකාශනය අනුව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු එකතුව රු. 94,025,726 ක ශේෂයක් දක්වා තිබුණද එය අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත අමාත්‍යාංශයෙන් ලැබිය යුතු එකතුව රු.555,918,448 ක ශේෂයක් දක්වා තිබුණද එය අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල කටයුතු කර නොතිබුණි.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i)	XII පරිච්ඡේදයේ 1.7 ඡේදය	අනුමත කළ නිවාඩු රෙජිස්ටරයක් 190 වැනි පොදු ආකෘති පත්‍රය අනුව නඩාගත යුතු වුව ද, 2024 හා 2025 වර්ෂවලට අදාළව නිලධාරීන් විසින් ලබාගෙන තිබුණු නිවාඩු අනුමත කර නිවාඩු ලේඛනයේ සටහන්කර නොතිබුණි. ඒ හේතුවෙන් වර්ෂය තුල නිවාඩු 45 ඉක්මවා නිවාඩු ලබාගෙන තිබුණු අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන්ගේ අඩවැටුප් සහ පඩි රහිත නිවාඩු සඳහා රජයට අයවිය යුතු මුදල් අයකිරීම යාවත්කාලීනව සිදු නිරීමටද නොහැකිවී තිබුණි.
(ii)	XII පරිච්ඡේදයේ 21.11 හා 22.4 ඡේද	අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අඩවැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර 96 වැනි පොදු ආකෘති පත්‍රයේ ලියා විගණකාධිපතිට මාස්පතා වාර්තා කළ යුතුය. නමුත් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අඩවැටුප් හා වැටුප් රහිත නිවාඩු සම්බන්ධ පොරතුරු ඉහත ආකෘති පත්‍රය යටතේ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii)	XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මියගිය , විශ්‍රාමගිය, සේවය අත්හැර ගිය ,ද්විත්ව පදනම මත වෙනත් ආයතනවලට ගිය සහ වෙනත් හේතූන් නිසා අමාත්‍යාංශයෙන් පිටතට ගිය නිලධාරීන්ගෙන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,532,054 ක හිඟණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂ අයනොවූ කාල පරාසය මාස 06 ත් අවුරුදු 03 ත් අතර විය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** මු.රෙ.104(4)	අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය වෙත ලබාදී තිබුණු රු.504,000 ක් වටිනා කැමරා උපකරණය 2025 මාර්තු 14 දින අස්ථානගතවී තිබුණු නමුත් මු.රෙ.104(4) යටතේ අවසාන පරීක්ෂණ වාර්තාව 2026 අප්‍රේල් 30 දින වන විටද නිකුත් කර නොතිබීම හේතුවෙන් අලාභය අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී පැවතුණි.
(ඇ)	**චක්‍රලේඛ විධිවිධාන**	
(i)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
a)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 12.1 ඡේදය	2024 නොවැම්බර් 25 දිනැති අංක 24/2/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව ජල සම්පාදන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධවීමේදී අතිරික්ත භාණ්ඩ හඳුනාගැනීම සඳහා මු.රෙ.756(4) ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩලයක් පත්නොකර ජල සම්පාදන අමාත්‍යාංශයේ පැවති රු.9,185,738 ක් වටිනා අතිරික්ත කාර්යාල උපකරණ වෙනත් රාජ්‍ය ආයතනවලට පවරා දී නිබුණි.

b)	2024 මැයි 29 දිනැති අංක 02/2024 දරන, 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් වක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 02(ආ) ඡේදය	ජීප් රථයකට 2023 දෙසැම්බර් මය අවස්ථා දෙකකදී සිදුවූ අනතුරුවලින් සිදු වූ හානි 2024 අගෝස්තු 27 දින රු.1,817,070 ක් හා 2025 ඔක්තෝම්බර් 17 දින රු.585,363 ක් වැය කර අලුත්වැඩියා කර තිබුණි. මෙම මුදල් රක්ෂණය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබූ අතර එම අලාභය රිට සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii)	2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ වක්‍රලේඛයේ 04(ii) ඡේදය	අමාත්‍යාංශය සතු ධාවන තත්වයේ නොතිබුණු වාහන 09 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	ආයතනයක කාර්යය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට පුහුණු අවස්ථාවන් ලැබෙන පරිදි මානව සම්පත් සංවර්ධන සැළැස්මක් පිලියෙල කර පුහුණු වැඩසටහන් සඳහා නිළධාරීන් සහභාගී කරවීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කල යුතු වූවද, අමාත්‍යාංශය විසින් 2025 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැළැස්මක් පිලියෙල නොකිරීම හේතුවෙන් විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රන සඳහා නිලධාරීන් තෝරාගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බැවින් අමාත්‍යාංශයේ ඉහළ තනතුරුවල සිටින සහ අදාල ක්ෂේත්‍රවලට කිසිදු සම්බන්ධතාවයක් නොමැති නිළධාරීන් අතලොස්සකට පමණක් විදේශීය පුහුණුව සඳහා ඉඩසළසා තිබුණි.
(vi)	2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු වක්‍රලේඛයේ අංක 03 ඡේදය සහ 1994 අප්‍රේල් 20 දිනැති	ශ්‍රී ලංකා රජය වෙත වෙනත් රාජ්‍යයන්, විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා විදේශ ආයතන විසින් ලබාදෙනු ලබන සියලුම විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගත යුතු වුවත්

රාජ්‍ය මිණුම් චක්‍රලේඛ අංක 30/94	බිම්බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන වෙත විදේශීය රටවලින් ලැබෙන අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශය විසින් 2025 වාර්ෂික ඇස්තමේන්තු මඟින් සියක් නගර සංවර්ධන වැඩසටහන් සඳහා රු.1,850,000,000 ක මුදලක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුල රු.712,498,502 ක වියදමක් දරා තිබුණි. නමුත් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ රු. මිලියන 572,740,000ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත වැඩසටහන් 07 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණු අතර රු.617,000,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත සංවර්ධන වැඩසටහන් 04 ක භෞතික ප්‍රගතිය සියයට 1 ත් සියයට 15 ත් අතර ඉතා අඩු අගයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කල රු.129,000,000 ක් වටිනා ව්‍යාපෘති 05ක් වර්ෂය තුල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු බවද රු.මි. 376,290,000 ක් වටිනා ව්‍යාපෘති 14 කගේ ප්‍රගතිය සියයට 14-60 අතර මන්දගාමී තත්වයේ පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගයෙන් නිරසර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් රු.100,000,000 ක් වෙන්කර නිබුණද ණයගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදය මත අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) සංචාරක ප්‍රවර්ධනය සහ නගර සන්නාමකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල අනුමැතීන් ලබාගැනීමේදී සිදුවූ ප්‍රමාදය මත 2025 වාර්ෂික අයවැය මඟින් වෙන්කල රු.447,944,813 ක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) 2025 අයවැය යෝජනාවක් අනුව අනුරාධපුර සහ අපද්‍රව්‍ය බැහැර කිරීම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මඟින් රු.750,000,000 ක් වෙන්කලද ව්‍යාපෘතියට අදාල දත්ත ඇස්කිරීම,

සැලසුම්කරණය හා අනුමැතිය ලැබීමේ ප්‍රමාදය මත එම ව්‍යාපෘතිය වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොනිබුණු අතර වර්ෂය තුළ රු.25,787,453 ක වියදමක් පමණක් දරා නිබුණු අතර ව්‍යාපෘතිය අවසන් කර නොනිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2021 වර්ෂයේදී ගම්පහ පැරණි පොදු වෙළඳපොළ ගොඩනැගිල්ල වෙනුවට මහල් හතරකින් යුතු නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර නිබුණද පසුව විෂයපථය සීමාකර මහල් තුනක් පමණක් ඉදිකිරීම සඳහා රු.356,330,559.81 (වැට් රහිත) ක වියදමක් දරා නිබුණි. නමුත් 2025 දෙසැම්බර් 31 වන විටද කාලදිගු 07 ක් ලබා දී නිබුණද එම මහල් තුනෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර හාරදී නොනිබුණි. තවද බිල්පත්වලට ගෙවීම් කිරීමේ ප්‍රමාදය මත රු.1,220,098 ක අමතර පොලී ගාස්තුවක්ද කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුව නිබුණි. තවද ගොඩනැගිලේ ඉදිකිරීම් නිමකර ලිඛිතව භාරදී නොනිබුණද, කොන්ත්‍රාත්කරුවරු දෝෂ වගකීම් කාලය තුල නිසිලෙස හඳුනාගැනීමෙන් තොරව, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත කොන්ත්‍රාත් ගිවිසුමට වගන්තියක් ඇතුලත් කර ගිවිසුම් සංශෝධනය කර, 2025 ජූලි 31 දින සිට 2026 සැප්තැම්බර් 30 දින දක්වා වලංගුවන පරිදි ඇපකරයක් ලබාගෙන රු.19,376,034 ක් වූ (වැට් රහිත) සම්පූර්ණ රැඳවුම් මුදලම 2025 ජූලි 24 දින කොන්ත්‍රාත්කරුට නිදහස් කර නිබුණි.

තවද රු.7,866,637ක් වැයකර ඉදිකල නාවකාලික කඩපේළිය වෙත පාරිභෝගිකයින් නොපැමිණීම හේතුවෙන් විසා දමා නිබුණු බැවින් එම නාවකාලික කඩකාමර ඉදිකිරීම සඳහා වැයකල රු.7,866,637ක වියදමද ඌණ උපයෝජිත වියදමක් වී නිබුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කළුතර පොදු වෙළඳපල සංකීර්ණය

(i) අමාත්‍යාංශය විසින් රු. 172,356,935 ක වියදමක් දරා ඉදිකරන ලද කළුතර පොදු වෙළඳපල සංකීර්ණය 2019 මාර්තු 05 දින කළුතර නගර සභාව වෙත පවරා දී නිබුණි. නමුත් එම කඩකාමර ඉතා සීමිත ඉඩ කඩක් සහිතව ඉදි කර නිබීම, ගොඩනැගිල්ල පාරිභෝගිකයින්ට පහසුවෙන් පිවිසීමට සහ එකවර දර්ශනය වන ආකාරයෙන් ඉදිකර නොනිබීම ආදී හේතු නිසා පාරිභෝගිකයින් නොපැමිණීම, ජල පහසුකම් ලබා නොදීම, ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී මුහුදු පුළා හමන දිගාව කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ලේ වහලය කැඩී බිඳී ගොස් නිබීම සහ වැසි දිනවල ගොඩනැගිල්ල තුලට වැසි ජලය පැමිණීම සහ විදුලි සැපයුම් සඳහා ඉදිකරන

ලද විදුලි මීටර් සොරුන් විසින් ගලවා ගෙන ගොස් නිබීම ආදී කරුණු හේතුවෙන් වෙළෙඳුන් විසින් ඒවායේ වෙළඳාම් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් රු. 172,356,935 ක වියදමක් දරා ඉදිකර නිබුණු මෙම තෙමහල් ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් සියයට 95 ක් පමණ වසර 07ක පමණ කාලයක් වසා දමා නිෂ්කාර්යයව පැවතුණි.

(ii) ගොඩනැගිල්ලේ විදුලි සෝපානය ක්‍රියා විරහිත තත්වයේ පවතින බවද ගොඩනැගිල්ල සඳහා සුදුසු පරිදි ආරක්ෂාව සපයා නොමැති බැවින් ඇතැම් උපකරණ හා සවිකිරීම් ඉවත්කර නිබුණු බවද නිරීක්ෂණය විය.

(iii) තෙවන මහලේ ඉදි කර නිබූ රැස්වීම් ශාලාව කිසිදු අවශ්‍යතාවයකට යෝග්‍ය නොවීම මත කිසිදු පාර්ශවයකට බදු පදනමින් හෝ ලබා දීමට නොහැකිවී නිබී ඇති අතර රු.2, 844,243 ක ඇස්තමේන්තුගත වියදමක් මත කළුතර නගර සභාව විසින් එහි ජල ටැංකිය හා සිවිලිම අලුත්වැඩියා කර රැස්වීම් ශාලාව වශයෙන් පවත්වා ගෙන යාමට කටයුතු කර නිබුණි.

(ආ) කළුතර දුම්රිය ස්ථානය හා බස්නැවතුම අතර වාණිජ සංවර්ධන ගොඩනැගිල්ල

(i) කළුතර දුම්රිය ස්ථානය හා බස්නැවතුම අතර වාණිජ සංවර්ධන ගොඩනැගිල්ල සැළසුම්කිරීම හා ඉදිකිරීම අදියර 04 ක් යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෘහ කොන්ත්‍රාත් ක්‍රමය යටතේ 2016 වර්ෂයේදී ප්‍රදානයකර නිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා රු.230,534,871 ක් වැයකර නිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද කඩ කාමර 173 න් 150 ක් කඩනිමියන්ට පවරාදී නිබුණද, වෙළඳාමක් නොමැතිව පාඩු ලබන හෙයින් කුලී මුදල් ගෙවා ගත නොහැකිව වසා දමා නිබුණි. ඒ අනුව අදියර 4 ක් යටතේ රු.230,534,871ක් වැය කර ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකිවී නිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කිරීමේදී වාහන නැවැත්වීම සඳහා පහසුකම් සලසා නොතිබුණු අතර ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක වැඩ පිළිවලක්ද ගොඩනැගිල්ල පිරිසිදු කිරීම සඳහා වැඩපිළිවලක්ද සලසා නොතිබුණි.

(ii) උක්ත ව්‍යාපෘතියේ II සහ IV අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් වී වසර 02 ක්ද ඉක්මවූ පසු ඒවායේ ඇස්තමේන්තු හා මිල ගණන් සඳහා ස්ථාවර කාක්ෂණ කමිටුව(STC) අනුමැතිය ලබා දී නිබුණි. ව්‍යාපෘතියේ අදියර II සඳහා වැඩ අවසන් වටිනාකමින් සියයට 90 ක් එනම් රු.65,941,794 ක් ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෙවා නිබුණු අතර ස්ථාවර කාක්ෂණ කමිටුව විසින් අනුමත කල මුදල රු. 56,244,684 ක්

වීමෙන් ආයතනය වෙත රු.11,151,676 ක් වැඩිපුර ගෙවා නිබුණු අතර එම මුදලින් රු.5,261,916 ක් වසර 07 කට පසුව රුඳවුම් මුදල් නිදහස් කිරීමෙදිද ඉතිරි රු. 5,889,760 ක මුදල අමාත්‍යාංශය විසින් එම ආයතනය වෙත ගෙවිය යුතුව නිබුණු වෙනත් මුදලකටද හිලවු කර නිබුණි.

(iii) ව්‍යාපෘතියේ IV වන අදියරය ඉදිකිරීම වෙනුවෙන් වැඩ අවසන් වටිනාකමින් සියයට 90ක් එනම් රු. 56,291,571 ක් ගෙවා නිබුණු නමුත් ස්ථාවර කාක්ෂණ කමිටුව විසින් අනුමත කර නිබුණේ රු.46,823,146 ක වැඩ වටිනාකමක් පමණි. ඒ අනුව රු.10,888,689 ක් අමාත්‍යාංශය විසින් වැඩිපුර ගෙවා නිබුණු අතර එම මුදලින් රු.5,066,433 ක් වසර 05කට පසුව රුඳවුම් මුදල් නිදහස් කිරීමේදී හිලවු කරගෙන නිබුණු අතර ඉතිරි රු.5,822,255 ක වටිනාකම එම ආයතනයට ගෙවිය යුතු වෙනත් මුදලකටද හිලවු කර නිබුණි. මිල රේටියන් සඳහා ස්ථාවර කාක්ෂණ කමිටු(STC) අනුමැතිය ව්‍යාපෘතිය ආරම්භයේදී ලබාගැනීම කෙරෙහි නිළධාරීන්ගේ අවධානය යොමු නොවීම හේතුවෙන් සංස්ථාව වෙත මෙලෙස වැඩිපුර රු.22,040,365 ක මුදලක් ගෙවීමට සිදුව නිබුණි.

(ඇ) 2025 වර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සැපයුම සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ වැසි ජලය එක්රැස් කිරීමේ වැඩසටහන සඳහා රු.මිලියන 50 ක් වෙන්කර නිබුණි. දිස්ත්‍රික්ක 11 ක පාසල් 95 කට හා වයඹ ජාතික විද්‍යාපීඨ 05 ක් වන සේ වැසි ජල ටැංකි 100 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2025 සැප්තැම්බර් මස පූර්ගලික යමාගමක් වෙත රු.7,337,240 ක් ගෙවීම කර නිබුණි. නියැදි විගණන පරීක්ෂාවට අනුව බොහෝ ටැංකි වැසි ජලය හැර වෙනත් ක්‍රමවලින් ලබා ගන්නා ජලය ගබඩා කිරීමට භාවිතා කර නිබු අතර වැසි ජලය ගබඩා කිරීමට සුදුසු පරිදි ස්ථාපිත කර නොමැති බැවින් හා වැසි ජලය එක්රැස් කර භාවිතා කිරීම පිළිබඳ පුහුණුවක් ලබාදී නොමැතිවීමෙන් බොහෝ ටැංකි භාවිතයට ගෙන නොතිබුණි. ලබාදුන් ටැංකි 24 ක් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවට අනුව ඒම ටැංකි 24 ම වැසි ජලය ගබඩා කිරීමට භාවිතාකර නොතිබුණි. එමෙන්ම 2025 ජූලි 07 දිනැති අංක DEV/02/RWH/2025/01 දරන අධ්‍යක්ෂ (සංවර්ධන) ගේ ලිපිය මඟින් දක්වා ඇති පරිදි ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නිළධාරීන් මඟින් වැසි ජලය රැස්කර ගැනීමට හා භාවිතයට අවශ්‍ය උපදෙස් ලබාදීම හා පසුවිපරම් නොකිරීමෙන් වර්ෂය තුළ රු.7,337,240 ක් වැයකර මිලදීගත් වැසිජල ටැංකිවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. එමෙන්ම මෙම වැඩසටහන යටතේ නවත් දිස්ත්‍රික්ක 08 ක වැසි ජලය රැස්කිරීමේ පද්ධති 400 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 32 ක ප්‍රතිපාදන වෙන්කර නිබුණද, 2025 දෙසැම්බර් 31 වන විට ප්‍රගතිය සියයට 45 ක් පමණක් විය.

(ඇ) නාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත වියදම රු.917,000,000 ක් වූ පිටිපන තලගල (අදියර 1) මාර්ගය හා බටහිර අන්තර් නුවමාරු මාර්ගය සංවර්ධන ව්‍යාපෘති සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් රු. 1,369,210,000 ක් වැයකර තිබුණු අතර ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටලුවක් හේතුවෙන් මෙම මාර්ගයන්හි වැඩ අවසන් කිරීමට නොහැකිව ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. 2025 වර්ෂයේදීද අත්පත්කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට රු.352,794,978 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණද ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටලු තවදුරටත් පැවතීම හේතුවෙන් මාර්ගය ඉදිකිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට අමාත්‍යාංශයට නොහැකිවී තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා දරන ලද වියදමද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන 26 ක් එකම ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමේ අරමුණින් පොළොන්නරුව මෙත්සිරිපාය පරිපාලන සංකීර්ණය සැළසුම්කර ඉදිකිරීමේ කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) වෙත රු.මිලියන 1,207 ක (බදු රහිත) වටිනාකමකට පවරා තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 15 දින ආරම්භ කර 2018 දෙසැම්බර් 15 දින නිම කිරීමට නියමිතගත වී තිබුණි. ගොඩනැගිල්ලේ මහල් හතරක ඉදිකිරීම් කටයුතු පමණක් අවසන් කර 2020 ඔක්තෝබර් මස ඉදිකිරීම් කටයුතු අතරමග නතර කිරීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් මෙතෙක් දරන ලද රු.මිලියන 1023 (බදු රහිත) ක එනම් සියයට 85 ක මුදලද නිෂ්ඵල වියදමක් වී තිබුණි.

තවද ඉතිරි වැඩ නිම කිරීම සඳහා සකසා තිබුණු රු.1,740,848,366ක (වැට් රහිත) සංශෝධිත ඇස්තමේන්තුව සඳහා 2025 දෙසැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල නිරණයෙන් අනුමැතිය ලැබීමට පෙර 2025 සැප්තැම්බර් 29 දින රු.43,337,689.85ක (වැට් සහින) අත්තිකාරම් මුදලක් අමාත්‍යාංශය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත ගෙවීමට කටයුතු කර තිබුණි. එමෙන්ම 2016-2018 කාලසීමාව තුල ගිවිසගත් පරිදි ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.485,276,223 ක එනම් මුල් මුලු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 39 ක විවලනයන් සඳහා නිර්දේශ ලබාදී තිබුණි. එය ප්‍රසම්පාදන අස්ථිත්වය හා රජය මත සුවිශාල වැයබරක් වන අතර මෙය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ කාර්යය පවරා තිබුණු නාගරික සංවර්ධන අධිකාරියේ සහ

අමාත්‍යාංශයේ වගකීම නිසි ලෙස ඉටුනොකිරීම නිසා රජයට දරන්නට සිදුවූ අමතර වැයකරක් වී නිබුණි.

මෙම ව්‍යාපෘතියේ වැඩ අතරමග නතර කල අවස්ථාව වන විට, සියළු වැඩ නිමකරන ලද මහල් 04 සම්බන්ධයෙන් විධිමත් භාර ගැනීමක් සිදු නොකිරීම සහ ගොඩනැගිල්ලේ ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් යොදා නොමැතිවීම හේතුවෙන් ගොඩනැගිල්ලේ සවිකර තිබූ විදුයුත් හා ඝනීභාරක්ෂක උපාංග කිහිපයක් අස්ථානගතවී නිබුණද එම අලාභහානි සම්බන්ධයෙන් මු.රෙ.102,103 හා 104 ප්‍රකාරව නටයුතු කිරීමට නොහැකි වී නිබුණි.

(ආ) සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (LRT) ආරම්භ කර වර්ෂ දෙකකට පසුව ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 21 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය පිළිවැය ඵලදායී නොවන ව්‍යාපෘතියක් ලෙස හදුනාගත් බව දක්වා නිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අවසන් කර නිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින දක්වා මෙම ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම රු.මිලියන 5,978 ක් වී නිබුණි. එසේම, මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අවසන් කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක සමාගමට සිදුවූ අලාභය ආවරණය කර ගැනීම සඳහා ගිවිසුමේ 2.9.5 දරන වගන්තිය ප්‍රකාරව ඇ.ඩො.මිලියන 1.25 ක්, ජපන් යෙන් මිලියන 229.53 ක් සහ ශ්‍රී ලංකා රු.මිලියන 131.58 ක් ගෙවීමට සිදුව නිබුණු බැවින් මෙම සියළු වියදම් නිෂ්කාර්යය වියදම් බවට පත්වී නිබුණි.

ණය ගිවිසුම නීත්‍යානුකූලව අහෝසි කර නොනිබුණු බැවින් එම ණය මුදල් රජයේ වෙනත් සංවර්ධන කාර්යයක් සඳහා උපයෝජනය කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඉදිරියේදී රජයට ඇතිවිය හැකි මූල්‍ය අලාභය අවම කරගැනීමට කටයුතු කිරීම සහ ව්‍යාපෘතිය වෙනුවෙන් හෙක්ටයාර් 21 ක පමණ ඉඩම් අතපත් කර ගෙන නිබුණද එම ඉඩම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණන දිනය වන විටද ගෙයා නොනිබුණු බැවින් එම ඉඩම්ද නිෂ්කාර්යයව පැවතුණි.

පාරිසරික,නාක්ෂණික,ආර්ථික හා මූල්‍යමය වශයෙන් ඵලදායී ව්‍යාපෘතියක් ලෙස හදුනා ගෙන නිබුණු මෙම ව්‍යාපෘතිය විධිමත් හා කාර්තික විශ්ලේෂණයකින් තොරව ඒකපාර්ශවීයව අවසන් කිරීම නිසා ශ්‍රී ලංකාවට සිදුවූ ආර්ථිකමය හා මූල්‍යමය නොවන අවාසිදායක තත්වයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ගෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට සිදුවූ අලාභය අවමකර ගැනීමට අවශ්‍ය කිසිදු පියවරක් විගණන දිනය දක්වාම ගෙන නොනිබුණි.

(ඇ) හම්බන්තොට දිස්ත්‍රික්කය, කැගෙනහිර පළාත, බස්නාහිර පළාත හා කොළඹ නගරය වශයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2023 දෙසැම්බර් 14 දින ඇ.ඩො. මිලියන 0.41 කට සමාන

රු.137,100,000ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. 2025 වාර්ෂික ඇස්තමේන්තුව මහින්ද රු.215,000,000 ක් වෙන්කර තිබුණු අතර එයින් රු.30,971,488 ක් වැය කර තිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.168,071,488ක් වැයකර තිබුණි. නමුත් මෙම කාර්යය පවරන ලද කොන්ත්‍රාත් ආයතනය විසින් එම කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොකරන බව ව්‍යාපෘතියේ තාක්ෂණික උපදේශන ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇති බැවින් අදාල සැළැස්ම ඉදිරියට ක්‍රියාත්මක වී නොනිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මෙතෙක් වැය කර නිබුණු රු.168,071,488 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී නිබුණි. තවද මෙම කාර්යය පවරන ලද කොන්ත්‍රාක් ආයතනය විසින් 2018 වර්ෂයදිද බස්නාහිර පළාත හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් සකසන ලද සැලසුම්, භාවිතයට ගත නොහැකිවී නිබුණු පසුබිමක නැවතත් ප්‍රධාන සැලසුම් සකස් කිරීමට එම ආයතනයම තෝරා ගැනීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය. තවද මෙම ආයතනයට පවරණ ලද කාර්යයභාරය ගිවිසුම්ගත පරිදි අදාල කාල සීමාව තුල සිදු නොකිරීම සම්බන්ධයෙන් අදාල ආයතනයට විරුද්ධව කටයුතු කර නොනිබුණි. එමෙන්ම හම්බන්තොට මහනගර සැළැස්ම සැකසීම වෙනුවෙන් මෙම ආයතනයට ගෙවන ලද වැඩ ආරම්භකිරීමේ අන්තිකාරම මුදලින් රු. 58,011,750ක් අයවිය යුතුව නිබුණි.

4.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) උතුරු සහ නැගෙනහිර පළාත්වල වලදමා ඇති බිම් වෙඩි සහ පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමේ බිම් වෙඩි සඳහා ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය (NMAC) සඳහා 2009 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 39,117.84ක මුදලක්ද 2025 වර්ෂය සඳහා ඇ. ඩො. මිලියන 15.5කට සමාන රු.මිලියන 4,762.7ක මුදලක්ද ලෙස එකතුව රු. මිලියනක 43,880.54ක් බිම් බෝම්බ ඉවත් කිරීමේ නිරත දේශීය රාජ්‍ය නොවන සංවිධාන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වෙත විදේශ දායක රටවල් විසින් ලබා දී නිබුණි. රජයේ දායකත්වය 2010 වර්ෂයේ සිට 2024 දක්වා රු. මිලියන 4.168.1ක්ද 2025 වර්ෂය සඳහා රු. මිලියන 70ක්ද වශයෙන් එකතුව රු. මිලියන 4,238.10ක් 2025 දෙසැම්බර් 31 දින වන විට වැය කර නිබුණි. බිම්බෝම්බ ඉවත්කිරීමේ තත්ත්ව වාර්තා අනුව මූලිකව හඳුනාගන්නා ලද අනතුරුදායක ප්‍රදේශය වර්ග මීටර 1,327,607,653ක් වූ අතර 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් බිම් වෙඩි සහ පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමට ඇති ප්‍රදේශය වර්ග මීටර 21,508,361ක් විය. ඒ අනුව 2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ තර්ජනයෙන් මිදුන රටක් බවට පත්කිරීමේ මූලික අරමුණ ඇතිව ආරම්භ

කරන ලද මෙම වැඩසටහන, 2025දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 5 ක් ගතව තිබුණද වැඩසටහනෙහි අරමුණු ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් සාමාන්‍ය ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ශාස්ත්‍ර ආයතනවලට යෑපු කොන්ත්‍රාත් පදනමින් ලබා දී තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගිවිසුම්ගත කාලරාමුව තුල නිම කිරීමට නොහැකි වීම නිසා නියමිත කාලයේදී එම ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එම කොන්ත්‍රාත්තුවල මූලික ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර (BOQ) පිලිබඳ විස්තර, ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ව්‍යාපෘතිය ආරම්භයේදී හා කොන්ත්‍රාත් වැඩ අවසන් කල පසු යන අවස්ථා දෙකේදී ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු නමුත් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල මූලික ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර (BOQ) පිලිබඳ විස්තර, ආරම්භයේදී තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් නොකර අවසාන බිල්පත් පමණක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර එම බිල්පත් සඳහා අනුමැතිය ලැබීමේදී වසර 1 සිට 7 ක පමණ කාල පරාසයක ප්‍රමාදයන් සිදුව තිබුණි. එබැවින් එම ව්‍යාපෘති ගිවිසුම්ගත කාලරාමුව තුල නිම කිරීමට නොහැකි වීම නිසා ඉලක්කගත කාලයේදී ව්‍යාපෘතිවලින් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන්, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාතුවේ කලවැඩ වටිනාකමින් සියයට 90ක් දක්වා කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණු නමුත් බොහෝ අවස්ථාවලදී එලෙස කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදල ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන මුදලට වඩා වැඩි අගයක් වීම හේතුවෙන් අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත වැඩිපුර මුදල් ගෙවා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් වාර්ෂික අයවැය මඟින් වෙන්කරන මුදල් වසර ගණනාවක් තිස්සේ වෙනත් ලාභ උපයන ආයතන වෙත රඳවා තබා ගැනීමට අවස්ථාව සැළසීම නිසා අමාත්‍යාංශයේ අනෙකුත් සංවර්ධන කටයුතු මන්දගාමී වී තිබුණි.

(ඇ) නිද්‍රාශ්‍රිත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශවල, ජලය පෘෂ්ඨීය වැළඳෙන රෝග නිවාරණය පිළිබඳ වැඩසටහන සඳහා 2025 වර්ෂයට අදාළව සකස් කරන ලද සැළැස්මෙහි ඇතුලත් ඇස්තමේන්තුගත පිරිවැය රු.174,730,000 ක් වූ උප ක්‍රියාකාරකම් 07 කට අදාළ කාර්යයන් 2025 දෙසැම්බර් 31 වන විටත් නිමකර නොතිබුණි. එදින වන විට එම ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ අදියරයන් යටතේ පැවතුණි.

(ඈ) ග්‍රාමීය සහ ප්‍රාදේශීය පානීය ජල සැපයුම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් මඟින්

නළ ළිං 10 ක් ඉදිකිරීම සඳහා රු. 10,000,000 ක් 2025 වර්ෂයේ වෙන්කර තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට රු.4,800,000 ක් වැයකර නළ ළිං 03 ක් පමණක් ඉදිකර තිබුණි. එමෙන්ම මේ යටතේ සැළසුම්කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.64,980,000 ක් වූ ජල නල සැපයීම, රථ වැලි පෙරහන බෙදාහැරීම, මලාපවහන පද්ධතිය දිරිස කිරීම, අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සඳහා වැසිකිළි 50 ක් ඉදිකිරීම සහ ජලනල සැපයීම යන ක්‍රියාකාරකම් 06 හි ප්‍රගතිය සියයට 40 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඉ) යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු.මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 09 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් නියමිත කාලසීමාව තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. එබැවින් 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිමකිරීමේ වගකීමත් සමඟම සමස්ත ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණ ද යාපනය නගර සභාව විසින් එම තීරණය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඉතිරි කටයුතුද අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේම සිදු කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2025 මැයි 31 දින වන විට අවසන් කිරීම සඳහා රු.මි. 2,568.47 ක සංශෝධිත ඇස්තමේන්තුවක් සකසා ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2025 වර්ෂය වෙනුවෙන් රු. මි. 400ක් වෙන්කර තිබුණු අතර රු. මි. 369.84 ක් වැයකර තිබුණි. නමුත් ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 31 දින වන විටද සියයට 81 ක භෞතික ප්‍රගතියක් හා රු.මි. 553.26 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි.

කෙසේවුවද ව්‍යාපෘතිය ආරම්භකර වසර 7 කට ආසන්න කාලයක් ගතවී ඇතත් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2009 වර්ෂයේ යුද්ධය අවසන් වීමෙන් පසු උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස/ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර එනැන් පටන් 2024 දෙසැම්බර් 31 දින දක්වා උතුරු නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 08 ක නිවාස 36736 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 29,813 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මේ සඳහා රු.මි. 2,468 ක් දරා තිබුණු අතර 2025 දෙසැම්බර් 31 දින වන විට සමස්ත වියදම රු.මි.32,281 ක් විය. නමුත් යුද්ධය නිම වී වසර 16 ක් ගත වී තිබුණ ද, යුද්ධයෙන් අවතැන්වූවන් නවදුරටත් හඳුනාගැනීමින් පවතින අතර නැවත පදිංචි කිරීමේ කටයුතු ද නිම වී නොතිබුණි.

4.2. විදේශ ආධාර ව්‍යාපෘති

(අ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය

අඩු ආදායම් ලබන ප්‍රජාවගේ නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීම් සහ දැරිය හැකි නිවාස ඉදිකිරීම හා ඉඩම් නැවත සංවර්ධනය කිරීම සඳහා වන ආයෝජන තුළින් කොළඹ ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත්, ඒ හා සම්බන්ධ පද්ධති හා ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමෙන් අරමුණින් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු (AIIB) විදේශීය ණය ආධාර යටතේ 2019 ජූලි 22 දින කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. යෝජිත ව්‍යාපෘතිය නිවාස ඉදිකිරීම්, ඉඩම් ප්‍රතිසංවර්ධනය, තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය යන ප්‍රධාන ව්‍යාපෘති සංරචක තුනක් හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව සංරචක 1 යටතේ නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක් යටතේ නිවාස ඒකක 5346 ක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතිය විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘතියේ කාර්යසාධනය පහත පරිදි වේ.

(i) ස්ටෙඩියම්ගම නිවාස 1000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

2020 මැයි මස 04 දින ආරම්භ කර 2023 ඔක්තෝබර් 15 දින වැඩ අවසන් කිරීමට සැලසුම් කළ මෙම නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය රු.මි. 5,950.95 ක ඇස්තමේන්තුගත වටිනාකමකට ප්‍රද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත පවරා තිබුණද එදිනට වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. පසුව අවිනිශ්චිතතාවයන් (Contingency) වෙනුවෙන් සියයට 49.16ක් දක්වා අමතර මුදලකින් කොන්ත්‍රාත් වටිනාකම වැඩිකර 2025 පෙබරවාරි 28 දක්වා දින දිරිස කිරීම් ලබාදී තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රවේශ මාර්ග සංවර්ධන කටයුතු වෙනම ප්‍රසම්පාදන කටයුත්තක් ලෙස සිදු කිරීමට 2024 දෙසැම්බර් 24 දිනැති කැබිනට් මණ්ඩල තීරණය අනුමැතිය ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එමෙන්ම රු.මි. 374 ක වැඩ වටිනාකමක් මත පවරන ලද ගුරුත්ව මලාපවහන නල මාර්ගය ඉදිකිරීමේ කටයුතු 2025 පෙබරවාරි 28 දින ආරම්භකර 2025 දෙසැම්බර් 28 දින නිමකල යුතුව පැවතුණද 2025 දෙසැම්බර් 31 දින වන විටත් රු.23,441,500ක මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 68 ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. තවද 2024 ජනවාරි 23 දින ලංකා විදුලිබල මණ්ඩලයට සම්පූර්ණ ගෙවීම් සිදුකර නිබුණද A, B, C හා D යන ගොඩනැගිලි ඒකකයන්ගේ විදුලි මීටර් සවිකර කොනිබුණි. මෙම නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගුරුත්ව මලාපවහන නල මාර්ගයේ ඉදිකිරීම, විදුලි සැපයුම් හා ජල සැපයුම් ලබාදීම සම්බන්ධයෙන් වූ ප්‍රමාදය හේතුවෙන් එම

කටයුතු නිම වන තෙක් ඉදිකිරීම් පරිශ්‍රයේ ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාස 11ක කාලයක් සඳහා රු.45,265,000 ක පිරිවැය යෝජනාවක් ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් රු.19,351,087 ක අතිරේක මුදලක් ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට දැරීමට සිදුවී තිබුණි. ඉහත හේතූන් නිසා එම නිවාස ඒකක 1000 පදිංචිකරුවන් වෙත ලබාදීමට නොහැකි වීම හේතුවෙන් නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට ප්‍රමාද වී තිබුණි.

(ii) **කොළඹගේ මාවත නිවාස ඒකක 624 ක් ඉදිකිරීම ව්‍යාපෘතිය.**

2020 ජුනි 01 දින ආරම්භ කර 2023 මැයි 16 වැඩ අවසන් කිරීමට යෝජිතව පැවති මෙම නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මි. 3,126.56 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත පවරා තිබුණද එදිනට වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. එබැවින් කොන්ත්‍රාත් මුදලින් සියයට 15 ක් වූ අවිනිශ්චිතතාවයන් (Contingency) සියයට 93.61 ක් දක්වා වැඩිකර දින දිර්ඝ කිරීම් ලබා දී තිබුණි. උක්ත ව්‍යාපෘතියේ මලාපවහනය කොළඹ මහනගර සභා මලාපවහන පද්ධතියට යා කිරීමට මූලිකව යෝජනා වී තිබුණ ද වර්තමානයේ එම පද්ධතියේ පවතින ගැටලු හේතුවෙන් මලාපවහන පොම්පාගාරයක් ස්ථාපනය කිරීමට කොළඹ මහනගර සභාව යෝජනා කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුමේ පළමු සංශෝධනය මගින් වීවලතා නියෝග අංක 2 යටතේ රු.මි. 287ක වැඩ වටිනාකමක් මත පවරන ලද මලාපවහන පොම්පාගාරය හා නල සම්බන්ධතාවය ඉදිකිරීමේ කටයුතු සඳහා 2026 පෙබරවාරි 26 දින දක්වා කාලය දිර්ඝ කිරීම් ලබාදී තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මි. 170 ක මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 94ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ ප්‍රවේශ මාර්ග සංවර්ධන කටයුතු වෙනම ප්‍රසම්පාදන කටයුත්තක් ලෙස සිදු කිරීමට 2024 දෙසැම්බර් 24 දිනැති අංක අමප/24/2255/814/014 දරන කැබිනට් නිරණය මගින් අනුමැතිය ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මලාපවහන පොම්පාගාරය ඉදිකිරීමේ ප්‍රමාදය හේතුවෙන් එම කටයුතු නිම වන තෙක් ඉදිකිරීම් පරිශ්‍රයේ ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාස 5ක කාලයක් සඳහා රු.මි. 19 ක පිරිවැය යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් රු.මි. 10 ක අතිරේක මුදලක් ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට දැරීමට සිදුවී තිබුණි. ඉහත ප්‍රමාද දෝෂ හේතුවෙන් නිවාසලාභීන් වෙත එම නිවාස ඒකක 624 ලබාදීමට නොහැකිව තිබුණි.

(iii) ඔබෙසේකරපුර නිවාස ඒකක 300 ක් ඉදිකිරීම ව්‍යාපෘතිය.

කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 මාර්තු 28 වන දින අහරමඟ වැඩ අවයත් කරන ලද මෙම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ජාතික නරඹකාරී ලංසු කැඳවීම යටතේ 2025 මැයි මස 14 දින ලංසු කැඳවා නිබුණි. තාක්ෂණික ඇගයීම වාර්තාවේ සංශෝධනය සම්බන්ධව හා ලංසුකරුවන්ගේ පැමිණිලි සලකා බැලීම සඳහා Standard High Level Procurement Committee වෙත එම තොරතුරු ඉදිරිපත්කර නිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සැලසුම්කල පරිදි සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා පත්කර නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම කටයුතු නැවත ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඔබෙසේකරපුර නිවාස ව්‍යාපෘතියට අදාලව රු. 17,384,970 ක් වටිනා කි.ග්‍රෑම් 98,091.14 ක යකඩ ප්‍රමාණයක් (reinforcement steel) සෙන්සිරිපාය පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් වසර ගනාරක කාලයක සිට නිශ්කාර්යව පවතී.

(iv) ඇපල්වත්ත නිවාස ඒකක 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

2020 ඔක්තෝබර් 27 දින ඉදිකිරීම් වැඩ ආරම්භ කර 2023 ඔක්තෝබර් 17 දින වැඩ නිම කිරීම සඳහා රු.මි. 3,890 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහ විදේශීය ආයතනයකට භාර දී තිබූ අතර මෙම නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස ඒකක 700 ක් ඉදිකිරීමට යෝජිතව පැවතුණි. උක්ත ව්‍යාපෘතිය සඳහා 2025 අගෝස්තු 27 දින දක්වා දීර්ඝ කිරීම් 10 ක් මඟින් දින 656ක කාලයක් ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 70.79 ක් නිමකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් 2025 දෙසැම්බර් 31 දින වන විට සියයට 56.24 ක භෞතික කාර්යසාධනයක් පමණක් ළඟාකර ගෙන තිබුණි. 2025 දෙසැම්බර් 31 දින වන විටද ඉහා පහළ කාර්යසාධනයක් ළඟාකර ගෙන තිබූ උක්ත ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කර රු.389,000,000 ක අතිරේක අන්තිකාරම් මුදලක් ලබා දී කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හැකියාව ශක්තිමත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අතිරේක අන්තිකාරම් මුදලින් රු.295,722,370.27ක් එනම් සියයට 76ක ප්‍රමාණයක්ම ගෙයකරගෙන යුතුව පැවතුණි. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ උප වගන්තියක් අනුව 2025 ජූනි මස 3 දින වන විට සම්පූර්ණ කලයුතු ක්‍රියාකාරකම් 10 අතුරින් 9ක් ම සාක්ෂාත් කිරීමට නොහැකිවී නිබුණි. ව්‍යාපෘතිය සඳහා යොදාගත යුතු සාමාන්‍ය ශ්‍රම සංඛ්‍යාව 453 ක් වුවද 160 ක තරම් ප්‍රමාණවත් නොවූ ශ්‍රම ශක්තියක් පවත්වා ගැනීමද ඉහත ප්‍රමාදයට

බලපා තිබුණි. අනුකරණ නිවසේ (mockup house) කටයුතු අවසන් කර නොකිරීම, A,B හා C ගොඩනැගිලි කොටස් සම්බන්ධ වන යෝජිත පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැතිවීම් සහ තාවකාලික ආරක්ෂක වැට සවි කිරීමේ කටයුතු කවමත් අවසන් කර නොතිබීම් හේතුවෙන් මෙම නිවාස ව්‍යාපෘතිය පදිංචි කරුවන්ට ලබා දීමට නොහැකි වීම හේතුවෙන් මෙමගින් ලබාදීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබාදීමට නොහැකි වී තිබුණි.

(v) **ෆර්ගියුසන් මාවත නිවාස ඒකක 750 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය 2021 ජනවාරි 20 දින ආරම්භ කර 2024 ජනවාරි 04 වැඩ නිමකිරීම සඳහා විදේශීය ඉදිකිරීම් සමාගමක් වෙත රු.මි. 3,923 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පවරා තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විටද සියයට 20.81 ක භෞතික කාර්යසාධනයක් පමණක් ළඟාකර ගෙන තිබුණි. ඉතාමත් අඩු කාර්යසාධන මට්ටමක් ළඟාකර ගෙන ඇති කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ශක්තිය තහා සිටුවීම සඳහා 2024 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වෙනස්කර රු. 392,255,433 ක අතිරේක අත්තිකාරම් මුදලක් නැවත ලබා දීමට කටයුතු කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලද අපේක්ෂිත කාර්යසාධනය ලඟාකරගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අතිරේක අත්තිකාරම් මුදලින් රු.366,111,227ක් එනම් සියයට 93ක ප්‍රමාණයක්ම අයකරගත යුතුව පැවතුණි. තවද නිවාස ව්‍යාපෘතියේ ගෞඛ්‍ය, ආරක්ෂාව හා පාරිසරික රෙගුලාසි අඛණ්ඩව උල්ලංඝනය වන බව ව්‍යාපෘතියේ ඉංජිනේරු නියෝජිත වන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් අනාවරණය කර තිබුණි.

(vi) **මාදම්පිටිය නිවාස ඒකක 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය 2021 මැයි 20 දින ආරම්භ කර 2024 මැයි 03 දින වැඩ නිම කිරීමට සඳහා දේශීය පුද්ගලික සමාගමක් වෙත රු. මි. 3,937 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පවරා දී තිබුණද එදිනට වැඩ අවසන් නොවීම මත 2026 මාර්තු 07 දින දක්වා දින දීර්ඝකිරීම් ලබාදී තිබුණි. ව්‍යාපෘතියේ යෝජිත ගුරුන්ව මළාපවහන නල මාර්ගයේ වැඩිදියුණු කිරීමේ කටයුතු රු.684,989,330 ක මුදලකට කවත් පුද්ගලික සමාගමක් වෙත 2024 සැප්තැම්බර් 24 දින ප්‍රදානය කර තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විට සියයට 10 මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 30 ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. කොන්ත්‍රාත්කරුට වැඩබිම භාරදීමෙදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් දින 100ක කාලදීර්ඝ කිරීමක් (EOT) ලබාදී තිබුණු අතර එම ප්‍රමාදය

හේතුවෙන් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව රු.42,827,688 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. කෙසේ වුවද 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මි.4,196.54 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් නොවීම නිසා මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීම ප්‍රමාද වී තිබුණි.

4.3 විදේශීය ව්‍යාපෘති ඇවරකිරීම

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ(UPPF) ණය ගිවිසුමට අනුව, ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ. ඩො. මි. 5.27 කට සමාන රු. මි. 1064.79 ක්ද ශ්‍රී ලංකා රජය විසින් ඇ.ඩො. මි. 1.15 කට සමාන රු. මි. 232.35 ක්ද යෙදවීමටද ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 මාර්තු 06 වන දින ආරම්භ කර 2021 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් අපේක්ෂිත කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් එකඟ වූ ණය මුදලින් ඇ.ඩො. මි. 1.33 කට සමාන රු. මි. 434.59 ක් වියදම් කර මෙම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින නිම කර තිබුණි. නමුත් 2025 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘති ඇවරකිරීමේ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

4.4 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 33,237.76 ක් වූ කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 29 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරීමට ද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතියේ කසළ හුවමාරු මධ්‍යස්ථානය (A), සනීපාරක්ෂක බිම් පිරවුම (B) සහ දුම්රිය මාර්ග දිර්ඝ කිරීම(C) යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු රු.මි.25,377.95 (ඇ.ඩො. මි. 100.96) ක වටිනාකමට වීන සමාගමක් වෙත පවරා තිබුණු අතර අවශ්‍ය කරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය(D) සඳහා රු.මි.2,963.61 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2025 දෙසැම්බර් 31 වන විට රු.මි.21,563.14 ක් වැය කර තිබුණු ව්‍යාපෘතියේ A B සහ C පැකේජ 03 හි කටයුතු පැවරුණු වීන සමාගමේ ප්‍රමාදය නිසා වරින් වර දිනා දිර්ඝ කිරීම් ලබාදී තිබුණු අතර 2025 නොවැම්බර් 30 දින වන විට එහි වැඩ අවසන් කළ යුතුව තිබුණු මෙම ඉදිකිරීම් කටයුතු 2025 දෙසැම්බර් 31 වන විට ද අවසන් කර නොතිබුණි. දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මි. 8.27ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර දුම්රිය දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ලබා දී තිබුණු අතර බහාලුම් පෙට්ටි 94 ක් ඇ.ඩො. මි. 0.8 ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර තිබුණි. නමුත් විගණන දිනය වන විට එම බහාලුම් පෙට්ටි ව්‍යාපෘතියේ අරමුණු සඳහා යෙදවීමට නොහැකි තත්වයක පැවතුණි.

2025 දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශය විසින් මෙම සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි. 26,029.06 ක් වැයකර නිබුණු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වසර 09ක් පමණ ගතවී නිබුණද ඉදිකිරීම් කටයුතු අවසන් වී නොමැති බැවින් ව්‍යාපෘතිය සක්‍රිය කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී නිබුණි.

4.5 ප්‍රසම්පාදනයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානයේ 2025/2026 කාලයට අදාල පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත්තුව තෝරාගැනීම සඳහා 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.1.2 ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් සිදු නොකර 2025 අප්‍රේල් 25 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමවේදය අනුගමනය කර මිල කැඳවීම් සිදුකර 2025 අගෝස්තු මස සිට සිදුකිරීමට සේවාව පිරිනමා නිබුණි. එසේ වුවද 2025 මාර්තු සිට අගෝස්තු දක්වා මාස 05 ක කාලය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව රු.1,075,259 ක් ගෙවා නිබුණි.

(ආ) අමාත්‍යාංශයේ 2025 වාර්ෂික ප්‍රම්පාදන සැළැස්ම අනුව පරිගණක උපාංග මිළදී ගැනීම සඳහා රු.100,000 ක් පමණක් වෙන්කර නිබුණු අතර 2025 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් කාර්යාල උපකරණ මිළදී ගැණුම් වැය විෂයය සඳහා රු. 1,500,000 ක් පමණක් වෙන්කර නිබුණි. නමුත් සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.6 ඡේදයේ සඳහන් සුවිශේෂී තත්ත්වයන් යටතේ පමණක් භාවිත කළ යුතු සෘජු කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාවෙන් අයිෆයිව් (i5) ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 37 ක් මිළදී ගැනීම සඳහා සඳහා රු. 9,801,670 ක් වැය කර නිබුණි. නවද 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.6(ආ) ඡේදය ප්‍රකාරව ප්‍රතිග්‍රහන ලිපිය නිකුත් කිරීමට පෙර,කොන්ත්‍රාත්තුවේ පිරිවැය සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන පවතින බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තහවුරු කර ඇත යුතු වුවද, එම වැය විෂයයයේ ප්‍රතිපාදන පවතින බව තහවුරු කර ගැනීමෙත් තොරව අමාත්‍යාංශය විසින් මෙම පරිගණක මිළදී ගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා නිබුණි.

4.6 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 ඔක්තෝබර් 22 දින යාපනය ප්‍රදේශයේදී රු.55,000,000 ක් වටිනා V8 වර්ගයේ නිලරථය අනතුරට ලක්වී නිබුණි. මු.රෙ.104 පරීක්ෂණ වාර්තා අනුව වාහන දෙකෙහිම රියදුරන්ගේ අපරීක්ෂාකාරී රිය ධාවනය මෙම අනතුරට හේතුව බව හා රක්ෂණ

ආයතනයෙන් ආවරණය නොවන ඉතිරි අලුත්වැඩියා වියදම් වාහනයේ රියදුරාගෙන් අයකිරීමට පරීක්ෂණ කමිටුව විසින් නිර්දේශ ලබාදී තිබුණද මෙම වාහනයේ රියදුරු සම්බන්ධයෙන් මු.රෙ.105(4)ප්‍රකාරව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සහ රු.6,512,307 ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. රු.17,935,458 ක අලුත්වැඩියා වියදම් නියෝජිත ආයතනය වෙත ගෙවීමට ප්‍රමාදවීම හේතුවෙන් වාහනය අමාත්‍යාංශය වෙත නිදහස් නොකර රඳවාගෙන සිටි බැවින් මෙම වාහනය වසර 02 මාස 06 ක පමණ කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2024 දෙසැම්බර් 18 දින නිකුත් කරන ලද අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද සුඛෝපභෝගී වාහන අපහරණය සඳහා හඳුනාගැනීමේ මණ්ඩලය විසින් අමාත්‍යාංශයට අයත් සුඛෝපභෝගී වාහන 39 ක් ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන/ආයතනයේ භාවිතය සඳහා අවශ්‍ය නොවන සුඛෝපභෝගී වාහන ලෙස හඳුනාගෙන තිබුණු නමුත් එම වාහනවලින් 23ක් එනම් සියයට 59 ක්ම විශාල වියදමක් දරමින් අමාත්‍යාංශය විසින් තවදුරටත් පරිහරණය කිරීම නිසා එම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

අමාත්‍යාංශය විසින් තීරුබදු රහිතව හෝ වෙනත් විශේෂ කොන්දේසි යටතේ ආනයනය කරන ලද වාහන 13 ක කොන්දේසි නිසි පරිදි අවලංගු කරගැනීමෙන් තොරව අපහරණ ක්‍රියාවලියට යොමු කර තිබුණු අතර වාහන අපහරණ දැන්වීම් පළකරන අවස්ථාවේදී එම බදු මුදල් වාහන ගැනුම්කරුවන්ගෙන් අයකිරීමට සිදුවන බව සඳහන් නොකිරීම නිසා අදාල බදු මුදල් වාහන ගැනුම්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකිවීම මත රේගු බදු රු.4,363,873 ක් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙතද සුඛෝපභෝගී බදු හා දඩ මුදල් රු.1,150,000 ක් මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙතද ගෙවීමට අමාත්‍යාංශයට සිදුව තිබුණු බැවින් අමාත්‍යාංශයට රු.5,513,873ක පාඩුවක් සිදුව තිබුණි.

4.7 පාඩු හා හානි

2024 ජනවාරි 23 දින කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේදී අමාත්‍යාංශයට අයත් වාහනයක් තවත් වාහනයක ගැටී සිදුවූ අනතුරින් එහි ගමන්ගත් නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ආරක්ෂක නිළධාරියෙකු ජීවිතක්ෂයට පත්වී තිබුණු අතර වාහනය පූර්ණහානි වී තිබුණි. එහෙත් විගණිත දිනය දක්වාම වාහනයට සිදුවූ අලාභය රක්ෂණ ආයතනයෙන් ආවරණය කර නොතිබුණි. තවද 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව මෙම ජීප් රථයට අනතුර සිදු වී 2026

මාර්තු 31 දින වන විට වසර 2 නට වැඩි කාලයක් ගත වී තිබුණද මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ සිදුකර අනතුරට වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි.

4.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 වර්ෂය තුළ නිකුත් කරන ලද එක් විගණන විමසුමකට පිළතුරු ලබා දී නොතිබුණි. තවද 2025/2026 වර්ෂ තුල නිකුත් කරන ලද විගණන විමසුම් 11කට පිළිතුරු ලබා දීමේදී මාස 02 සිට මාස 05 දක්වා අතර කාල පරාසයක ප්‍රමාදයන් සිදුව තිබුණි.

4.9 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ නිලධාරීන් 28 දෙනෙකු 2025 වර්ෂය තුල විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ 19 ක් සඳහා සහභාගී වී තිබුණු අතර ඔවුන්ට අනියම් වියදම් සහ උණුසුම් ඇදුම් දීමනා ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් රු. 2,812,168 ක් වැයකර තිබුණි. එම නිලධාරීන් 28 දෙනාගෙන් 8 දෙනෙකු විසින් සංචාරය නිමකර මසක් ඇතුලත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව මාස 4-8 ක කාල ප්‍රමාදයකින් යුතුව ඉදිරිපත් කර තිබුණි. තවද විදේශීය පුහුණු වැඩසටහන අවසන් වූ පසු, ඒ සඳහා සහභාගී වූ නිලධාරීන් විසින් ලබා ගන්නා ලද පුහුණුව තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් නිර්ණය කර අදාල ආයතන ප්‍රධානියා විසින් එම නිලධාරීන්ගේ පුහුණුව තක්සේරු කළ යුතු බවත්, ලබාගත් දැනුම සහ කුසලතා අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟ බෙදා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී තිබුණු නමුත් අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ''2021-2025 කාලය තුළ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කොන්ත්‍රාත් 74 ක් සඳහා අමාත්‍යාංශය මඟින් කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.2,757,593,572 ක මුදලින් 2025 දෙසැම්බර් 31 වන විට නිරවුල් නොවූ මුදල රු.1,583,101,091 ක් විය. තවද මෙම කොන්ත්‍රාත්වලින් කොන්ත්‍රාත් 05 ක් වෙනුවෙන් ගෙවූ රු.32,902,577 කින් කිසිදු කොන්ත්‍රාත් කාර්යයක් සිදු නොකළ බවට 2026 මැයි 20 දින වාර්තා කර තිබුණි.

එසේම අත්තිකාරම් ශේෂයන් පිළිබඳව ව්‍යාපෘති නියාමනය හා මෙහෙයවීම භාරව සිටින රේඛීය අමාත්‍යාංශය සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම් පැවරී ඇති ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් වාර්තාගත තොරතුරු අතර පරස්පරතාවයක් පැවතිණි. 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත් 07ක් වෙනුවෙන් ලබා දී තිබූ රු.115,697,727 ක අත්තිකාරම් මුදලින් රු.58,687,024 ක් අයවිය යුතු ලෙස

අමාත්‍යාංශය වාර්තා කර තිබුණද මේ මුළු මුදලම අයකර ඇති බව ජල සම්පාදන මණ්ඩලයේ වාර්තා කර තිබුණි. එමෙන්ම අමාත්‍යාංශය මගින් කොන්ත්‍රාත් 03 ක් වෙනුවෙන් ලබා දී තිබූ රු. 287,556,913ක අත්තිකාරම් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ වාර්තා වී තිබුණේ රු. 143,778,457ක් වශයෙනි.

(ඇ) 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ජල සම්පාදන අමාත්‍යාංශය හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශය භාරව කටයුතු කරන ලද ජල සම්පාදන අමාත්‍යවරයාට හා රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ වාහන 03 ක් 2023 හා 2024 වර්ෂ තුළ අනතුරට ලක්වීම හේතුවෙන් දළ වශයෙන් රජයට රු.63,329,377 ක පාඩුවක් සිදු වී තිබුණි. මූදල් රෙගුලාසි 156(i)(ආ) ප්‍රකාරව එම පාඩු පිළිබඳව වගකිවයුත්තන් හඳුනාගෙන අදාළ අධිභාරයන් සිදුකිරීමට සහ වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට 2026 මැයි 20 දක්වාම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඉ) චීන -ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටුවීම

නිදන්ගත වකුගඩු රෝගය ඇතිවීමට බලපාන හේතූන් හඳුනාගැනීම, නිදන්ගත වකුගඩු රෝගය බලපා ඇති ප්‍රදේශවල groundwater treatment ක්‍රම වැඩිදියුණු කිරීම, වියළි කලාපයේ වැසි ජලය එකතු කිරීමේ හා ආවිතා කිරීමේ ක්‍රම වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකා රජයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ සහ ඉඩම් ප්‍රයෝජනයට හැනීම පිළිබඳ ඒකාබද්ධ සැලැස්ම සඳහා සහාය ලබා දීම යන මූලික අරමුණු වෙනුවෙන් 2015 මාර්තු 26 දින මෙම මධ්‍යස්ථානය පිහිටුවා තිබුණද එමඟින් අපේක්ෂිත පහත සඳහන් කාර්යයන් ඉටු වී නොතිබුණි.

(i) චීන රජයේ ප්‍රතිපාදන යටතේ රු.බිලියනයකට අධික වටිනාකමින් යුත් අධි නාක්ෂණික උපකරණවලින් සමන්විත ප්‍රධාන රසායනාගාර 06 ක් ඇතුළුව මුළු රසායනාගාර 16 කින් සමන්විත මෙම පර්යේෂණ මධ්‍යස්ථානයේ, රසායනාගාර මඟින් සිදුකළ හැකි පරීක්ෂණ වර්ග 302 ක් සඳහා රේටියන් හඳුන්වාදී තිබුණද, 2025 වර්ෂයේ සිදුකරන ලද පරීක්ෂණ වර්ග ප්‍රමාණය 18 ක් පමණක් වී තිබුණි.

(ii) 2020 සැප්තැම්බර් මස 16 දින චීන රජය මඟින් මෙම මධ්‍යස්ථානය වෙත ප්‍රදානයකර තිබූ ජල පරීක්ෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ උපකරණවලින් සමන්විත රු.40,441,639 ක් වටිනා ජංගම ජල පරීක්ෂණ රථය වර්ෂ 5 කට අධික කාලයක ඔට කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන මධ්‍යස්ථානයේ නිශ්ක්‍රියව ගාල්කර තිබුණි.

(iii) මෙම මධ්‍යස්ථානය සඳහා කාණ්ඩ 06 ක් යටතේ 2025 වර්ෂයට පුරෝකථනය කළ ආදායම රු.63,750,000 ක් වුවත් සත්‍ය ආදායම් රු.7,422,010 ක් එනම්

පුරෝකථනය කල ආදායමෙන් සියයට 12 ක් වැනි අවම මට්ටමක පැවති අතර පර්යේෂණ ආදායම සහ පර්යේෂණ සේවා, පශ්චාත් උපාධි වැඩසටහන් යන ආදායම් කාණ්ඩවලින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

5. නිරසාර සංවර්ධනය

"ශ්‍රී ලංකාවේ බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන සඳහා උපායමාර්ගික දිශානතිය ඉදිරිපත් කරන "ජාතික බිම්බෝම්බ කාර්යය සම්පූර්ණ කිරීමේ උපායමාර්ගය 2023 – 2027", බිම් වෙඩි සඳහා ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය විසින් ජිනීවා ජාත්‍යන්තර මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ මධ්‍යස්ථානයේ (GICHD) සහාය ඇතිව සංවර්ධනය කරන ලද අතර මේ යටතේ 2025 වර්ෂය සඳහා හඳුනාගන්නා ලද නිරසර සංවර්ධන ඉලක්ක 09 කින් අපේක්ෂිත ප්‍රගතිය ලභා කරගෙන නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

ප්‍රාදේශීය කාර්යාලවලට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණු අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරීන් ඔවුන්ගේ සේවයට පැමිණීම හා නිවාඩු පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත ලබාගැනීමකින් තොරව වැටුප් ගෙවා තිබුණි. ඇතැම් නිලධාරීන් ඔවුන් අනුයුක්ත කර ඇති කාර්යාලයේ සාමාන්‍ය කාර්යාල රාජකාරිවල නිරත වීමෙන් අමාත්‍යාංශයේ කාර්යසාධනයට දායක වී නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් ඔවුන් සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක්ද සිදුකර නොතිබුණි.



ඒ.ඩී. සිතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.